
ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී


2023 මාර්තු 29 වන බදාදා
3 කාණ්ඩය 17 කලාපය
මිල රු. 80 යි


විශේෂ අතිරේකයක් නොමිලේ



FM දෙරණ හැඩ කරන නිවේදිකාවෝ

ඡායාරූප - දේවා ජයවර්ධන

## ගම්බාරගෙන් වැඩගන්න බුදුන්ට කප්පම් දීලා

## ඒ කාලෙ පිරිමි සීගිරියට ගියේ ගල බලන්න නෙවෙයි

මහාචාර්ය අත්තනායක එම්. හේරත්

## මැරුණු පෙම්වතීට පණ දෙන්න හඳට යන්න හැදූ ප්‍රේමවන්තයා


Baby Cheramy
දරු පැටියාට සුරක්ෂිත බව සහතිකයි.
CERTIFIED SAFE FOR BABY*
පැටියාගේ සුරක්ෂිත බව ගැන, ඔබ තරම්ම බේබි ෂෙරමි අපිත් සිතනවා. ඒ නිසයි ළදරුවන්ට සුරක්ෂිත බවට විශේෂඥ වෛද්‍යවරුන්ගේ සහතිකය සහිත නව බේබි ෂෙරමි ගෙන එන්නේ.
BABY SOAP
Almond Oil, Vitamin E & Milk
BABY CREAM
Almond Extracts Vitamin E & Milk
HEMAS
*Based on clinical tests done on paediatric population.
රු.145/ සිට ඉහළට

# මඟදි දරුවාගේ හදවත වැඩ කළා අනේ තව එකපාරක් උත්සාහ කරලා බලන්න



දරුවෙක් ඉපදුණු ගමන්ම ගෙනැල්ලා තියන්නේ අම්මගේ පපුව උඩ. මාස නවයක් බඩේ ඉන්දැද්දි බබා අම්මගේ හදවත ගැහෙන හඬට හුරුවෙනවලු. කුසෙන් එළියට ගත්තු හැටියේ අම්මගේ පපුව ගැහෙන සද්දෙ ඇහෙන්න සැලැස්සුවහම දරුවාට හුරුපුරුදු ආරක්ෂිත බව දැනෙන්න ගන්නවලු.

අම්මලාට බබාලව වඩාගන්න කියන්නේ වම් පැත්තට වෙන්න. ඒකටත් හේතුවක් තියෙනවා. අපේ හදවත තියෙන්නේ වම් පැත්තෙනේ. ඉතින් අම්මගේ හදවතේ ස්පන්දනේ ඇහෙන විදියට වඩාගත්තහම ඉක්මනින්ම බබා නැළවෙනවා. අම්මා කෙනෙක්ගෙයි දරුවෙක්ගෙයි හදවත්වල තියෙන මානුෂීය බැඳීම ඇරුණම භෞතික වශයෙනුත් බැඳීමක් තියෙන බව ඒ අනුව පැහැදිලියි. ඉතින් එහෙව් දරුවෙකුගේ හදවත නතර වෙන්න යනවා කියලා දැනුණොත් අම්මා කෙනෙකුගේ හදවතකට මොනවා වේවිද? ඒක මනුස්සයින්ට විතරක් නෙමෙයි සත්තුන්ටත් එහෙමයි. වලිගෙන් වතුර ඉස ඉස මුහුදක් හිස් කරපු කලන්දක ජාතකේ එන ලේන් අම්මා ගැන මතක ඇතිනේ. ඉතින් දරුවෙක්ගේ හදවත නතරවෙන්න යනවා කිව්වම එහෙව් අම්මා කෙනෙක් මොනවා නොකරයිද? මේකත් එහෙම වීර්යවන්ත අම්මා කෙනෙක් ගැන කතාවක්.

අනුරාධපුර විජයපුර ජීවත්වෙන සසංකා මිහිරානි ගෑනු දරුවෝ තුන්දෙනෙක්ගේ අම්මා කෙනෙක්. ඇගේ බාලම දියණියට මාස හතයි. බටවලින් ජීවිතේ හොයන මේ පුංචි මැණිකගේ ජීවිතේ වෙනුවෙන් සසංකා මහා සටනක් කරනවා.

**"ඉපදිලා දවස් පහක් යනකල් බබා හොඳට හිටියා. ටිකට් කපලා ගෙදරත් ගෙනවා. හයවැනි දවසේ දරුවා ඇහැරුණේ නැහැ. ඇඟත් සුදුමැලි වෙලා. මගේ මහත්තයා කරන්නේ කුලී වැඩ. එවෙලේ මහත්තයා ගෙදර හිටියෙත් නැහැ. මම හිතුවේ දරුවා නැතිවෙලා කියලා. හැබැයි මම චුට්ටක්වත් කලබල වුණේ නැහැ. හිතට හයිය අරන් දරුවගේ හදවතට අත්දෙක තියලා තද කළා. කෘත්‍රිම ස්වසනය දුන්නා. එතකොට මගේ සීසර් තුවාලේ හොඳත් නැහැ. ඒ අමාරුකම් පැත්තක දලා පාරට දුවලා වාහනයක් හොයාගෙන දරුවව ඉස්පිරිතාලෙට අරන් ගියා. කෘත්‍රිම ස්වසනය දිදී තමයි දරුවව අරගෙන ගියේ. ඒ කරද්දි මගදි එකපාරම දරුවගෙ හදවත ගැහෙන්න ගත්තා."**

සසංකා දරුවව අරගෙන ගිහින් තිබුණේ අනුරාධපුර ශික්ෂණ රෝහලට. ඉස්පිරිතාලෙ දොස්තර ළඟට යද්දිම ආයෙත් දරුවගේ හදවත නතර වෙලා ඔළුව කඩාවැටුණාලු.

"දොස්තරලා බබාව හදිසි වාට්ටුවට දැම්මා. 'මේ බබා නැතිවෙලා දැන් පැය දෙකක් වෙනවා අම්මේ' කියලා පරීක්ෂා කරලා කිව්වා. මඟදි දරුවාගේ හදවත වැඩ කළානේ. එහෙම වෙන්න විදියක් නෑ තව එකපාරක් බලන්න කියලා මම කෑගහලා කිව්වා. පස්සේ දොස්තර මහත්තුරු ආයේ දරුවට ස්වසනය දුන්නා. ඒ කරද්දි එකපාර දරුවට කැස්සක් ආවා. පස්සේ එහෙමම බබාව ICU එකට දැම්මා."

ඊටපස්සේ පුංචි කෙල්ල ජීවත්වෙලා තියෙන්නේ ඔක්සිජන් බටෙන්.

"මාසෙකින් වගේ ඔක්සිජන් බටේ ගැලෙව්වා. සකර් මැෂින් (ස්වසන මාර්ගයේ ඇති අනවශ්‍ය ශ්‍රාවයන් ඉවත්කිරීම සඳහා භාවිතා කරන වෛද්‍ය උපකරණයකි) එකකුයි දුම් අල්ලන මැෂින් එකකුයි ගන්න පුළුවන් නම් බබාව ගෙදර එක්කරගෙන යන්න කියලා මාස දෙකකට පස්සේ ඉස්පිරිතාලෙන් කිව්වා. සකර් මැෂින් එකක් අසූනවදහක්. ඉතින් අපිට සල්ලි තිබුණේ නැහැ. දන්න අයගෙන් ණයට ගාණක් හොයාගත්තා. වාරික වශයෙන් ගෙවන්න



**දොස්තරලා බබාව හදිසි වාට්ටුවට දැම්මා. 'මේ බබා නැතිවෙලා දැන් පැය දෙකක් වෙනවා අම්මේ' කියලා පරීක්ෂා කරලා කිව්වා**



මැෂින් ගන්න තැනක් දොස්තර මහත්තයෙක් හොයලා දුන්නා. ඒ මහත්තයවත් මේ වෙලාවේ මතක් කරන්න ඕනේ. ඒ කරලා මැෂින් දෙක අරන් බබාව ගෙදර ගෙනාවා."

මාස හතක් ගත වුණත් අදටත් මේ දරුවා ජීවත්වෙන්නේ සකර් මැෂින් බට ගහගෙනයි.

**"දරුවට නිතරම ෆිට් එක හැදෙනවා. ඒ නිසා දැන් බබාගේ ස්නායුත් දුර්වල වෙලාලු. අනික දරුවා වර්ධනය වෙන්නෙ නෑ. මාස හතක් වුණාට මාස තුනක පෙනුමක් තියෙන්නේ."**

මේ පුංචි පැටියට දෙන්න පුළුවන් කිරිපිටි විතරලු. ඒත් කිරිපිටි ගන්න සල්ලි නැතිකමට දරුවට කැඳ පොවනවා කියලා අම්මා අපිත් එක්ක කිව්වේ කඳුළු පිහන ගමන්.

"සතියට කිරිපිටි පැකට් තුනක් යනවා.

## සසංකා මිහිරානි

කිරි ගන්න අපිට සල්ලි නැහැ. මහත්තයා කරන්නේ කුලී වැඩ. රටේ තියෙන ප්‍රශ්න එක්කලා තව කෙනෙක්ට කුලියක් දීලා වැඩක් ගන්න මිනිස්සුන්ට සල්ලි නැහැ. ඒ නිසා දැන් එයාට වැඩ අඩුයි. ඉතින් කිරි වෙනුවට දරුවට කැඳ පොවනවා. සති දෙකෙන් දෙකට ක්ලිනික් යන්න ඕනේ. වාහනේක යන්න සල්ලි නැති නිසා විසබීජ යන්නේ නැති වෙන්න දරුවව ඔතාගෙන බස් එකේ යනවා. තව දුවලා දෙන්නෙකුත් ඉන්නවා. එක දුවක් ඉස්කෝලේ යනවා. අනිත් දරුවා මේ අවුරුද්දේ මොන්ටිසෝරි. මොන්ටිසෝරි දාගන්න සල්ලි නැති නිසා දරුවා ඉන්නේ ගෙදර. අනික අපි ඉන්නේ කුලියට. කුලී ගෙවන්න තියා එදාවේල කන්නෙත් අහල පහල අයගේ උදව්වෙන්. ඉතින් මේ මාසෙන් පස්සේ අපිට පාරට යන්න වෙයිද දන්නෙත් නැහැ."

සසංකා හිත හයිය අම්මා කෙනෙක්. හැබැයි මිනිස්සුන්ගේ හිත්වල හයිය දිය කරන්න සල්ලි කොළවලට පුළුවන්. ඒත් සසංකා අපෙන් ඉල්ලුවේ සල්ලි නෙමෙයි.

"පුළුවන් කෙනෙක් ඉන්නවා නම් දරුවට කිරිපිටි ටිකකුයි, කිරි පොවන්න සිරින්ජරයි, පැම්පස් ටිකකුයි අරන් දෙන්න. මේ වෙලාවේ හැටියට ඒක අපිට ලොකු උදව්වක්."

මිනිහා කියන්නේ සමාජ සත්වයෙක්නේ. ඉතින් වෙලාවකට මිනිස්සුන්ට මිනිස්සුන්ගේ උදව් නැතිව බැහැ. ඉතින් හදවත ගැහෙන මනුස්සයෙක් හැටියට මේ හයිය අම්මට උදව්වක් කරන්න පුළුවන් නම් ඔබේ හදවතේ වටිනාකම තවත් වැඩිවේවි.

දුරකතන අංකය - 0740735706
ලිපිනය - 274, ගැමුණු මාවත, විජයපුර, අනුරාධපුර.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

# ගම්බාරයගෙන් වැඩ ගන්න බුදුන්ට කප්පම් දීලා



"අර ගම්බාර දෙවියන්ගේ මලේ නම මොකක්ද කියලා මතකද?" මා කලින් සේවය කළ මාධ්‍ය ආයතනයක සේවක මහත්මියක් මට හදිසියේ දුරකතන ඇමතුමක් දී අසා සිටියාය. එහෙත් ඇය ඇසූ පැනයට පිළිතුරු තබා ඇගේ පැනයවත් මට හරිහැටි නොවැටහුණි.

"ගම්බාර දෙවියන්ගේ මල? ඒ කියන්නේ මොකක්ද?" විමතියට පත් මම පෙරලා ඇගෙන් ඇසුවෙමි.

"දන්නේ නැත්නම් කමක් නෑ. මම පස්සේ වෙලාවක ගන්නම්." එසේ කී ඇය එසැණින් දුරකතන ඇමතුම විසන්ධි කළාය. ඇගේ ඒ කතාව මුල්කොට මගේ සිත තුළට පිවිසි කුතුහලය මුල්කොට ඉන් හෝරා කිහිපයකට පසුව මම නැවත ඇය ඇමතීමි.

"මොකක්ද අර ගම්බාර දෙවියන්ගේ මලක් ගැන ඇහුවේ?" මා එසේ අසත්ම ඇය සිනාසුණාය. "නෑ ඒ වෙලාවේ මම දුවගේ ක්ලාස් එක ළඟ හිටියේ. දුවගේ යාළුවෙක්ගේ අම්මා කෙනෙක් මගෙන් ඒ මල ගැන ඇහුවා. මට ඒකේ නම අමතක වෙලා තිබුණු හින්දයි ඒ වෙලාවේ කතා කළේ." ඇය කීයේ මගේ කුතුහලය තවත් පුබුදුවමිනි.

"ඇත්තෙන්ම මට තේරුම්ගන්න බැරි වුණා. මොකක්ද ඔය ගම්බාර දෙවියන්ගේ මල කියන්නේ?" මම ඇගෙන් ඇසීමි.

"නෑ මට පස්සේ මතක් වෙලා මම එයාට ෆෝන් කරලා කිව්වා. ඒකේ නම තිරස්නවාලු. ඒකට තිරස්සවාලු කියලත් කියනවලු." ඇය සන්සුන් ලෙසින් පිළිතුරු දුන්නාය.

"මට මතක හැටියට නම් තිරස්නවාලු කියන්නේ බෙහෙත් පැළෑටියක්. ඒත් මොකක්ද ඒකයි ගම්බාර දෙවියොයි අතරේ තියෙන සම්බන්ධය?" මා ඉන් පෙර කිසිදු නොඇසූ ඒ මාතෘකාව සම්බන්ධයෙන් ඇතිවූ කුතුහලය වඩාත් තීව්‍රවන අතරේ ඇගෙන් අසා සිටියෙමි.

"ඇයි ඔය තිරස්නවාලු කියන ගහේ මල් පූජා කරලා ගම්බාර දෙවියන්ට පින් දීලා ඉල්ලීමක් කළාම හිතේ තියෙන බලාපොරොත්තු ඉෂ්ට වෙනවා කියලා දැන් හැමතැනම කතාවක් තියෙනවනේ. හඳ මෝරන කාලෙට ඒ මල් කඩලා පූජා කළාම යහපත් බලාපොරොත්තු වගේම හඳ බහින කාලටෙ පූජා කළාම අයහපත් බලාපොරොත්තුත් ඉෂ්ට වෙනවා කියලා දැන් හුඟක් ළමයින්ගෙ අම්මලා අතරේ කතාවක් පැතිරිලා යනවා." ඇය කීවාය.

"හැබැයි ඒක නම් වැඩිදුර හොයලා බලන්නම ඕනේ දෙයක්. මට බැරිද ඒ ගැන වැඩි විස්තරයක් දැනගන්න පුළුවන් කෙනෙකුගේ ෆෝන් නම්බර් එකක් දෙන්න?" මම ඇගෙන් ඇසුවෙමි.

"එහෙමට කෙනෙක් ගැන නම් කියන්න අමාරුයි. කෝකටත් මට දවස් කීපයක් දෙන්න. මම ඔය ගැන වැඩිපුර දන්න කවුරුහරි ඉන්නවද කියලා හොයලා බලලා උත්තරයක් දෙන්නම්."

ඇය කී බැවින් මම එදින ඒ දුරකතන සංවාදය එතැනින් හමාර කළෙමි.

එහෙත් දින සති බවට කෙමෙන් කාලය ඉක්ම යමින් තිබුණද ඇය වෙතින් මා අපේක්ෂා කළ දුරකතන ඇමතුම නොලැබුණි. එබැවින් ඇය විවේකයෙන් පසුවෙතැයි සිතිය හැකි අවස්ථාවක් බලා මම ඇයට යළි දුරකතන ඇමතුමක් දුන්නෙමි.

"මම කීප සැරයක්ම කතා කරන්න හැදුවා. ඒත් වැඩ හින්ද මගහැරුණා." ඇය කීවාය. "අර තිරස්නවාලු ගැන අතනින් මෙතනින් තොරතුරු ටිකක් නම් හොයාගත්තා. ඒත් නාඳුනන කෙනෙක් එක්ක ඒ වගේ දෙයක් ගැන කතා කරන්න මගේ යාළුවෝ කවුරුත් කැමති නෑනේ." ඇගේ එම ප්‍රකාශය මගේ දෙම්නසට හේතු විය.

"එහෙම නම් ඉතින් ඒ දැනගත්තු තොරතුරු ටික හරි කියන්නකෝ." එබැවින් මම ඇගෙන් ඉල්ලා සිටියෙමි.

"ඔය තිරස්නවාලු කියන ගහේ මල්වලට විතරක් නෙවෙයි ගහේ කොළ, පොතු, ගෙඩි, මුල්වලට පවා ගම්බාර දෙවියන්ගේ බැල්ම තියෙනවලු. ඒ හින්ද ඒ ගහේ මොන කොටසක් හරි කමක් නෑ බුදු හාමුදුරුවන්ට පූජා කරලා තමන්ගෙ හිතේ තියෙන ප්‍රාර්ථනා ඉෂ්ට කරන්න කියලා ගම්බාර දෙවියන්ගෙන් ඉල්ලා හිටියම ඒ හුඟක්

**ඒ දේ පුරහඳ කාලෙට විතරක් කරන්න කියලා කියන්නේ ගම්බාර දෙවියන්ගේ සෞම්‍ය වේශය තියෙන්නේ ඒ කාලයට හින්දලු. හඳ බැහැගෙන යන කාලෙට ගම්බාර දෙවියෝ සූනියම් වේශයෙන් පෙනී ඉන්න හින්දා ඒ කාලෙට ප්‍රතිඵල දෙන්නේ නරක බලාපොරොත්තු විතරක් කියලත් කතාවක් තියෙනවා**

දේවල් ඉෂ්ට කරගන්න පුළුවන්ලු. හැබැයි ඒ දේ පුරහඳ කාලෙට විතරක් කරන්න කියලා කියන්නේ ගම්බාර දෙවියන්ගේ සෞම්‍ය වේශය තියෙන්නේ ඒ කාලයට හින්දලු. හඳ බැහැගෙන යන කාලෙට ගම්බාර දෙවියෝ සූනියම් වේශයෙන් පෙනී ඉන්න හින්ද ඒ කාලෙට ප්‍රතිඵල දෙන්නේ නරක බලාපොරොත්තු විතරක් කියලත් කතාවක් තියෙනවා." ඇය ඒ තිරස්නවාලු පිළිබඳ මා එතෙක් නොඇසූ කතාව එසේ පවසා සිටියාය.

"හැබැයි ඉතින් ඔතන බරපතළ කාරණා දෙකක් තියෙනවා. එකක් තමයි බුදු හාමුදුරුවන්ට ගස්වල මල් වෙනුවට කොළ පොතු, මුල් පූජා කිරීම. අනික ඉතින් ඕක පූජාවකට වඩා කප්පමක් වගේනේ. බුදු හාමුදුරුවන්ට මොකක්ම හරි පූජා කරලා මොකක්හරි නරක චේතනාවකින් යමක් ප්‍රාර්ථනා කිරීමත් හරිම බරපතළයි නේද?" මම ඇගෙන් අසා සිටියෙමි.

"ඒ ගහේ මල්, පොතු, පූජා කරන්නේ ඖෂධ විදියටලුනේ." එසේ කී ඇය අනතුරුව හෙළිකළ අන්දමට බොහෝදෙනෙකු එය යොදාගන්නේ සඳ මෝරන කාලයට ගම්බාර දෙවියන් ලවා යහපත් දෙයක් අපේක්ෂාවෙන් පමණි. ඒ සඳහාද ඔවුහු බදාදා සහ සෙනසුරාදා රාත්‍රී කාලයන් යොදාගනිති.

"අනික ඔය කියන වැල් ජාතිය ලේසියෙන් එසේ මෙසේ කෙනෙකුට හොයාගන්නත් බැහැ නේද?" ඒ අනුව මම ඇසීමි.

"ඒකෙ නම් කිසිම ප්‍රශ්නයක් නෑ. ඔය සමහර අම්මලා ළඟ ෆෝන් නම්බර් තියෙනවා. ඒවට කතා කළාම ඒ තිරස්නවාලු මල්, ගෙඩි, කොළ, මුල් ඔක්කොම ගෙදරටම ගෙන්න ගන්න පුළුවන්. රුපියල් දෙදහක් වගේලු යන්නෙත්." ඇය පවසත්ම මම පුදුමයට පත්වීමි. මක්නිසාදයත් ඒ වනවිට මා අනාවරණය කරගෙන සිටි අන්දමට තිරස්නවාලු යනු අපේ රටේ බොහෝ ප්‍රදේශවල ස්වභාවික පරිසර පද්ධතීන්ගෙන් නිකම්ම සොයාගත හැකි ශාකයකි.

"ඒ විතරක් නෙවෙයි දැන් ඒවා සිංහල බේත් බඩු කඩවල තියෙනවලු. ඒ වගේම පැළ තවාන්වල පැළ හැටියටත් විකුණනවලු." ඇය පිළිතුරු දුන්නාය.

ඒ අනුව මම කලෙක සිට දන්නා හඳුනන හෝමාගම ප්‍රදේශයේ සිංහල බෙහෙත් බඩු වෙළඳසැල් හිමියෙකුගෙන් ඒ පිළිබඳව අසා සිටියෙමි. ඔහුගේ වෙළඳසැලේ තොවිලු බඩුද විකිණීමට තිබේ.

"ඕනෙම බෙහෙත් බඩුවක් අපි ළඟ නැත්නම් වරුවක්, දෙකක්, දවසක් ඇතුළත ගෙන්වලා දෙන්න අපිට පුළුවන්. ඔය තිරස්නවාලුත් එහෙම ගෙන්නලා දීපු අවස්ථා ඕනතරම් තියෙනවා. මොකද අපේ සප්ලයර්ස්ලා අපේ රටේ තියෙන ඕනේම බෙහෙත් බඩුවක් පටස් ගාලා හොයාගන්න දන්නවා." ඔහු කීය.

පසුව මම මේ තිරස්නවාලු ශාකය සම්බන්ධ ආගමික, සංස්කෘතික සහ ආධ්‍යාත්මික පසුබිම විමසා බැලීමි. අප රටේ අදහනු ලබන ගම්බාර, සූනියම් හෝ වෙනත් කිසිඳු දෙවි කෙනෙකු හා මෙම ශාකය අතර කිනම් හෝ සබැඳියාවක් ඇති බවට කිසිඳු හෝඩුවාවක් නැත. එසේම 'සෑම ගසකම දෙවියෙක් වැඩ සිටිනු ඇත' යන හින්දු කියමනට අදාළව බැලුවත් සංස්කෘතික බසින් ත්‍රිවෘන් (දර තුනක්) සහිත යන අරුත දෙන තිරස්නවාලු ශාකය හා සම්බන්ධ එවැනි දෙවියෙක්වත් සොයාගන්න නොපුළුවන. පොදුවේ ගස් හා දෙවිවරුන් අතර සබැඳියාව කොතෙක්ද යත් ගස් අතරින් නොවැදගත්ම ගසක් වන එඬරු ගසේ පවා දෙවි කෙනෙකු වැඩ සිටින බවට විශ්වාසයක් පැවති බව පන්සිය පනස් ජාතක කතා පොතේ එන 'කුඩ්ඩක පූව' ජාතකයේ සඳහන්ය. ඒ අනුව මෙම තිරස්නවාලු කතාව ආර්ථික වටිනාකමක් නොමැති ශාකයක්, අන්ධ විශ්වාස දරන්නවුන් අතරේ ඉහළ මිල ගණන්වලට අලෙවි කිරීමේ ජාවාරම් යාන්ත්‍රණයක් බව අතිශය පැහැදිලිය.



මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**

# මුහුණ දෙන සෑම අභියෝගයක්ම හැරවුම් ලක්ෂ්‍යයක් කර ගත යුතුයි

**ජීවිතයේ සාර්ථකත්වය උදෙසා අප සෑම දෙනාම නොයෙකුත් උත්සාහයන් දරති. ගඟක් බාධක ගල්පර අතරින් ගලා යද්දී මනරම් දසුන් මවන්නා සේම, තමා අභිමුවට එන බාධක අභියෝග, උත්සාහයෙන් ජය ගනිමින් ව්‍යාපාර ලොව ජයගත්තෝ, රටට සමාජයටද වැඩදායී ජීවිත ගෙවති. මිණිපුර බොහෝ දෙනෙකුට රැකියා ලබා දෙමින්, බොහෝ දෙනෙකුගේ ජීවිත එළිය කරන්නට කැප වූ රැන්මාස් ගාමන්ට් අධිපති සාම විනිසුරු දේශමාන්‍ය දේශ බන්දු ආචාර්ය ඩබ්ලිව්.එච්. නිලන්ත පත්මසිරි මහතාද එවන් අභියෝග ජයගත් අයෙකි. එම ගමන්මගේ අත්දැකීම් පිළිබඳ ඔහු දැක්වූ අදහස් ඇසුරින් මෙම ලිපිය සැකසේ.**




**❖ මුලින්ම ඔබ ගැන විස්තර ටිකක් කතා කරමු.**

මම රත්නපුර සීවලි මැදි විදුහලෙන් අධ්‍යාපනය ලැබුවා. ව්‍යාපාරිකයකු වීමට තිබූ දැඩි වුවමණාව හා ආශාව නිසාම 1997 වර්ෂයේ සේවකයින් 4 දෙනකුගෙන් ඇඟලුම් ආයතනයක් පටන් ගත්තා. අද වන විට සේවකයින් 750ට ආසන්න පිරිසකට මම සෘජු රැකියාවන් ලබාදී තිබෙනවා. ඒ වගේම වක්‍ර රැකියා 150ක් පමණ ලබාදී තිබෙනවා.

**❖ එම ගමනෙදි ඔබට මුහුණ දීමට සිදුවූ ඉතාමත් අමිහිරි කටුක අත්දැකීම් මොනවද?**

අමිහිරි කටුක අත්දැකීම් රාශියකට මුහුණ දීලා තියෙනවා. ඇත්තෙන්ම මම අද සිටින තත්ත්වය, තැන හා පැමිණි ගමන් මඟ සංසන්දනය කරලා බැලුවහොත් වෙනත් ව්‍යාපාරිකයකුට මා මුහුණ දුන් දුෂ්කරතාවයන්ට මුහුණ දෙන්න සිදුවූවා නම් අද වන විට අනිවාර්යෙන්ම ව්‍යාපාරය අත්හැරලා.

මට මතකයි එක අවස්ථාවක ව්‍යාපාරය කඩා වැටී මා පදිංචි නිවස පවා බැංකුවට සින්න වුණා. එහෙම අමාරු කාලයක් ජීවිතයට ආවත් ආශාව සිහිනය හා ඉලක්කය බොඳ වෙන්න නොදී දිගින් දිගටම ව්‍යාපාරය ගොඩ නගන්න කටයුතු කරන පුද්ගලයන් ඉන්නවා. ඒ විදිහටම මමත් මෙම ව්‍යාපාරය නැවත ක්‍රමක් ක්‍රමයෙන් ගොඩ නගා ගත්තා.

**❖ කොවිඩ් අර්බුදය තුළත් ඔබ සාර්ථක වුණා. ඒ නිසාම සාර්ථක ව්‍යාපාරිකයකු ලෙස සම්මාන හිමි වුණා නේද?**

එම සාර්ථකත්වයට ප්‍රධාන හේතුව ආත්ම විශ්වාසයයි. දැඩි කැපවීමයි. සියලු වගකීම් බෙදා දිලා කාර්යමණ්ඩලය ගැන පූර්ණ විශ්වාසයකින් කටයුතු කරනවා වගේම මම සියලුම තීන්දු තීරණ ගන්නේ කාර්ය මණ්ඩලය සමග සාකච්ඡා කරලයි.



රැන්මාස් ගාමන්ට් අධිපති සාම විනිසුරු දේශමාන්‍ය දේශ බන්දු ආචාර්ය ඩබ්ලිව්.එච්. නිලන්ත පත්මසිරි මහතා

කොවිඩ් වසංගතය දරුණුම අවස්ථාවේදී පවා මා සේවකයන්ට වැටුප් ගෙවීම් සිදු කළා. කිසිදු සේවකයකු සේවයෙන් අයින් කළේ නැහැ. අපි උපායශීලී ක්‍රමවේද අනුගමනය කරමින් ඉදිරියට පිය නැගීම මත SLIM විශිෂ්ටතා සම්මාන උළෙලේ Restart Resilience Awards 2020 රන් සම්මානය ලබා ගත්තා. තවත් සම්මාන රාශියක් ලබාගත්තා.

**ASIAN HEROES GOLD AWARD - 2023**
**SWARNA SINGHE GOLD AWARD - 2022**
**IDB GOLD WINNER - 2022**
**SLIM BRAND EXCELLENCE - 2020**
**SLIM BRAND EXCELLENCE - 2019**
**SMIDEX - 2019**
**SABRA BRAND EMINENCE - 2016**
**MINIPURA KIRULA - 2016**

කියන සම්මාන ඒ අතර විශේෂයි.

**❖ ඇඟලුම් නිෂ්පාදන ආයතනයක් ලෙස අලුත් අවුරුද්ද සඳහා ආයතනය සූදානම්වූ ආකාරය කෙටියෙන් විස්තර කළොත්.**

නිමි ඇඳුම් නිෂ්පාදන ක්ෂේත්‍රයේ ගනුදෙනුකාර භවතුන් වෙනුවෙන් ඉතාමත් ආකර්ශනීය නවීන විලාසිතාවන්ගෙන් යුක්ත නිමි ඇඳුම් නිර්මාණය කිරීම අපි කවදත් සිදුකළා. ඒ අතර විවිධ ප්‍රමාණයන්ගෙන් මෝස්තරවලින් ගවුම්, බ්ලවුස්, ගැබිනි මව්වරුන්ගේ ගවුම් බතික් නිෂ්පාදන ගණනාවක් රැන්මාස් නමින් වෙළඳපොළට ඉදිරිපත් කළා.

**❖ ඇඟලුම් නිෂ්පාදනයේ ප්‍රමිතිය ගුණාත්මක බව සම්බන්ධයෙන් ආයතනයක් වශයෙන් අනුගමණය කරන ක්‍රම මොනවාද?**

අප නිෂ්පාදන ''රැන්මාස්'' නමින් දිවයින පුරා බෙදාහැරීම් සිදුකරනවා. එම නිෂ්පාදනවල ගුණාත්මක භාවය සම්බන්ධයෙන් අප ආයතනය බොහෝ වගකීමෙන් කටයුතු කරනවා.



විශේෂයෙන් අපි නිරන්තරයෙන් වෙළඳපොළේ වෙනස් වීම් අධීක්ෂණය කර තරගකාරී නව නිර්මාණ උසස්ම තත්ත්වයෙන් යුතුව අපගේ පාරිභෝගිකයන්ට ලබා දිම සිදු කරනවා.

**❖ රැන්මාස් නිෂ්පාදන මිලදී ගත හැක්කේ කුමන ආයතනවලින්ද?**

දිවයින පුරා ප්‍රධාන නගරවල ප්‍රමුඛපෙලේ ඇඟලුම් අලෙවිසල් 75 කට අධික ප්‍රමාණයකින් ඉතා පහසු මිලට ලබාගත හැකිය. ඇහැලියගොඩ තොරණගොඩ අප කර්මාන්ත ශාලාව අසලදීද ඉතාමත් පහසු මිලට දැනටමත් ඇඳුම් මිලදී ගැනීමට අවකාශය සලසා දී තිබෙනවා.

සටහන : ජේ.ඒ.ඩී. ශාන්ත කුමාර




Ranmas Garment

ළඟ එන
උත්සව සමය වෙනුවෙන්
අතිනවීන අතිවිශාල
විලාසිතා පෙළක්
සමගින් ඔබ වෙනුවෙන් ම

- සියලුම වර්ගයේ කාන්තා බ්ලවුස්
- සියලුම වර්ගයේ ගවුම්
- ගර්භණී මව්වරුන් සඳහා වන ගවුම්
- නයිටි වර්ග
- බතික් හවුස්කෝට් සහ නයිටි වර්ග

රැන්මාස් ගාමන්ට්
නො. 75/1, තොරණකඩ, ඇහැළියගොඩ
036 - 2258777
ranmasgarment@gmail.com
Ranmas Garment
උසස් නිමාවෙන් හා උසස්ම ප්‍රමිතියෙන් යුතු
අපගේ නිෂ්පාදන දිවයින පුරා ප්‍රධාන පෙළේ රෙදිපිළි ආයතන වලින් මිලදී ගත හැක.

**මියගිය සිය පෙම්වතියගේ මෘත දේහය හත් අවුරුද්දක් තිස්සේ ළඟ තබාගෙන සිටි පෙම්වතෙක් පිළිබඳවයි මේ කතාව. ඔහු ජර්මන් ජාතිකයෙක්. නම තමයි 'කාල් ටැන්ස්ලර්' (Carl Tanzler)**

# මැරුණු පෙම්වතීට පණ දෙන්න හඬට යන්න හැදූ ප්‍රේමවන්තයා





ඒ වනවිට 42 හැවිරිදි කාල් ටැන්ස්ලර් විකිරණ තාක්ෂණවේදියෙකු ලෙස රාජකාරි කරමින් සිටියේ ප්‍රංශයේ සමුද්‍ර රෝහලකයි. විවාහ වී දරුවන් දෙදෙනෙකු සිටියද එය දික්කසාදයකින් කෙළවර වුණේ සාර්ථක විවාහ ජීවිතයක් නොවූ නිසා විය යුතුයි. එතැන් පටන් අවුරුදු දෙකක් පමණ වනතෙක් ගතකළ ඔහුගේ ජීවිතයේ තනියට හිටියේ තනිකම පමණි.

මේ අතරතුරයි එක්තරා දිනයක රෝහලට ප්‍රතිකාර ගැනීමට පැමිණි හැඩකාර තරුණියක ඔහුගේ නෙත ගැටුණේ. මාරියා හෝයෝස් නම් එම තරුණිය රෝහලට පැමිණ තිබුණේ හුස්ම ගැනීමේ අපහසුතාවක් සඳහා ප්‍රතිකාර ගැනීමටයි. ඒ අහඹු හමුවීමෙන් පසු මාරියා සමඟ පෙමින් බැඳුනු කාල් ඇයට දැඩි සේ ඇලුම් කරන්නට පටන් ගත්තේය.

මාරියා ක්ෂය රෝගයෙන් පෙළෙන්නියක් බව වෛද්‍යවරුන් තහවුරු කළේ මේ අතරතුරයි. ඒ කාලය වනවිට ලෝකය පුරාම ක්ෂය රෝගය සැලකුණේ මාරාන්තික රෝගයක් හැටියටයි. රෝගය නිට්ටාවට සුව කිරීමට කිසිඳු ප්‍රතිකාරයක් ඒ වනවිට සොයාගෙන තිබුණේ නැත. නමුත් ඒ කිසිඳු කාරණාවක් නිසා මාරියා ගැන උපන් ස්නේහයට දෙරඅගුලු ද ගන්නටත් කාල්ගේ සූදානමක් තිබුණේ නැත.

සිය පෙම්වතියගේ රෝගය ගැන දැනගත් මොහොතේ පටන් ඇය සුව කරන්නට තමා කෙසේ හෝ ඖෂධයක් තැනිය යුතු බැව් කාල් සිතුවේ ඒ නිසා විය යුතුයි. නමුත් ඒ වෙනුවෙන් ගත් සියලු උත්සාහයක් ගඟට කැපූ ඉනි මෙන් අසාර්ථක විය. ඒ අතරතුරේ මාරියාගේ තත්ත්වයද නරක අතට හැරෙමින් තිබුණි. අවසන 1931 ඔක්තෝබර් 25වැනිද ඇය සදහටම දෙනෙත් පියාගත්තේ කාල්ගේ දෙනෙත් කඳුළු උල්පතක් බවට පත්කරමිනි. ඉන්පසු ඇයට දිය හැකි උපරිම ගෞරවය ලබාදීමට තීරණය කළ ඔහු වෙස්ට් සුසානභූමියේ මිල අධිකම ගල් සොහොන් ගෙයක් මිලට ගෙන ඇගේ දේහය එහි තැන්පත් කළේය.

කාල්ගේ ආදර කතාවේ හොඳම හරිය පටන්ගත්තේ එතැන් පටන්ය. ඔහු දිනකට වතාවක් බැගින් හොර රහසේම මාරියාගේ සොහොන් ගෙට යන්නට පටන්ගත්තේය. ඒ බවක් කිසිවෙකුත් දැනසිටියේ නැත. මන්ද මේ ගමන ගැන දැන සිටියේ ඔහුම පමණි. දෙතුන් දිනක් එසේ ගිය කාල්ගේ හිතට අලුත් අදහසක් ආවේය. ඒ ප්‍රාණ සමව ප්‍රේම කළ පෙම්වතියගේ මළසිරුර තමාගේ නිවසට රැගෙන යන්නටයි. නමුත් ඒ වනවිටත් මළසිරුරෙන් දුර්ගන්ධය හමමින් තිබුණි.

කාල් කල්වේලා නොයවාම සිතට ආ සිතුවිල්ල ක්‍රියාත්මක කළේය. ඔහු මුලින්ම කළේ මාරියාගේ මළසිරුර සෝදා පිරිසිදු කර ගැනීමයි. අනතුරුව කළේ එම දේහයට ඇඳුම් ඇන්දවීමයි. පසුව අධික දුර්ගන්ධය යටපත් කරන්නට ඔහු එහි සුවඳ විලවුන් ගැල්වූයේය. ඉන් නොනැවතී සිය ප්‍රේමියගේ සිරුර නොවෙනස්ව තබාගැනීමට ඔහු විවිධ අත්හදා බැලීම් කළේය. ඒ ඇය වෙනුවෙන්ම සාදාගත් තාවකාලික වෛද්‍ය රසායනාගාරයක් තුළයි. කෙසේ හෝ හත් අවුරුද්දක් පුරාවටම මාරියාගේ මළසිරුරේ මුල් ස්වරූපය ආරක්ෂා කර තබාගැනීමට ඔහු සමත්විය. එතෙක් මේ ගැන කිසිවෙකුත් දැන සිටියේ නැත.

දිනක් කාල්ගේ නිවස අසළින් ගිය කුඩා දැරියකට එහි ජනේලයකින් අපූරු දසුනක් දැකගන්නට ලැබිණි. ඒ කාල් යෝධ බෝනික්කෙකු සමඟ සිටින අයුරුයි. සියල්ල කණපිට පෙරලෙන්නට පටන්ගත්තේ ඊට දින කීපයකට පසුවයි. ඒ මාරියාගේ සහෝදරියක්ද ඒ දසුනම දුටු බැවිනි. යෝධ බෝනික්කා ගැන සැක කළ ඇය කෙළින්ම ගියේ මාරියාගේ සොහොන් ගෙය ළඟටයි. එහිදී වැඩිදියුණු වූ සැකයද රැගෙන ඇය කාටත් හොරා කාල්ගේ නිවසට යාමට තීරණය කළාය.

එහිදී තම මියගිය සහෝදරියගේ මළසිරුර දුටු ඇය දෙවරක් නොහිතා සිද්ධිය ගැන පොලිසියට පැමිණිලි කළාය. පසුව පොලිසියෙන් එය මාරියාගේම මළසිරුර බව තහවුරු කරගෙන තිබිණි. සිද්ධිය සම්බන්ධයෙන් කාල් පොලිස් අත්අඩංගුවට පත්වූ අතර, ඔහුට එරෙහි චෝදනාව වූයේ සොහොනක් මංකොල්ලකෑමයි. ඊට අමතරව පොලිස් පරීක්ෂණවලදී තහවුරුවූයේ කාල් මළසිරුර සමඟ ලිංගිකවද එකතු වී ඇති බවයි. ඒ ඇගේ පාද අතරට කඩදාසි බටයක් ඇතුළුකර තාවකාලික යෝනි මාර්ගයක් සාදා ගනිමිනි.

කෙසේ වුවද සොහොන් මංකොල්ලය යන වරද හැරුණුවිට කාල් අනෙක් වැරදි සියල්ලෙන්ම නිදහස්වූයේ දිගින් දිගටම සිදුකළ විමර්ශනවල ප්‍රතිඵලයක් ලෙසිනි. එහිදී ඔහු මාරියාගේ මළසිරුරට පණදිය හැකි ක්‍රම ගණනාවක් පිළිබඳවම අත්හදාබැලීම් සිදුකර ඇති බව තහවුරු විය. ඒ අතරින් පොලිසියේ වැඩි අවධානයක් යොමුවුණේ ඔහු මාරියාගේ සිරුර අභ්‍යවකාශයට රැගෙනයාමට නිර්මාණය කළ කුඩා රොකට්ටුව වෙතය. ඔහුගේ අවශ්‍යතාවය වී තිබුණේ ඇගේ සිරුර අභ්‍යවකාශයේ කිරණවලට නිරාවරණය කර නැවත පණදෙන්නට හැකිද යන්න උත්සහ කර බැලීමයි.



**පොලිස් පරීක්ෂණවලදී තහවුරුවූයේ කාල් මළසිරුර සමඟ ලිංගිකවද එකතු වී ඇති බවයි. ඒ ඇගේ පාද අතරට කඩදාසි බටයක් ඇතුළුකර තාවකාලික යෝනි මාර්ගයක් සාදා ගනිමිනි**




මේ අතර කාල් වෛද්‍ය පරීක්ෂණයකටද යොමුකර තිබිණි. එහිදී තහවුරු වුණේ ඔහුට කිසිම ආකාරයක මානසික රෝගයක් නොතිබූ බවයි. ඒ හේතුව නිසාම ඔහු සොහොන් මංකොල්ල නඩුවෙන් නිදොස්කොට නිදහස් කිරීමට පියවර ගෙන තිබුණි. අවසානයේ මේ අපූරු ආදරවන්තයා වෙනුවෙන් දින කීපයක් මාරියාගේ ප්‍රතිනිර්මාණය කළ සිරුර මහජන ප්‍රදර්ශනයට තැබූ අතර පසුව එය රහසිගත සොහොනක තැන්පත් කළ බව පැවසෙයි. එතැන් පටන් හුදකලා ජීවිතයක් ගෙවූ කාල් 1952 වසරේදී මියගොස් ඇති අතර මේ අපූරු ප්‍රේමවන්තයාගේ ප්‍රේමයට නිර්වචනයක් සොයාගැනීමට අදටත් කිසිවෙකුටත් හැකිවී නැත.

■ රුවන් එස්.සෙනවිරත්න

දැන්වීමකි

# දරු සිහිනය පමාවීම මඳසරුබව නිසා මිස වඳබව නිසා නොවේ.



පවුල් පන්සල් වුණාට පස්සේ ගොඩක්දෙනෙකුගේ ඊළඟ බලාපොරොත්තුව තමයි දරු සුරතල් බලන එක. අර කතාවටත් කියනවනේ දරු සම්පත තරම් උතුම් සම්පතක් ලෝකේ කොහේවත් නැහැයි කියලා. ඒ කාලේ අපේ ආත්තම්මලා නම් කිව්වේ දෙන්නා තුන්දෙනා වුණාහම තමයි පවුලක් තවත් ශක්තිමත් වෙන්නේ කියලා.

ඒ වුණාට දරු පැටියෙක්ගේ කිරි හිනාවක් දකින්න කැමැත්තෙන් ඉන්න ඕනම අම්මෙක් කැමති තමන්ගේම කුසින් දරුවෙක් බිහි කරන්නනේ. ඒකට ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම නිරෝගීව සිටිය යුතුයි. මොකද දරුවන් නොලැබීම ස්ත්‍රියගේ පමණක් නෙවෙයි පුරුෂයාගේද යම් යම් දෝෂ නිසාවෙන් විය හැකියි. ඒ නිසා දරුපල බලාපොරොත්තුවෙන් සිටින යුවලකට දරුවන් ප්‍රමාද වෙනවා නම් පුළුවන් තරම් ඉක්මනට වෛද්‍ය ප්‍රතිකාරවලට යොමුවීම ඉතාමත් වැදගත්.

ඒ වෙනුවෙන් අද වෙනකොට බටහිර වගේම ආයුර්වේද වෛද්‍ය විද්‍යාවෙත් ඕනතරම් ප්‍රතිකාර තියෙනවා. ආයුර්වේදයේදී මේ තත්ත්වය හඳුන්වන්නේ වන්ද්‍යාභාවය එහෙමත් නැත්නම් මදසරුභාවය කියලා.

**මොකක්ද මේ මදසරුභාවය කියන්නේ? ඊට තියෙන පිළියම් මොනවද?**

මේ ඒ පිළිබඳ කොළඹ විශ්වවිද්‍යාලයීය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කාන්තා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය ආචාර්ය කෞමදී කරුණාගොඩ සමඟ කළ සංවාදයක සටහනක්.

**1. මොකක්ද මේ වන්ද්‍යාභාවය එහෙමත් නැත්නම් මදසරුභාවය කියලා කියන්නේ?**

ඇත්තටම මේකට වඳබව නොකියා මදසරුබව කියලා හඳුන්වන්න පුළුවන්නම් මම ගොඩක් කැමතියි. මොකද වඳබව කියන්නේ දරුවෝ නෑ කියන එකටනේ. නමුත් මදසරුභාවය කියන්නේ දරුවෝ පරක්කුයි කියන එකට. මේ ගැන ආයුර්වේද පොත්පත්වල මීට අවුරුදු 6000කට කලින් ඉඳන් ලියැවුණු ලිපි තියෙනවා. ඒකෙන් අදහස් වෙන්නේ මේ ගැටලුව මේ ඊයේ පෙරේදා ආපු එකක් නෙවෙයි කියලා. අවුරුදු 6000කට එහා සමාජය තුළදිත් දරුවන් ප්‍රමාදවීමේ ගැටලු තිබිලා තියෙනවා කියන එක.

**2. කොහොමද මේ තත්ත්වය ඇතිවෙන්නේ ?**

ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේදී දරුවන් ප්‍රමාදවීමට බලපාන ප්‍රධාන සාධක හතරක් ගැන සඳහන් වෙනවා. ඒක හරියට බීජයකින් පැළයක් හටගන්න විවිධාකාර හේතු තියෙනවා කියන කතාව වගේ. මව් කුසක කළලයක් හටගන්නත් ඒ හා සමානම හේතු බලපානවා. ඒ සාධක අපි හඳුන්වන්නේ ඍතු, ක්ෂේත්‍ර, අම්බු, බීජ කියලා.

ඍතුව කියලා කියන්නේ සාර්ථක දරුපල ලබන්න සුදුසු කාලයට. ඒ කියන්නේ එයා නිසි වයසෙදි විවාහ වෙලා නිවැරදි කාලයේදී අඹුසැමි සම්බන්ධතා පවත්වලා තියෙන්නට ඕන. ඒ කාලයට අපි කියන යුවනී කාලය කියලා. ඒ කියන්නේ කාන්තාවකගේ අවුරුදු 16 - 40ත් අතර වයසට.

ඊළඟට ක්ෂේත්‍ර කියලා කියන්නේ පැළයකට හොඳ පොහොර ටිකක් අවශ්‍ය කරනවා වගේ කළලයකට හොඳ ප්‍රජනක පද්ධතියක් අවශ්‍යයි කියන එකට.

එතකොට අම්මගේ ප්‍රජනක පද්ධතිය ආශ්‍රිතව තියෙන ඊස්ට්‍රජන්, තයිරොක්සීන් වගේ හෝර්මෝන හරියට ක්‍රියාත්මක වුණේ නැත්නම් ඒකට කියන්නේ අම්බු දෝෂ කියලා.

ඊළඟට මවගේ සහ පියාගේ ඩිම්බ සහ ශුක්‍රාණු නිවැරදි වෙලාවට ඩිම්බාවනය වුණේ නැත්නම් ඒවා සරු බීජ විදියට ගණන් ගැනෙන්නේ නෑ. ඒවට කියන්නේ බීජ දෝෂ කියලා. මොකද අපිට පැළ කරන හැම බීජයකින්ම පැළයක් ගන්න බෑ. මේකත් හරියට අන්න ඒ වගේ දෙයක්.

**3. දරුවෙක් ලැබෙන්න නම් නිරෝගී ඔසප්වීමක් සිද්ධවෙන්න ඕනෙ කොහොමද?**

ඇත්තටම කළලයක් හටගන්න නිවැරදි ඔසප්වීමක් අත්‍යවශ්‍යයි. ඒකට ආයුර්වේදයේදී කියන්නේ ශුද්ධ ආර්තවය කියලා.

**4. ශුද්ධ ආර්තවයක් වෙන්න නම් සපුරන්න ඕන කාරණාත් ඇති නේද?**

ඔව්. ශුද්ධ ආර්තවයක් හරියටම චන්ද්‍ර මාසයකට වතාවක් වෙන්න ඕන. ඒ කියන්නේ හරියටම දවස් විසි අටකට වතාවක්. දවස් හතකදී හරි ඊට අඩු කාලයකදී හරි නතර වෙන්නත් ඕන කරනවා. මොකද ඊට වැඩි කාලයක් ආර්තවය වුණොත් ඒක නිරෝගී ආර්තවයක් විදියට සලකන්නේ නෑ. විශේෂයෙන් මේ ආර්තවය අනවශ්‍ය වේදනාවලින් තොර වෙන්නත් ඕන. අනික එහෙම නිවැරදි ශුද්ධ ආර්තවයකදී පිටවෙන රුධිරය හරියට හාවෙකුගේ රුධිරයේ වර්ණය හෝ ලාකඩ වර්ණයෙන් යුක්ත වෙන්න ඕන කියලත් කියනවා. ඒ වගේම ප්‍රමාදවීම් ඒ අතරමැද කාලේදි ලේ ගැනීම් සිද්ධ වෙන්නත් බෑ. ඔන්න ඔය විදියට නිරෝගී ආර්තවයක් වුණොත් තමයි අපිට සරු බීජයක් බලාපොරොත්තු වෙන්න පුළුවන් වෙන්නේ.

**5. මේ වඳභාවය එහෙමත් නැත්නම් මදසරුභාවය කාන්තාවන්ට විතරක් පොදු දෙයක්ද?**

ඇත්තටම මේක ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම පොදු දෙයක්. ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ ස්ත්‍රී වන්ද්‍යාභාවයයි පුරුෂ වන්ද්‍යාභාවයයි කියලා දෙකක් සඳහන් වෙනවා. හැබැයි මෙතැනදි වැඩි බරක් පැටවෙන්නේ කාන්තාවන්ගේ පැත්තට.


**6. එතකොට පුරුෂ වන්ද්‍යාභාවය කියලා අදහස් කරන්නේ මොකක්ද?**

පුරුෂ වන්ද්‍යාභාවය කියන්නේ ගොඩක් දුරට ශුක්‍ර දෝෂවලට. ඒ කියන්නේ ශුක්‍රාණුවල ගුණාත්මකභාවය, ශුක්‍ර තරලවල ගැටලු, ශුක්‍ර සාන්ද්‍රණය අඩුවීම සහ ශුක්‍රාණුවල පිහිනායාමේ ඇති දුර්වලතා කියන ඒවා. මේ දේවල් නිවැරදිව සිද්ධ නොවෙන එකට තමයි අපි ශුක්‍ර දේෂ කියලා කියන්නේ.

**7. මේ මදසරුභාවය කියන එක ඇතිවෙන්න කලින් වළක්වගන්න ක්‍රමවේද තියෙනවද?**

අනිවාර්යයෙන්ම තියෙනවා. මේක වළක්වගන්න නම් අපි අර කලින් කතා කරපු ඍතු, ක්ෂේත්‍ර, අම්බු, බීජ කියන කාරණා හතරේ නිරෝගීකම ගැන සැලකිලිමත් වෙන්න සිද්ධ වෙනවා.

උදාහරණයක් විදියට ප්‍රමාද නොවී දරුවෙක් හදන්න ඕන. ඒ කිව්වේ අපි අර කලින් කතා කරපු 16 - 40ත් අතර යුවනී වයසේදී. මොකද ඒ වයස තමයි කාන්තාවකට උපරිම ප්‍රජනක හැකියාවක් තියෙන වයස විදියට සලකන්නේ.



**8. එතකොට යම්කිසි යුවලක් දරුවෙක් හදන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා නම් සැලකිලිමත් වෙන්න ඕන තවත් විශේෂ කාරණා මොනවද?**

විශේෂයෙන්ම ඒ අයගේ එදිනෙදා ජීවන රටාව ගැන, මවගේ පියාගේ උසට සරිලන බර ගැන සැලකිලිමත් වෙන්න ඕන. පමණට වඩා තරබාරු සහ කට්ටු අය ඉන්නවා නම් ඒ ගැනත් සැලකිලිමත්වෙන්න අවශ්‍යයි. මොකද එහෙම වුණාහම නිරෝගී බීජ ඇතිවෙන්න ඒවත් බලපානවා. අනිත් කාරණාය තමයි අනවශ්‍ය විදියට තරබාරු වෙනවා නම් කෙට්ටු වෙනවා නම් ඒක ඒ අයගේ උසට සරිලන බර පවත්වාගෙන යන්න බාධාවක් වෙනවා. මොකද මදසරුභාවය වළක්වා ගන්න උසට සරිලන බරක් තිබීමත් වැදගත් දෙයක්.

**9. දරුපල ප්‍රමාද වෙන්න කාන්තාවන්ගේ සහ පුරුෂයන්ගේ තියෙන රෝග මොනවද?**

දෙපාර්ශවයේම හෝර්මෝන ක්‍රියාකාරීත්වය, පෝෂණය, මානසික තත්ත්වයන් දුර්වල වීම මේකට බාධාවක් වෙන්න පුළුවන්. ඒ වගේම රුධිර ක්‍රියාකාරීත්වයත් හොඳ මට්ටමක තිබීම වැදගත්. ඩිම්බ නාල, පැලෝපීය නාල, ඩිම්බකෝෂ රෝගී තත්ත්වයන් මේ මදසරුභාවය ඇතිවෙන්න ප්‍රධානම හේතුවක්.

**10. අවසාන වශයෙන් මේවට ආයුර්වේදයේ තියෙන විසඳුම් ගැනත් මතක් කරමු?**

ආයුර්වේදයේදී මදසරුභාවයට කෙරෙන ප්‍රතිකර්ම පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් ස්වරූපයක් තමයි ගන්නේ. ඒ අනුව ඒ පුද්ගලයාගේ සරුබව වැඩි කරන්න ආහාරපාන, ඖෂධ ප්‍රතිකාර රාශියක්මත් තියෙනවා.



**ජ්‍යෙෂ්ඨ කතිකාචාර්යය**
**විශේෂඥ වෛද්‍ය**
**කෞමදි කරුණාගොඩ**
**දේශිය වෛද්‍ය පීඨය**
**කොළඹ විශ්වවිද්‍යාලය**
**071 592 1200**

උදාහරණයක් විදියට පංචකර්ම ප්‍රතිකාරවල සඳහන් ශිරෝධාර කිරීම, නිත්‍ය කර්ම, ශ්වේද කර්ම වගේ දේවල්වලින් මේක යහපත් අතට හරවන්න හැකියාවක් තියෙනවා. ශිරෝධාරා කිව්වේ හිසට ඖෂධීය තෙල් ගල්වලා ප්‍රතිකාර කරන එක. ඊළඟට නිත්‍ය කර්ම කියන්නේ නාසයෙන් ඖෂධීය තෙල් වර්ග ඇතුළු කිරීම. ශ්වේද කර්ම කියන්නෙත් අර වගේම ශරීරයට ඖෂධීය තෙල් ගල්වන එකට. ඇත්තටම අද වෙනකොට මේ මදසරුභාවය එහෙමත් නැත්නම් වන්ද්‍යාභාවයෙන් පෙළෙන අය කොහෙත්ම කණගාටු විය යුතු නෑ. මොකද ඒකට ඕනතරම් ආයුර්වේදී ප්‍රතිකාර තියෙනවා. ආන්න ඒ නිසා දරුපල ප්‍රමාද නිසා මෙච්චර කල් දුක්වුණු පසුතැවිලි වුණ අය ඉන්නවා නම් පුළුවන් ඉක්මනට ආයුර්වේදීය ප්‍රතිකාරවලට යොමු වෙන්න කියන එකයි මගේ අදහස.

**පියුමි මධුෂිකා**


# සෙත් අරණ ආයුර්වේද රෝහල

Ayurveda Seth Arana
Nature, Healing & Pleasure

**නො. 10, ආතර් පෙදෙස, නුගේගොඩ**

විශේෂඥ වෛද්‍යවරුන් හා විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් විසින් සේවය සපයනු ලබන අගනුවර පිහිටි අග්‍රගන්‍ය ආයුර්වේද වෛද්‍ය රෝහල

## කාන්තා රෝග සායනය

**අඟහරුවාදා 4.30 සිට 6.00 දක්වා හා සෙනසුරාදා උදේ 11.30 - 1.30 දක්වා පැවැත්වේ.**

නිවැරදි හා නියමිත කාලයක් අඛණ්ඩව ප්‍රතිකාර සඳහා යොමු වීමෙන් රෝග නිට්ටාවටම සුව කර ගත හැක.

- ඔසප් චක්‍රය ආශ්‍රිත දෝෂ - අධික වේදනාව, අධික රුධිර වහනය දින ගණනක් පැවතීම
- ගර්භාෂය ආශ්‍රිත රෝග තත්ත්ව - (Fibroid / Ovarian Cyst/ Endometriosis)
- හෝමෝන විෂමතා - PCOS, ඔසප් වීම ප්‍රමාද වීම
- වන්ද්‍යාභාවය හා දරුඵල ප්‍රමාදය - මදසරුබව (Subfertility)
- වෙනත් - සුදයෑම, යෝනි මාර්ගය ආශ්‍රිත විකෘතිතා

**සේවාවන්**

- නේවාසික ප්‍රතිකාර (පාකින්සන්, අංශභාග, අස්ථි සන්ධි රෝග වැනි කල්ගත වූ රෝග සඳහා)
- විශේෂඥ වෛද්‍ය සායන (ශල්‍ය රෝග, ENT, ස්නායු රෝග, කායික රෝග, චර්ම රෝග වැනි)
- OPD (බාහිර රෝගී අංශය)
- විශේෂිත ළමා ප්‍රතිකාර ඒකකය (ඔටිසම් සහ අධික්‍රියාකාරීත්වය / බාලක පක්ෂගාත)
- වේදනා කළමනාකරණ ඒකකය (Pain Management Unit)
- භෞතචිකිත්සක ඒකකය (Physiotherapy Unit)
- සෞඛය ප්‍රවර්ධන ප්‍රතිකාර (Wellness Trearment)

ප්‍රමිතියෙන් යුතු ආයුර්වේද ඖෂධ භාවිතයෙන් ඔබගේ රෝග සඳහා නිසැක සුවය

**ප්‍රධාන ශාඛාව :**
**නො. 43 රේමන්ඩ් පාර, නුගේගොඩ / www.setharana.com**
**වැඩි විස්තර සඳහා අමතන්න : 011 528 9248 / 077 762 0948**

**රුහුණු ශාඛාව :**
**ආයුර්වේද සෙත් අරණ රුහුණු ශාඛාව**
**109/1, තිස්ස පාර, රන්න. 047-2227373**

# රත්තරන් දුවේ



අත්තනායක
එම්. හේරත්



# දුව දොස්තර නෝනා කෙනෙක් වුණාට මම තාම ඇඟලුම් කම්හලේ වැඩට යනවා

රත්තරන් දුවේ

මේ සිදුවීම මට වුණේ අපේ පංතියකදී නෙවෙයි. මම ගියා එක්තරා ඇඟලුම් කම්හලක දේශනයකට. මම ඒ දුවලට කිව්වා මං දේශන කරන විට ඔයාලට හිතෙන දේ ලියලා එවන්න කියලා. ඒ දුවලා මහලොකු දැනුගත් අය නොවෙන හින්දා මම ඒ අයගෙන් මහලොකු ප්‍රශ්න බලාපොරොත්තු වුණෙත් නැහැ. එක දුවෙක් මෙන්න මෙහෙම ලියලා එවලා තිබුණා.

**'විජය එනවිටත් අපි හිටියෙ**
**ඇඳුම් මහ මහ**
**මම කුවේණී එයා විජය**
**එයා මට ආශාවෙලා**
**මාව බැන්දා**
**දරු දෙන්නෙක් දීලා එයා පැන්නා**
**අදත් අපි ඒ වගේමයි, අසරණයි**
**ඔක්කොම අපිව දාලා යනවා'**

මම මේ කවිය හයියෙන් කියෙව්වා. උපාධියක් කරන දුවෙකුගේ තියෙන මානසික මට්ටම මේ දුවලටත් තිබීම ගැන මට හරිම ආඩම්බරයක් ඇතිවුණා. මං ඒ දුවව නැගිට්ටවලා අනෙක් අය ලවා අත්පොලොසන් දීලා ඒ අයගේත් ගෞරවය අරගෙන දුන්නා. ඒ සිද්ධිය වෙනකොට අපට ඩොලර් ප්‍රශ්නයක් තිබුණේ නැහැ. හැබැයි අද අපිට එහෙම ප්‍රශ්නයක් තියෙනවා. අද අපට ඩොලර් ගේන්න උදව්වෙන ප්‍රබලම ශ්‍රම බළකාය තමයි මේ දුවලා. හැබැයි ඒ පංතියේ දුවලට ඒ පංතියෙන්ම කුවේණිට සිද්ධවෙච්ච වගේ අසාධාරණයක් වෙන එක මහ අපරාධයක්. ඉතින් ඒ දුවගේ කවිය අගය කරලා මං කිව්වා අපේ අධ්‍යාපන ක්‍රමයේ වැරැද්දෙන් දුවලට තාක්ෂණික අධ්‍යාපනයක්, ලිංගික අධ්‍යාපනයක් ලැබුණේ නැහැ. හැබැයි දුවලට පුළුවන් තමන්ට ළංවෙන්න බැරිවෙච්ච ලෝකය දුවලගෙ දරුවන්ට උදාකරලා දෙන්න කියලා.

ශ්‍රී ලංකාවේ ඇඟලුම් ව්‍යාපාරය ආරම්භ වුණේ සිරිමා මැතිනියගේ කාලයේ. ප්‍රේමදාස මහත්තයා ඒක දීපව්‍යාප්ත කරා. මේ කම්හල් නොතිබුණානම් වැඩිදුර අධ්‍යාපනය නොලැබූ අපේ දුවලට සල්ලි හොයන්න ඇඟ විකුණනවා හැර වෙන කරන්න දෙයක් නෑ කියලා මම ඒ දේශනයේදී කිව්වා. ප්‍රේමදාස ඇඟලුම් කම්හල් අරඹනකොට සමහර අය විවේචනය කරා අපේ කෙල්ලෝ ලවා සුද්දියන්ට ජංගි මස්සනවා කියලා. ඒත් මේ දුවලගේ සේවය අද 'අත්‍යවශ්‍ය සේවයක්.' බලන්න අද අපිට පිහිටට ඇවිත් තියෙන්නේ අප එදා පහත් කරලා සලකපු ඇඟලුම් සේවය. මං ඊටපස්සේ මගේ දේශනය කරගෙන ගියේ අර දුවගේ කවිය පදනම් කරගෙන. දුවකගේ පුතෙකුගේ ගෞරවය වෙනුවෙන් ඔබ හිමිකරගත යුතු ජීවිතාවබෝධය මං ඒ දූලට පැහැදිලි කරා. දුවලගෙ පැලැන්තියේ ඉස්සර හිටපු දුවලා කවදාවත් ඉස්කෝලෙ ගිහින් නැහැ. ඒත් ඒ අය ව්‍යවහාරික බුද්ධියෙන් ජීවිතය බේරගත්තා. නිවැරදි කරගත්තා. මාත් එක්ක මේ දේශනයට ගියා මගේ කවි කියන අනුෂ්ක කියන තරුණයා. මං එයාට කිව්වා මෙන්න මේ කවිය කියන්න කියලා.

**'අල්ලාගෙන නෙරිය අතකින් කිමදා නගෝ**
**වසාගෙන දෙතන අතකින් කිමදා නගෝ**
**හිමියා නැති ගමන් තනිමග කිමදා නගෝ**
**අම්බලමේ ඉඳලා අපි යම්දා නගෝ'**

කොල්ලා මේ කවිය ලස්සනට ගායනා කරා. කවියේ තිබුණේ පාර අයිනේ අම්බලමක හිටපු පුතෙක් පාරේ තනියම යන දුවෙකුට කියපු කවියක්. ඔහු හිතුවේ ඇය රෙදිපොට උස්සාගෙන යන්නේ, පපුව අත ගගා යන්නේ, තනියම යන්නේ කාවහරි ලිංගිකව පොළඹවන්න කියලා. ඒ හින්දා ටිකක් නැවතිලා යමු කියලා ආරාධනා කළා. මෙන්න එතකොට ඒ දුව ඒකට පිළිතුරු කවියක් කියනවා.

**'අල්ලාගෙන නෙරිය මඩ ගෑවෙන හින්දා**
**වසාගෙන දෙතන බිලිඳුගෙ කිරි හින්දා**
**බාල මස්සිනත් පස්සෙන් එන හින්දා**
**යන්නම් අයියණ්ඩි ගම රට දුර හින්දා'**

අකුරු නූගත් උපාධියක් නැති ඒ දුව තරුණයාට කිව්වේ අමුතු කතාවක්. නෙරිය ඔසවාගෙන යන්නෙ රෙද්දේ මඩ ගෑවෙන හින්දා. පපුව අල්ලාගෙන යන්නේ කිරි එරිලා හින්දා. ඒ මදිවට බාල මස්සිනත් ළඟ ළඟ එනවලු. ඉතින් ඇය ඔහුට සහෝදරත්වයෙන් කිව්වා අපේ ගම රට දුරයි මම යන්නම් කියලා. ඇය ඉතා බුද්ධිමත්ව තරුණයා මගහැරලා ගියා. අම්බලමේ සීමාව පහුවුණ ගමන් මෙන්න ඒ දුව තුන්වැනි කවියත් කියනවා.

**'අල්ලාගෙන නෙරිය මඩ ගෑවුණෙත් නැතී**
**වසාගෙන දෙතන බිලිඳුගෙ කිරිත් නැතී**
**බාල මස්සිනෙක් පස්සෙන් එනුත් නැතී**
**බිලිඳෙකු තියා මා දීගෙක ගියෙත් නැතී'**

මේ කවියේ තේරුම මං කියලා දෙන්න ඉස්සර දූලා පුතාලා අත්පොලොසන් දුන්නා. ඉතින් මං කිව්වා පාසල් අධ්‍යාපනය බිඳවැටුණාට ව්‍යවහාර ලෝකය ජයගන්න ඉව හැමෝටම දීලා තියෙනවා කියලා. අර කුවේණී ගැන 'චිට්' එක එව්ව දුව වගේ.

මේ කවි කියූ දුවලා ඉස්කෝලේ ගිය අය නෙවෙයි. ජීවිතය තමන්ම කියවගත්ත අයගේ පරම්පරාව. ඔන්න එතකොට මට තවත් 'චිට්' එකක් ආවා. 'අනේ සර් දේශනය ඉවරවෙලා ටිකක් ඉන්න, මට සර්ට කියන්න දෙයක් තියෙනවා' කියලා. මං ඒක කියෙව්වෙ නැහැ. ඒ ළමයා හම්බවෙයිනේ කියලා මම දේශනය කරගෙන ගියා. ඔන්න මම ආයෙත් අනුෂ්ක ලක්සිරිට කතා කරා කවියක් කියන්න.

**'කෙකටිය මලේ වක යාදෝ නොයාදෝ**
**බෝඹු ඉදල දලු දාදෝ නොදාදෝ**
**කැලණි ගඟේ ඔරු යාදෝ නොයාදෝ**
**කලුගෙ නගා මෙහි ඊදෝ නොඊදෝ'**

ඔන්න එක තරුණයෙක් කසාද බැන්දා. බිරිඳට බබෙක් ලැබෙන්නත් ආවාට පස්සේ ඇගේ තනියට බිරිඳගේ නංගි එක්කරගෙන ආවා. දැන් අක්කටත් පහසුයි තරුණයාටත් පහසුයි. බිරිඳ එහෙ මෙහෙ වෙන වෙලා බලලා තරුණයා පුංචි නෑනට ඉව අල්ලන්න පටන්ගත්තා. ඒත් පුංචි නෑනාගෙන් කිසිම ප්‍රතිචාරයක් නැහැ. බිරිඳ ඉන්න නිසා ඍජුව කතා කරන්නත් අමාරුයි. ඔහු ගෙදර හැමෝටම ඇහෙන්න මේ කවිය කිව්වා. ඒක තේරුණේ පොඩි නෑනට විතරයි. බිරිඳ හිතුවේ සැමියා විනෝදෙට කවි කියනවා කියලා. ඔහු පළමුවෙන් ඇහුවේ මොකද නංගි වේලිච්ච බෝඹු ලීයක් වගේ, දලු දාන්න බැරිද? මේ බෝඹු ලී කියන්නේ කමත අතුගෑමට ගන්න ශක්තිමත් දැව විශේෂයක්. මොකද ඔයා කෙකටිය මල වගේ කුදු ගහගෙන ඉන්නේ? ගඟේ ඔරු පදින්න බැරිද? මගේ මේ වැඩ හින්දා අපිව දාලා ඔයා යනවද? තම මස්සිනාගේ ලිංගික ප්‍රේරණය පුංචි නෑනාට තේරුණා. ඉස්කෝලේ නොගිය අකුරු නූගත් පුංචි නෑනා දුන්න උත්තරය බලන්නකෝ.

**'බෝඹු ඉදල දලුලන්නේ වැස්සකටයි**
**කෙකටිය මලේ වක යන්නේ පැද්දකොටයි**
**කැලණි ගඟේ ඔරු යන්නේ පැද්දකොටයි**
**කලුගෙ නගා මෙහි ඉන්නේ නෑකමටයි'**

ඇය අක්කට නොතේරෙන්න මස්සිනාට තේරෙන භාෂාවෙන් උත්තර දුන්නා. තමන් මෙහි ආවේ අක්කාට උදව්වට මිස බබා හම්බවෙනතෙක් මස්සිනා සැනසීමට නොවන බවත් ඇය කිව්වේ අක්කාගේ විවාහය නොකඩා තමනුත් බේරෙමින්.

ඉතින් දේශනය ඉවර වුණාට පස්සේ අර මං කලින් කිව්ව 'චිට්' එක ලිව්ව එක්කෙනා මං අසලට ආවා. මං හිතුවේ තරුණ දුවෙක් කියලා. බලද්දි එයා මැදි වයසට කිට්ටු කෙනෙක්.

"සර්, සර්ට කියන්න දෙයක් මට තියෙනවා. මං මේ කම්පැනියේ දැන් වසර ගණනාවක්. මං මේකෙ වැඩ කරන අවදියේ මගේ මහත්තයා මාව දාලා පැනලා ගියා. මං මගේ දුව හදාගත්තා. ඉගැන්නුවා. ඒ ඔක්කොම කළේ මේ කම්පැනියේ ආධාරවලින්. සර් මගේ දුව දැන් වෛද්‍යවරියක්. ඒත් එයා මට කිව්වා සේවය නතර කරන්න එපා, දිගටම වැඩට යන්න. අපි කෑවේ බිව්වේ ඉගෙනගත්තේ ඔතනින්. ඒ අය අම්මව එලවනකල් වැඩට යන්න. ඉතින් සර් මේ ආයතනවල අලුත් ළමයි මාසෙන් මාසෙට ෆැක්ටරියෙන් ෆැක්ටරියට පනිනවා. මං ජීවිත කාලෙටම වැඩ කළේ මෙතන. මීටපස්සේ ෆැක්ටරිවලට ගියාම මේ කතාව කියන්න. අපි ඉගෙන නොගත්තට අපේ දුවලට පුතාලට ලෝකය ගොඩනගන්න මේ ෆැක්ටරිවලින් පුළුවන්. මමත් විජයට රැවටුණා. ඒත් මං ජීවිතය නසාගත්තෙ නැහැ. මමත් දිනලා දුවත් දිනලා. මගේ මිනිහට මෙහෙ එන්න බැරිවුණා. පිළිකාවක් හැදිලා හිඟන්නෙක් වගේ මැරිලා ගිහින්."

අත්තනායක එම්. හේරත්

## රත්තරන් දුවේ

ධරණී 'රත්තරන් දුවේ' ලිපි මාලාවට ඉතා ඉහළ ප්‍රතිචාර ලැබෙමින් පවතින අතර බොහෝදෙනාගේ ඉල්ලීම මත මෙය මහාචාර්ය අත්තනායක එම්.හේරත් මහතා සහභාගී වන එළිමහන් වැඩසටහනක් ලෙස පැවැත්වීමට කටයුතු යොදා ඇත. එබැවින් ඔබේ පාසලේ, දහම් පාසලේ, රැකියා ස්ථානයේ හෝ ඇඟලුම් කර්මාන්තශාලාවේ සිටින සියලු කාන්තාවන්ට ආමන්ත්‍රණය කරන වැඩසටහනක් ලෙස මහාචාර්ය අත්තනායක එම්.හේරත් ඇතුළු සම්පත් දායකයින් සහභාගී කරවාගැනීමට අපේක්ෂා කරන්නේනම් පහත දුරකතන අංකයට අමතන්න.0714519342

ධරණී

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්

අංක 91, විජේරාම මාවත,
කොළඹ 07.
දුරකථන 0115 200 900
බෙදාහැරීමේ අංශය
0112 127204
දැන්වීම් අංශය
0112672601, 0112672603, 0761393811
ෆැක්ස් 0112 673 451

ධරණී
පුවත් පත නිවසටම
ගෙන්වාගන්න අමතන්න
076 1367 623

## වාණිජ බැංකු ඇබෑර්තු

★ කුඩා හා මධ්‍ය පරිමාණ බැංකු ශාඛා සඳහා ප්‍රාදේශීය මට්ටමින් අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.

40,000/-
18/40 ගැ/පි
(මෑන් පවර් නොවේ)

0716 434 278 | 0703 346 072
0702 725 731 | 0774 024 155
0761 125 624 | 0702 231 694

පවුලේ සැමට සනීපවත් ජීවිතයක්

වෙන්ඩෝල් ඔලිව් සෝප් විත් බී හනී

වෙන්ඩෝල් කොහොඹ සෝප් විත් ඇලෝවේරා




හොඳම දේ අඩුම මිලට වෙන්ඩෝල් සමාගමෙන්

## කුමන තත්වයේ පැවතියද

ඔබ ළගටම පැමිණ අත්පිට මුදලට වාහන මිලදී ගනු ලැබේ.

වාහන ඔබගේ නිවසටම පැමිණ මිලදී ගනු ලැබේ

LASSANA CAR SALE කඩවත

Missed call එකක් පමණක් ලබා දෙන්න

PANDA
CROSS



SUZUKI
ALTO



RENAULT
KWID



මයික්‍රෝ පැන්ඩා, PANDA CROSS, ALTO, MARUTI, MX 7, BAIK D20, X25 MG ACTYON, KYRON, REXTON, පෙරොඩුවා එලයිට් AXIA, GLORY, VITZ, PRIUS, TATA, NANO, CHERY QQ, PROTON VIRA, SAGA, ZOTYE NOMAD, මහේන්ද්‍රා SCORPIO, SUMO, NAVARA, TATA WINGER, CHANA MICRO, MPV ඇතුළු


077 177 8010

*MICRO චයිනීස් මැලේසියන් CARS විශේෂයි.

CHERY TATA REXTON Mahindra

පුරා සාරා

# සමහර පිරිමිත් හරියට කඟවේන්නු වගේ



**බුදුහාමුදුරුවෝ අර තනි අඟක් තියෙන කඟවේනාව උපමා කළේ කාටද?**

මට මතක විදියටනම් පසේබුදුවරුන්ට.

හරියට හරි. මට හිතෙනවා සමහර පිරිමිත් ඒ වගේ කියලා.

**ඇයි?**

ඔය තනි අඟක් තියෙන කඟවේනා කියන එකා ඉන්නෙ මහකැලේ මැද්දේ තනියමලු. ඌ රංචු ගැහිලා හැසිරෙන සතෙක් නෙවෙයි. ඒකයි බුදුහාමුදුරුවො ඒකාව පසේබුදුවරුන්ට උපමා කළේ. මොකද උන්නාන්සෙලත් ඇවිල්ලා තනියෙන් නිවන් දැකලා තනියම පිරිනිවන්පාන උත්තමයෝ කොට්ඨාසයක්නේ...

**හරි... ඉතින් එහෙමයි කියලා පිරිමි කොහොමද ඔය කතාවට සමාන වෙන්නේ?**

ගොඩක් පිරිමිත් නිදි ඇඳේදී ඔය චරිතයට පණ දෙනවනේ.

**ඒ කොහොමද?**

මේකනේ වැඩේ. පිරිමි පවුලෙ බර කරට ගත්තට පස්සේ ඉස්පාසුවක් නැතුව සල්ලි හම්බකරන්න මහන්සි වෙනවා. ඒ කරලා දරුවන්ගේ, නෝනා මහත්තයාගේ ඕනෑ එපාකම් විතරක් නෙවෙයි උන්දැගේ සනුහරේම ගොඩ දාන්න උත්සාහ කරනවා. හැබැයි දවල්ට බුදුවෙලා වගේ පවුල් පිටින් එතෙර කරවන්න හැදුවට මොකද රෑට තනියම එතෙර වෙන්නයි ගොඩක් පිරිමි ට්‍රයි කරන්නේ.

> **ගඟ මැද අතරමං වෙන දවස් ගණන වැඩි වුණාම, හයිය හත්තිය ඇති නැවක නගින්න බලාගෙන ඉන්න ගැහැනු මිසක් එකම ඔරුවකින් එගොඩට යන්න බලාගෙන ඉන්න ගැහැනු දැන් හරි අඩුයි**

**මට තවම තේරෙන්නේ නෑ මොකක් ගැනද ඔය කියන්නේ කියලා?**

මං මේ කතා කරන්නේ කසාද බැඳපු බහුතරයක් ගැහැනුන්ට තියෙන ප්‍රශ්නෙ ගැන. ඒ අය ලිංගිකව තෘප්තිමත් නෑ. එළිපිට කතා නොකළාට මොකද මේක අපේ සමාජයේ අප්‍රකාශිත ජාතික ප්‍රශ්නයක්.

ඇත්තටම එහෙම වෙන්න පුළුවන්. මම අහලා තියෙනවා දැනට ඔය උසාවිවල තියන දික්කසාද නඩු බර ගාණකටත් හේතුව ඕකමයි කියලා. හැබැයි වැඩේ කියන්නේ ප්‍රශ්නේ කොච්චර බරපතළ වුණත් ගෑනියෙක් ඕක තමන්ගේ මනුස්සයා එක්ක කතා කරලා විසඳගන්නේ නෑනේ. එහෙම කතා කරන්න ගියොත් එක්කො වනචර ගෑනියෙක් ගාණට හංවඩු ගැහෙනවා. එළියට බැහැලා කතා කරන්න ගියොත් විලිසංගේ නැති එකියක් ගාණට ලේබල් වෙනවා. ඒ නිසා ඔය ප්‍රශ්නේ හැමදාටම අප්‍රකාශිත ප්‍රශ්න ගොඩේම තියේවි.

**ඇත්තටම ඔය ප්‍රශ්නෙදී කවුද වැරදි? තමන්ගෙ අතෘප්තිමත්භාවය ගැන කතා නොකරන ගැහැනුද? එහෙම නැත්නම් තමන්ගේ තෘප්තිමත්බව ගැන විතරක් හිතන පිරිමිද?**

දෙගොල්ලම වැරදියි. හැබැයි ඒ ඇරුණම මේ ප්‍රශ්නෙට මේ සමාජයත් වගකියන්න ඕන කියලා මට හිතෙනවා.

**ඒ කොහොමද?**

අපි දන්න කියන කාලෙ ඉඳලා පවුල් ජීවිතේ ගැන කතා කරද්දී පරමාදර්ශී බිරිඳ විදියට උදාහරණයට ගන්නේ යශෝදරා දේවියනේ. ඇත්තටම එතුමිය ඒ තරම් කතා කරන්න වටින චරිතයක් තමයි. හැබැයි සමහර තැන්වල මම අහලා තියෙනවා සහ කියවලා තියෙනවා ස්වාමි ගෞරවය නිසා ලිංගික කටයුත්තේ නිරත වෙන වෙලාවට යශෝදරා හරියට සිද්ධාර්ථ දිහා කෙළින් බැලුවෙත් නෑ කියලා. ඉතින් එහෙම කතා ඇහෙනකොට සාධුකාර දෙන අපේ උපාසක අම්මලා හිතනවා තමන්ගෙ දූලා, මිනිබිරිලා හදන්න ඕනත් එහෙමයි කියලා. ඒ කියන්නේ කසාද බැන්දට පස්සේ ලිංගික කාර්යය සඳහා එක්වෙන මොහොතේ මිනිහගේ මූණ බලන එක, හරි කෙළින් ඇස් දෙක දිහා බලන එක නොහොඹිනාකමක් කියලා සමහර වයසක උන්දැලා පොඩි කෙල්ලන්ගේ ඔළුවට දනවා.

එහෙම වුණාට පස්සේ ඉතින් ගෙදර මනුස්සයගෙන් සතුටක් නොලැබෙන ගෑනු තමන් නිවන් දැක්කේ නැතිවුණාට මිනිහාව නිවන් දක්කන එකත් මාර පිනක්නේ කියලා හිතලා එක්කො හිත හදාගන්නවා. නැත්නම් ප්‍රශ්න හදාගන්නවා.

අර 'වැජිනිමස්' කියන රෝගයත් ඔය කතාවෙම දිගුවක් කියලයි මට හිතෙන්නේ.

**ඒ මොකක්ද? අර කලව බන්ධනය කියන එකද?**

ඔව්. හැබැයි මේ ගමේගොඩේ මිනිස්සු හිතන විදියට ඒක ඇවිල්ලා ගුරුකම් යන්තර මන්තර හින්දා වෙන දෙයක් නෙවෙයි. වැජිනිමස් කියන්නේ ගැහැනියක් පළවැනි වතාවට ලිංගිකව එක්වෙන්න ලෑස්ති වෙන වෙලාවේ යෝනි මාර්ගයේ මාංසපේශි තදවීම නිසා ඒ කටයුත්ත කරගන්න බැරි තත්ත්වයකට පත්වෙන එක. ලෝකෙ ගත්තොත් ඔය ලෙඩේ වැඩිපුරම තියෙන රටවල්වලින් එකක්ලුනේ ලංකාව.

**හේතුව?**

හේතුව තමයි පොඩි කාලෙ ඉඳලා ගෑනු දරුවන්ගේ ඔළුවට දන විෂ. එක්කො ළමයින්ව කාන්තා පාසල්වලට විතරක් යවලා පිරිමින්ගේ ආශ්‍රය සීමා කරනවා. ඊටත් පස්සේ අසීමිත විදියට ගැහැනු දරුවන්ව පාලනය කරනවා. ඒ වගේම ඔය කන්‍යාභාවය කියන එක ගැන සහ ඒක රැකුණේ නැත්නම් තව මොනවා තිබුණත් වැඩක් නැත වගේ පදනමක් නැති කතා ගෑනු දරුවන්ගේ ඔළුවට දනවා. ලිංගිකත්වය කියන්නේ මහා නරක දෙයක්යැ, ඒ ගැන කතා කරන උන් උල තියන්න ඕනෑ වගේ මෝඩ තර්ක ඉදිරිපත් කරනවා. ඉතින් දරුවෙක් වැඩිවියට පත්වෙන තැන ඉඳලා කසාද බඳින තැනට එනකන් ඔය වගේ නානාප්‍රකාර විකාරවලින් ඔළුගෙඩි කුරුවල් කළාට පස්සේ වැජිනිමස් හැදිලා නිකන් හිටියොත් ඇති!

හැබැයි ඉතින් අර ගෑනුන්ට සම තැන දෙන්න කියලා බෝඩ් උස්සගෙන යන නෝනලා කවදාවත් ඔය කාරණාවේදී ගෑනුන්ට සම තැන නොලැබෙන එක ගැන කතා කරනවා මමනම් දැකලා නෑ.

> **යශෝදරා සිද්ධාර්ථ දිහා කෙළින් බැලුවේ නෑ කියද්දි සාධුකාර දෙන උපාසක අම්මලත් මේකට වගකියන්න ඕන**

හැබැයි ආසියාතික ගැහැනු මේ ප්‍රශ්නේ නිසා ඇතුළාන්තයෙන් දැවෙන විදිය ගැන ඉන්දිකා උපමාලි කියන ගායිකාව බොහොම ලස්සනට ගීතයකින් ගායනා කරනවා.

**මොකක්ද සිංදුව?**

**රෑ මැදියම මත් වූ තොටියෝ**
**ඔරු පදින්න මා කැඳවන**
**නුඹ විතරක් එතෙරට යන**
**රෑ මැදියම මත් වූ තොටියෝ....**

**මාස් වැස්ස ඉවර වෙලා**
**අලුත් වතුර ගලන ගඟේ**
**මල් නෙළුවා මතකද තොටියෝ**
**ඔරුව පෙරළුණත් ගඟ මැද**
**මාව අරන් නුඹේ තුරුළට**
**එතෙර කළා මතකයි තොටියෝ...**

**රුවල් නඟා යන නැව් දැක**
**සසල වෙලා බැලුවත් නුඹ**
**නැව් නඟින්න හිත නෑ තොටියෝ**
**නුඹෙ ඔරුවෙන් යළි දවසක**
**කුමුදු පිපුණු හඳ එළියක**
**එතෙර යන්න ආසයි තොටියෝ...**

මම හිතනවා මේ ගීතය ගැහැනුන්ට වඩා සියලු පිරිමි විසින් ඇසිය යුතුම ගීතයක් කියලා. මොකද ගැහැනුන්ගේ දැවීම, තැවීම ගැන මේ තරම් සංයමයකින් යුක්තව එළියට දාපු නිර්මාණයක් තවත් ඇති කියලා ඇත්තටම මම හිතන්නේ නෑ.

අනිත් එක මට අනුව නම් මේ සින්දුවේ අවසාන කොටස තමයි වඩාත් ආදරණීයම. මොකද ගඟ මැද අතරමං වෙන දවස් ගණන වැඩි වුණාම, හයිය හත්තිය ඇති නැවක නගින්න බලාගෙන ඉන්න ගැහැනු මිසක් එකම ඔරුවකින් එගොඩට යන්න බලාගෙන ඉන්න ගැහැනු දැන් හරි අඩුයි.

පුරා

# විද්දෙ අලියාට වුණාට තව පොඩ්ඩෙන් වදින්නෙ මහාචාර්ය පට්ටමට





තොරතුරු
පශු වෛද්‍ය
**තරිඳු විජේකෝන්**
(ශ්‍රී දළදා මාලිගාව, Millennium Elephant Foundation සහ Vetcare සත්ව රෝහල)

විශ්වවිද්‍යාලය යනු බොහෝදෙනෙකුගේ ජීවිත වෙනස් කරන තැනකි. පශු වෛද්‍ය තරිඳු විජේකෝන්ටද විශ්වවිද්‍යාලය යනු ජීවිතය වෙනස් කළ තැනකි. ඔහුගේ ප්‍රේමය මුණගැහුනේද විශ්වවිද්‍යාලයේදීය. හන්තානේ සුන්දරත්වය ඇතිතරම් විඳගත්තේද විශ්වවිද්‍යාලය හේතුවෙනි. එසේම සිය ජීවිකාව කුමක්ද යන්න තීරණය කිරීමට ඔහුට උපකාර වූයේද විශ්වවිදයාලයයි.

මෙලෙස පේරාදෙණිය පශු වෛද්‍ය පීඨයේ සිටින සමයේ එක්තරා කාලයක ඔහුට සුව නොකළ හැකි උණක් වැළඳුනේය. ඒ, අලි උණයි. වර්තමානයේ තමා විසින් ප්‍රතිකාර ලබාදෙන ඇතැම් අලි ඇතුන් අතගෑමත් ඔහුට එකල සිහිනයක් විය. එය ඔහුගේ ගුරුවරයා වූ මහාචාර්ය අශෝක දංගොල්ල රට වටේම හීලෑ අලි ඇතුන්ට ප්‍රතිකාර ලබාදුන් කාලයයි.

"අනේ මටත් දංගොල්ල සර් එක්ක අලියෙක් බලන්න යන්න සෙට් වුණොත් කොච්චර ෂෝක්ද?"

අලි උණ උත්සන්න වී තිබියදී හෙතෙම විවිධ අවස්ථාවල එසේ සිතන්නට විය. එලෙස හීන මවමින් සිටි දිනක ඔහුට මහාචාර්යවරයාගෙන් පණිවිඩයක් ලැබුණේ කෑගල්ලට යාමට සූදානම් වන ලෙසයි.

"ෂුවර් එකට අලියෙක් බලන්න යන්න වෙන්නැති."

පශු වෛද්‍ය ශිෂ්‍ය තරිඳුට සිතිණ. ඒ ප්‍රීතියෙන් උද්දාමයට පත් හෙතෙම මහත් බලාපොරොත්තු සහිතව සේලයින්, නිර්වින්දන තුවක්කු ආදිය සූදානම් කළේය. පසුව මහාචාර්ය දංගොල්ලගේ, රථයේම නැගී ගමන ඇරඹුවේ මහත් සතුටිනි.

"ගෙදරක ඉන්න ඇතින්නක් දම්වැලක් කඩාගෙන. ඇත්ගොව්වා ගමේ ගිහින් ඉද්දි තමයි ඒක වෙලා තියෙන්නෙ. ඇතින්න ඉන්නෙ බයවෙලා. කාටවත් කෑම දන්නවත් දෙන්නෙ නෑලු. අලි බාසුන්නැහේ එන්නත් දවස් කීපයක් යනවා. ඒ නිසා නිර්වින්දනය කරලා දම්වැල් දාලා තියන එක තමයි හොඳම වැඩේ. මොකද ඉතිරි දම්වැලත් කඩා ගත්තොත් මහා විනාශයක් වෙලා තමයි නවතින්නේ."

රථයේදී මහාචාර්ය දංගොල්ල සිය ගෝලයාට තත්ත්වය පැහැදිලි කළේය. අලි උණ කෙසේ වෙතත් අදාළ ස්ථානයට ළං වනවිට පශු වෛද්‍ය සිසුවාට හීන් දාඩිය දමා තිබුණි. මින් පෙර කිසිදක ඔහු සන්සුන් අලි ඇතුන් මිස කලබලකරුවන් දැක තිබුණේ නැත. එමෙන්ම නිර්වින්දන අත්දැකීමක්ද නොවීය. මහාචාර්ය දංගොල්ලගේ උපදෙස් මත නිර්වින්දන අවිය සැකසුවද ඔහුට එය කිහිප වතාවක් පැටලුණි. එනිසා බැනුම් ඇසීමටද සිදුවිය.

"නිර්වින්දන තුවක්කුවෙන් වෙඩි තියන්න පුළුවන්ද?"

අවිය සැකසීමෙන් පසු මහාචාර්යවරයා ඇසීය.

"බෑ සර්."

පෙර පුහුණුවක් ලබා තිබුණද ශිෂ්‍ය තරිඳු ගත්කටටම දුන් පිළිතුර එයයි.

"ඕ කේ" කියූ මහාචාර්ය දංගොල්ල සිය ගෝලයාද සමඟ ඇතින්න අසලට ගියේය. අලි හිමිකරු සහ තවත් අය එතැන වූහ. ඒ සැවොම ඉදිරියේ මහාචාර්ය දංගොල්ල සිය සිසුවාට තුවක්කුව දිගු කළේය.

"අද තරිඳු තමයි නිර්වින්දනය කරන්නෙ."

සියල්ලන් බලා සිටියදී ගුරුවරයා පැවරූ කාරිය කරනවා හැර ඔහුට විකල්පයක් නොවීය. හෙතෙම ගහකට මුවා විය. බේරී පලායාමට පාරවල්ද සොයාගත්තේය. අනතුරුව මහාචාර්ය දංගොල්ලගේ විධානය අනුව පළමු නිර්වින්දන ඖෂධ උණ්ඩය නිදහස් කළේය. සිතුවාට වඩා වැඩේ සාර්ථකය. ඇතින්න ක්‍රමයෙන් දැඟලිල්ල අඩු කළාය. සෙමින් සෙමින් ආහාර ගත්තාය. දැන් ඈ සන්සුන්ය. පසුව එතැනට පැමිණි පළපුරුදු හස්තිපාලකවරයෙක් ඇතින්නට දම්වැල් දැමීය. මහාචාර්යවරයා සහ ගෝලයා පිටත්ව ආවේ ඉන් පැය දෙකකට පමණ පසුවයි.

අද වනවිට ඕනෑම අලියෙකුට ප්‍රතිකාර කිරීමට ආත්මවිශ්වාසය ගොඩ නැගීමට වෛද්‍ය තරිඳුට මෙම සිදුවීම මහත් රුකුලක් වන්නට ඇත. ඔහුගේ අලි ප්‍රේමය දිගටම පවත්වාගැනීමේ අඩිතාලමද එය විය හැකිය. එහෙත් එකල ඔහුගේ මෙම අලි ප්‍රේමය නොරිස්සූ කෙනෙකුද විය. ඒ වර්තමානයේ පශු වෛද්‍ය තරිඳුගේ බිරිය වන එකල පෙම්වතිය වූ කුසලායි. විශ්වවිද්‍යාල සමයේ ඇයට ඔහු හමුවීමට තිබූ අවස්ථා අතිශය සීමිත විය. ඒ, සිය පෙම්වතා සෑම සතිඅන්තයකම පාහේ අලි රාජකාරියක නියැලී සිටි බැවිනි.

**රජනිකා ලියනගේ**

හොරණ පුරවරයේ ඔබට අත්‍යාවශ්‍යම වූ අඩුව සපුරාලමින්

**අමරසිංහ වෙද මැදුර**

පාරම්පරික ආයුර්වේද රෝහල

කොතරම් ප්‍රතිකාර කළත් සුවයක් නැද්ද?

❖ අංශභාග
❖ ආතරයිටිස් ❖ තුනටිය අමාරු
❖ හන්දි වේදනා





ස්ථිරවම සුවකරගන්න...

නේවාසික හා බාහිර රෝගී සත්කාර සමඟින් ඉතාමත් කාරුණික උපස්ථාන සේවය

රජයේ පිළිගත් පාරම්පරික විශේෂ පළපුරුදු වෛද්‍යවරුන් හා වැනලින් සේවා

අමරසිංහ වෙද මැදුර
පාදුක්ක පාර, හොරණ
034 314 5600 | 074 184 4841 | 074 184 4841
Amarasinghe Weda Medura | amarasinghewedamedura.lk

HEALTHSERVE
Health Consultancy

ලෝකයේ ඉතා වේගයෙන් දියුණුවෙමින් පවතින මැද පෙරදිග රටක සෞඛ්‍යය ක්ෂේත්‍රයේ රැකියාවක් කිරීමට බලාපොරොත්තුවෙන් සිටින ඔබ සඳහාමයි.!

මැයි මස 12, 13, 14 හා 15 යන දිනයන්හීදී
Healthserve Health Consultancy අපි එනවා ලංකාවට.

❖ මැද පෙරදිග හෙද රැකියා සඳහා අවශ්‍යය බලපත්‍ර ලබාගන්නේ කෙසේද?
❖ සුදුසුකම් සහ පළපුරුද්ද මත අයදුම් කල හැකි බලපත්‍ර මොනවාද?
❖ බලපත්‍ර ලබා ගැනීම සඳහා වන Prometric Exam සඳහා සාර්ථකව මුහුන දෙන්නේ කෙසේද?
❖ බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව නිවැරදි අයදුම්පත් (CV) සකස් කර රැකියා සඳහා අයදුම් කරන්නෙ කෙසේද?




ආදී ගැටලු රැසකට සජීවී පිළිතුරු දීමට අපි එදාට ඔබ හා සම්බන්ධ වනවා.

දැන්ම අපගේ පහත WhatsApp අංකය වෙත කෙටි පණිවිඩයක් එවා නොමිලේ ලියාපදිංචි වන්න.

ප්‍රථම ලියාපදිංචි වන්නන් 100 හට විශේෂ වට්ටමක්.



+971 50 272 0059
info@healthserve.ae
www.healthserve.ae
No. 332, Sultan Business Center, Oud Metha, Dubai, UAE



**ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න යනු විද්‍යාත්මකව සහ කලාත්මකව පැමිණිල්ල මෙහෙයවීමට නම් දරා ඇති විශිෂ්ටයෙකි. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී ආන්දෝලනාත්මක නඩු රැසක පැමිණිල්ල මෙහෙයවීමට ඔහු දායක වී ඇත. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදා ගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු විසින් රචිත 'යළි මැවෙන අපරාධයක්' කෘතියේ සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ. ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න නීතිපති දෙපාර්තමේන්තුවෙන් පසුගිය වසරේදී සමුගත්තේ ජ්‍යේෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයකු ලෙස කටයුතු කරමින් සිටියදීය. නීතිය පිළිබඳව විවිධ කණ්ඩායම් දැනුවත් කිරීමටද හෙතෙම පසුබට නොවෙයි. හුදු අපරාධ විස්තරයකින් ඔබ්බට ගොස් යම් නෛතික දැනුමක් පාඨකයාට ලබාදීමේ අරමුණින් ලියැවෙන මෙම ලිපියද ඔහුගේ මග පෙන්වීම, දැනුවත් කිරීම යටතේ සකස් වූවකි. මේ එවැනි ලිපි මාලාවක අටවැන්නයි.**

# මැරුණු මනුස්සයාගේ අම්මා අඬන විදිය පෙන්නුවොත් තමයි චැනල්වල රේටින්ග්ස් වැඩිවෙන්නෙ

ප්‍රසුගිය දිනෙක අපූරුවට රෙදි පිළි අන්දවා ඇසුරුමක බහාලූ බිළිඳකු දුම්රිය වැසිකිළියක දමා ගොස් තිබියදී හමුවිය. එය මෙරට විද්‍යුත්, මුද්‍රිත මෙන්ම සමාජ මාධ්‍යවලද ප්‍රධාන ප්‍රවෘත්තිය බවට පත්වන්නට වැඩි වෙලාවක් ගියේ නැත. දරුවාගේ ඡායාරූපය හැමතැනකම පැතිර ගියේ උණු කැවුම් විකිණෙනවා මෙනි.

**"අනේ අපොයි, ෂෝක් දරු පැටියා."**

**"මොන හිතකින් දාලා ගියාද මන්දා."**

**"ළමයි මෙහෙම විසි කරලා යන උන් අම්මලාද?"**

**"මොනවා වුණත් නොමරා බේරපු එකත් මදෑ."**

විවිධ පුද්ගලයන්ගේ ප්‍රතිචාර විවිධ විය. එමෙන්ම දරුවාගේ ඡායාරූපය සමඟ ලියැවුණු කවි ගී ද දහස් ගණනින් එහා මෙහා හුවමාරු වුණේය.

මේ අතරතුරයි දරුවාගේ දෙමාපියන් සොයා කඩිනමින් පොලිස් පරීක්ෂණ ආරම්භ වුණේ. සියලුදෙනාට අවැසි වී තිබුණේ දරුවාගේ මව, පියා කවුරුන්ද යන්න දැනගැනීමටයි. ඒ ඕපාදූපය සෙවූ සියලුදෙනාගේ බලාපොරොත්තු සඵල කරමින් වැඩි කාලයක් ගතවීමට මත්තෙන් දරුවාගේ මව සහ පියා අත්අඩංගුවට ගැනීමට පොලිසිය සමත් විය. වැඩි හොඳට දෝ පොලිසිය මව යැයි කියන තැනැත්තිය රැගෙන එන්නට යන ගමනට මාධ්‍යකරුවන්ද එක්කාසු කරගත්තේය. පොලිසියට රැගෙන විත් ඇයගෙන් ප්‍රශ්න කෙරුණේද කැමරා ඉදිරිපිටයි. දරුවාගේ පියා පෞද්ගලික විශ්වවිද්‍යාලයක ඉගෙනගන්නා අයෙකු බවද හෙළි විය. ඒවා රූපවාහිනී නාලිකාවලට උණුසුම් පුවත්ය. සමාජ මාධ්‍ය හරහා සියල්ල බෙදී යාමටද වැඩි වේලාවක් ගියේ නැත. පොලිසියේ විභාගයෙන් අනතුරුව මතු වූයේ ප්‍රවෘත්ති බැලූ ජනයා සහ සමාජ මාධ්‍යවල සැරිසරන්නන්ගේ නිගමන සහ තීන්දුය.

**"ළමයෙක් හම්බවුණ ගමන් ඇවිදින ලස්සන."**

**"අම්මා ඩෙනිමකුත් ඇඳලා."**

**"ජේනවා නේද ප්‍රයිවට් කැම්පස්වල එවුන්ගේ වැඩ."**

**"ඕකුන්ට දෙන්න ඕනෙ රජ කාලෙ දඬුවම්."**

දරුවකු අතහැර දමා යාම දණ්ඩ නීති සංග්‍රහයට අනුව දඬුවම් ලැබිය යුතු වරදකි. එනිසා වරදකරුවන් කවරෙකු වුවද ඊට නිසි දඬුවම් හිමි විය යුතුය. එහෙත් ඒ සඳහා නිසි ක්‍රියාදාමයක් පවතී. නඩු අසන්නේ අධිකරණය මිස පොලිසිය නොවේ. තීන්දු දීමටද අධිකරණයට මිස ජනතාවට අයිතියක් නැත.

අනෙක් අතට මෙවැනි සිදුවීමකට මාධ්‍ය ඔස්සේ මේ තරම් ප්‍රචාරයක් දිය යුතුද? ඇමරිකානු ලේඛකයකු වන වෝල්ටර් ලිප්මන් වරක් මෙසේ පවසා තිබේ.

**"ශිෂ්ට සම්පන්න ලෙස ගත කළ කාලයට වඩා වනචාරීන් ලෙස මිනිසුන් ගත කළ සමය ඉතා දීර්ඝය. ඔවුන් පූර්ණ ශිෂ්ටත්වයට පත් වී ඇද්දැයි සැක සහිතය. ගුරුත්වාකර්ෂණ බලය මෙන් ආතතිය, පීඩාව, නොසැලකිල්ල සහ වරදේ බැඳීමට පෙළඹවීම යන කාරණා ඇති විට මුල් ගති ලක්ෂණ දෙසට නැවත හැරී යාමට රුචිකත්වයක් තවමත් ඔවුන් තුළ ඇත."**

ඔහු පවසා ඇති ආකාරයට අදාළ වටපිටාව සැකසෙන්නේ නම් වනචාරී ගති මතු කරගැනීමට මිනිසා නිතැතින්ම පෙළඹෙයි. කුණු රසයට ගිජුවීමද එහිම දිගුවක් බව ජනාධිපති නීතිඥ සරත් ජයමාන්නගේ අදහසයි.

"කවුරු හරි මැරුණම ඒ මරණයේ ලේ දකින්න අපි හරි ආසයි. මියගිය පුද්ගලයාගේ අම්මා අඬන විදිය පෙන්නුවොත් තමයි චැනල්වල රේටින්ග්ස් වැඩි වෙන්නෙ. කාන්තාවක් දූෂණය වුණ පුවතක් ප්‍රචාරය වෙද්දී කී දෙනෙක් රූපවාහිනිය ඉදිරියට යනවද? කට ඇරගෙන බලාගෙන ඉන්නෙ. ඒක නාටකයක් වගේ. ඒ අය හරි ආසයි දූෂණය වුණ කෙනාගෙ අනන්‍යතාව, දූෂණය වුණ විදිය, ඒ තැනැත්තිය ඇඳ පැළඳගෙන සිටි ආකාරය වගේ දේවල් දැනගන්න. ඒ ගැන ලොකු කුතුහලයක් තියෙනවා. මිනිස් පෞරුෂයේ තියෙන මේ දුර්වල ගතිගුණය මං හිතන විදියට මාධ්‍ය ආයතන විශ්ලේෂණය කරලා, සමීක්ෂණය කරලා හොයාගෙන තියෙනවා. ඒ නිසා තමයි මේ වගේ හරසුන් ප්‍රවෘත්තිවලට ඔවුන් මූලිකත්වය දෙන්නෙ. රටේ නිර්මාණාත්මක සහ අධ්‍යාපනික වටිනාකමක් ඇති දේ සඳහා මාධ්‍ය මගින් කාලය වෙන් නොකරන තරම්."

ඉහත සිදුවීම සම්බන්ධයෙන්ද පොලිසියේ සහ මාධ්‍යයේ හැසිරීම විමසා බැලිය යුතුය. එක් අතකින් එම සැකකාරිය හෝ සැකකරු තමන්ගේ ඥාතියකු වූයේ නම් පොලිස් නිලධාරීන් මෙලෙස ප්‍රසිද්ධියේ මාධ්‍ය ඉදිරිපිට ඔවුන්ගෙන් ප්‍රශ්න කරයිද? මාධ්‍ය විසින් ඒවා ප්‍රමුඛ ප්‍රවෘත්ති ලෙස පළ කරාවිද? එම සිදුවීමේ නෛතික තත්ත්වය සහ මාධ්‍ය වාර්තා ගැන ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න අදහස් පළ කළේ මෙලෙසිනි.

"දරුවකු අතහැර දැමීම දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක්. අපේ රටේ මාධ්‍ය මේ සිදුවීම තලු මර මර පෙන්වමින් ජනතාවගේ මනස හදනවා. දරුවාගේ මව සහ පියා යැයි කියන අයගේ අනන්‍යතාව හෙළිවන අයුරින් ප්‍රවෘත්ති පළ කළා. ඒ අම්මටත් නීතියේ රැකවරණයක් තියෙනවා. කවදහරි සාධාරණ නඩු විභාගයකට පෙනී සිටීම ඇගේ අයිතියක්. ඒත් මාධ්‍ය මගින් මේ අම්මාගෙ චරිතය කුරිරු විදියට ඝාතනය කළාම නීතියට තියෙන ගරුත්වය මොකක්ද? ඇයට දඬුවම් දීම වෙනම කරුණක්. ඒ සඳහා වෙනම ක්‍රියා පටිපාටියක් තියෙනවා.

අපි මේ විදියට හිතමු. යම් හෙයකින් අතහැර ගිය පසු දරුවා මරණයට පත්වූයේ නම් අතහැර ගිය තැනැත්තියට විරුද්ධව මිනීමැරීමේ චෝදනා එල්ල වෙනවා. ඒ නඩුව ජූරි සභාවක් ඉදිරියේ විභාග වුණා කියලා අපි හිතමු. නඩු විභාගයට කලින්ම අම්මාව මාධ්‍ය මගින් වරදකාරිය කරනු ලැබීමේ මතය එක්ක තමයි ජූරි සභාව අධිකරණයට එන්නෙ. යම් හෙයකින් මෘත ශරීරය පරීක්ෂා කරන වෛද්‍යවරයා පිළිගන්නවා දරුවා මියගියේ ස්වභාවික හෘදයාබාධයකින් කියලා. ඒත්, ජූරි සභා සාමාජිකයින්ගේ මතය අනුව ඇතැම්විට අර සැකකාරියට සාධාරණයක් ඉටු නොවීමට ඉඩ තිබෙනවා. අධිකරණයකින් නඩුවක් විභාග කර තීන්දුව දෙන තෙක් සැකකරුවන්ට අයිතිවාසිකම් තියෙනවා. එහෙත් මාධ්‍ය මගින් තීන්දු දෙන තරමට අපි පිරිහිලා තියෙන්නෙ මාධ්‍යවල තියෙන හිස්බව හින්ද සහ මේ රටේ මිනිස්සු කුණු රසයට කැමති හින්ද. ඒ වගේම සැකකාරියගේ කීම මත දරුවාගේ පියා යැයි හෙළිකරන තැනැත්තා දරුවාගේ පියා නොවන බව ඩී.එන්.ඒ. පරීක්ෂණයකින් ඔප්පු වෙන්නත් පුළුවන්. ඒත්, දැනටමත් මාධ්‍ය මගින් කළ හෙළිදරව්ව නිසා ඔහුගේ අනාගතයට බලපෑමක් නොවන්නේද? මෙහි බරපතළම තත්ත්වය තමයි කුඩා දරුවාගේ අනන්‍යතාව හෙළි කිරීම. ඒ දරුවා තමයි අපරාධ වින්දිත තැනැත්තා. එයාටත් අයිතිවාසිකම් තියෙනවා. 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත මගින් ඒවා තහවුරු කර තිබෙනවා. එය සකස් කර තියෙන්නේ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව. ඒත් මෙහි අන්තර්ගතය ගැන මේ රටේ සිටින බහුතරයකට අවම දැනුමක් හෝ නෑ. අපරාධ වින්දිතයින්ගේ ගෞරවනීයත්වය, අභිමානය, පෞද්ගලිකත්වය ආරක්ෂා වන විදියට කටයුතු කරන්න කියලා මේ පනතේ පැහැදිලිව තියෙනවා. දැන් මේ දරුවාගෙ පින්තූරය මාධ්‍ය මගින් හෙළි කළාම, මේ රටේ තියෙන ආකල්ප එක්ක ඒ දරුවාගෙ අනාගතය මොන වගේ වෙයිද?"

මෙවැනි සිදුවීම් ගණනාවකදී පසුගිය කාලය පුරා මාධ්‍ය හැසිරුණේ මේ ආකාරයටයි. උදාහරණයක් ලෙස යාපනය ප්‍රදේශයේ පාසල් දැරියක දූෂණය කොට ඝාතනය කිරීමේ සිද්ධියේදී ඇගේ අනන්‍යතාව හෙළි කෙරිණ. යම් හෙයකින් ඇය දූෂණයකට ලක්ව ජීවත් වූයේ නම් යුක්තිය ඉටුකරගැනීම වෙනුවෙන් යනවිට ඈ දෙස කිසිවකුත් වපරැසින් නොබලාවිද? ඇගේ පවුලේ අය කෙතරම් අපහසුතාවකට පත්වනු ඇතිද? කොටදෙණියාව ප්‍රදේශයේ දැරියක පැහැරගෙන ගොස් අපයෝජනය කර ඝාතනය කිරීමේ සිදුවීමේදීද මාධ්‍ය විසින් ඇගේ නම්, ගම්, ඡායාරූප, දෙමාපියන් ආදී සියල්ල ප්‍රචාරය කරනු ලැබීය. එමෙන්ම සිදුවීම සම්බන්ධයෙන් සැක කරනු ලැබූ විවිධ තැනැත්තන් ගැන තොරතුරු හෙළි කිරීමට මාධ්‍ය කටයුතු කළේය. මුලදී සැක කරනු ලැබූවන් සිද්ධියට සම්බන්ධ නැති බව හෙළි වුවද ඒ වනවිට ඔවුන් අපරාධකරුවන් ලෙස හංවඩු ගැසී අවසන්ය. මෑතකදී තරුණියක ඝාතනය කර හිස කොටස අතුරුදන් කර සිරුර ගමන් බෑගයක දමා ගිය සිදුවීමට ප්‍රචාරය දුන්නේද එවැනිම පහත් අයුරිනි. ඇගේ නම, ගම, ඡායාරූප මෙන්ම ඥාතීන්වද හෙළිදරව් කෙරිණ. ඇය ඝාතනය කළ බවට සැක කෙරුණු තැනැත්තා පසුව සියදිවි නසාගත්තේය. ඔහුගේ තොරතුරු පමණක් නොව, ඔහුගේ පවුලේ සාමාජිකයින්ගේ තොරතුරුද සමාජ මාධ්‍යයේ පළවිය.

ශ්‍රී ලංකාවේ පොලිසිය, ප්‍රධාන මාධ්‍ය සහ සමාජ මාධ්‍ය මෙසේ හැසිරෙද්දී අසල්වැසි ඉන්දියාවේ උදාහරණයක් ඉදිරිපත් කිරීම වටින්නේය. එරට වෛද්‍ය ශිෂ්‍යාවක සමූහ දූෂණයකට ලක්ව ඝාතනය විය. පොලිසිය පරීක්ෂණ පැවැත්වූයේ මාධ්‍ය රැගෙන ගොස් නොවේ. අපරාධයට ගොදුරු වූ තැනැත්තියගේ අනන්‍යතාව පිළිබඳ කිසිඳු තොරතුරක් පොලිසිය බාහිර පාර්ශවයන්ට ලබා දුන්නේ නැත. එරට මාධ්‍යද ඇගේ ඡායාරූප හෝ දෙමාපියන් සමඟ සම්මුඛ සාකච්ඡා ආදිය පළ නොකළේය. ලිංගික අඩන්තේට්ටම් සම්බන්ධ වින්දිතයින්ගේ නම් ජනමාධ්‍ය මගින් හෙළි කිරීම තහනම් කරමින් එරට පවතින නීති, අදාළ ආයතන පිළිපැදීම ඊට හේතුවයි. 'නිර්භයා' යන අන්වර්ථ නාමයෙන් ඇයට අදාළ සිදුවීමේ ප්‍රවෘත්ති පළ කෙරිණ. ඇගේ තෙවර්ෂ පූර්ණ සැමරුමේදී දෙමාපියන් විසින් සත්‍ය නම හෙළිදරව් කරන තෙක් ඇගේ අනන්‍යතාව සැඟව තිබිණ.

මෙවැනි තත්ත්වයකදී හැසිරිය යුතු ආකාරය පිළිබඳ ශ්‍රී ලංකාවේ නීතියක් නැතිද? නොඑසේ නම් ඒවා ක්‍රියාත්මක නොවන්නේද? ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න පෙන්වා දෙන්නේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සහ දණ්ඩ නීති සංග්‍රහයට ගෙනෙන ලද 1995 අංක 22 දරන සංශෝධනයෙන්ද වින්දිතයින්ගේ ආරක්ෂාව තහවුරු කර ඇති බවයි. 2015 අංක 04 දරන වින්දිතයින් ආරක්ෂා කිරීමේ පනත වඩා ප්‍රබලව ඉදිරිපත් කර තිබේ.

## දරුවා දූෂණය වුණාට පස්සෙ උසාවියට ගිහින් විනිසුරුතුමා දඬුවම් කරනකන් බලන් ඉන්න එක හරිද?



## සැකකාරියගේ කීම මත දරුවාගේ පියා ලෙස හෙළිදරව් කරන තැනැත්තා පියා නොවන බව ඩී.එන්.ඒ. පරීක්ෂණයකින් ඔප්පු වෙන්නත් පුළුවන්. ඒත්, දැනටමත් මාධ්‍ය මගින් කළ හෙළිදරව්ව නිසා ඔහුගේ අනාගතයට බලපෑමක් වෙලා



"අපරාධ වින්දිත තැනැත්තියගේ අනන්‍යතාව හෙළි කරන එක කිසිම හිරිකිතයක් නැතුව කරන්නෙ මේ රටේ නීතිය බලධාරීන් හරියට ක්‍රියාත්මක කරන්නෙ නැති නිසා. රේටින්ග්ස්වලින් අංක එක වෙන්න බලාගෙන මේවා දානකොට අපේ රටේ සදාචාරයට මොකද වෙන්නෙ? මේ රටේ හරයන් මොනවද? මේ වැරැද්ද කරන අයට එරෙහිව නීතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවන නිසයි මේක දිගින් දිගටම වෙන්නෙ. මෙරට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 106 ව්‍යවස්ථාවෙන් කියනවා ලිංගික කාරණාවලට අදාළ නඩු විභාග කරද්දී ඊට අදාළ නොවන තැනැත්තන් ඉවත් කර විභාග කරන්න පුළුවන් කියලා. ඊට අමතරව 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත පරිදි අධිකරණයේ අවසරයකින් තොරව ලිංගික අතවරවලට අදාළ නඩු කටයුත්තේ යම් කරුණක් මුද්‍රණය කරන හෝ පළ කරන තැනැත්තෙකුට එරෙහිව වසර දෙකක සිර දඬුවම් සහ දඩයක් හෝ ඒ දෙකම ලබා දෙන්න පුළුවන්. ඒ වගේම 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතින් මේ නීති තවත් පුළුල් කර තියෙනවා. යම් සිදුවීමකට අදාළව විමර්ශන කරන්නෙ පොලිසිය. එයාලට බැහැ අපරාධ වින්දිතයින්ගේ අනන්‍යතාව ගැන වෙනත් පාර්ශවයකට තොරතුරු දෙන්න. කලින් කියපු පනතට අනුව අපරාධ වින්දිතයා, සාක්ෂිකරු හෝ ඔත්තුකරුගෙ අනන්‍යතාව පිළිබඳ තොරතුරු හරි ඉන් කොටසක් හරි තුන්වන පාර්ශවයකට ලබාදෙන හෝ ප්‍රසිද්ධියට පත්කරන වගේම ඒ තොරතුරු හරි ඉන් කොටසක් හරි බෙදා හැර අපරාධ වින්දිතයා, සාක්ෂිකරු හෝ ඔත්තුකරුගේ ජීවිතය අනතුරට ලක්කරන පුද්ගලයා කරන්නේ වරදක්. ඒ අයව අවුරුදු හතකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් පහළොස් දහසක දඩයකට යටත් කරන්න පුළුවන්. පනතේ 25 (3) වගන්තියට අනුව අධිකරණයේ වගකීමද පෙන්වා දෙනවා. නඩු කටයුත්ත රහසිගතව පැවැත්වීම වගේම අදාළ පුද්ගලයන්ගේ අනන්‍යතාව හෙළි කිරීම වළකාලීම වෙනුවෙන් මාධ්‍ය ආයතන, මාධ්‍යකරුවන් හෝ වෙනත් නිශ්චිතව සඳහන් කළ තැනැත්තන්ට විධානය කරන්නත් අධිකරණයට බලය තියෙනවා. ඒ වගේම අදාළ අපරාධය පියවරෙන් පියවර විස්තර කර පළකිරීම වැළැක්වීමට නියෝග කරන්නත් අධිකරණයට පුළුවන්."

මෑතකදී මෙරට ප්‍රසිද්ධ ක්‍රීඩකයකුට ඕස්ට්‍රේලියාවේදී ලිංගික කාරණාවක් සම්බන්ධයෙන් චෝදනා එල්ල විය. එහෙත් එරට මාධ්‍ය සිදුවීම වාර්තා කළේ පවතින නීතියට යටත්වයි. බොහෝ රටවල අපරාධ වින්දිතයින් අධිකරණයට රැගෙන ඒමද සිදු නොවේ. ඔවුන්ට අධිකරණයට පරිබාහිර ස්ථානයක සිට නඩු කටයුත්ත වෙනුවෙන් පෙනී සිටීමට ඉඩ සලසා ඇත. එම තැනැත්තාගේ මානසිකත්වය ඉහළ මට්ටමක පවත්වා ගැනීම එහි අරමුණකි. එවැනි නීති මෙරටටද හඳුන්වා දී තිබේ. එහෙත් ඒවා ක්‍රියාත්මක නොවීම ගැටලුවකි.

පවත්නා නීතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම මෙන්ම මාධ්‍ය සහ ජනතාවගේ ආකල්ප සහ දැනුමද වර්ධනය විය යුතුය. මෙරට ජනතාවගේ නෛතික මෙන්ම ලිංගික සාක්ෂරතාව දියුණු නොවීම දැඩි ගැටලුවකි. අනෙක් අතට අපේ දොරකඩින් එපිට තියෙන තාක් ඕනෑම සිදුවීමක් අපිට රස ආකරයක් වුවද දොරින් මෙපිටදී එය මහා ඛේදවාචකයක් විය හැකිය. එනිසා තමන්ගේ නිවසට ඒමට පෙර සිට ඒවා ගැන දැනුමෙන්, ආකල්පවලින් වෙනස් වීම තම තමන් පෞද්ගලිකව කළ යුතු කරුණකි. එමෙන්ම සිය දරුවන් ගැන දෙමාපියන් මීට වඩා වගකීම් සහගත විය යුතු බව ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න පෙන්වා දෙයි.

**"දරුවෙක් අපචාරයට ලක්වුණාට පස්සෙ දෙමාපියන් පොලිසියට යන්නෙ. ඊළඟට උසාවියට ගිහින් බලාගෙන ඉන්නවා විනිසුරුතුමා දඬුවම් කරයි කියලා. කොහේවත් ඉන්න විනිසුරුතුමෙක් දඬුවම් කරනකං ඇයි දෙමව්පියන් බලන් ඉන්නෙ? තමන්ගෙ අවුරුදු දහතුනේ දුව කැමරා ශිල්පියෙකු සමඟ ෆොටෝ ෂූට් එකකට යද්දී, මේකප් ආටිස්ට් ගාවට යද්දි, ෆිල්ම් එකකට යනවා කියලා යද්දි ඇයි ඒ අය බැලුවෙ නැත්තෙ? ඇයි දරුවන්ව තනියෙන් දාලා යන්නෙ? ඇයි තමන්ගෙ පහසුවට තැන් තැන්වලට දරුවන් යවන්නෙ? පොලිසියටයි උසාවියටයි බෑ මේ රටේ අපයෝජන සම්පූර්ණයෙන් නැති කරන්න. ඒ නිසා දෙමාපියන්, වැඩිහිටියන් මීටත් වඩා සැලකිලිමත් වෙන්න ඕනෙ."**

ලංකාවේ පළවැනි ගුවන්විදුලි විකාශනය සිද්ධවෙලා තියෙන්නේ 1923දී. ඔය කාලේ ලංකාව පාලනේ කළේ සුද්දොනේ. යුද්ධෙදී යටත් කරගත්තු ජර්මානු සබ්මැරීන් එකක රේඩියෝ උපකරණ කොටස් යොදාගෙනයි ඔය මුල්ම පටිගත කිරීම කරලා තියෙන්නේ.

1949දී බ්‍රිතාන්‍ය විසින් ඒ උපකරණ කට්ටල ලංකාවේ රජයට බාරදීලා. ලංකාවේ පළවැනි ගුවන්විදුලිය 'රේඩියෝ සිලෝන්' පටන්ගත්තේ ඊටපස්සේ. ඒ කාලේදී රේඩියෝ විකාශනය වුණේ AM තරංග මාධ්‍යයෙන්.

1993දී ලංකාවට FM තරංග හඳුන්වාදුන්නා. පස්සේ 1999දී වගේ පෞද්ගලික ගුවන්විදුලි විකාශනයට අවසර ලැබුණා. ඉතින් එදා ඉඳලා අද වෙනකල් හැදුනු FM නාලිකා ගාණ අනන්තයි. හැබැයි ඒ අතරින් මතකයේ රැඳුණු නාලිකා ප්‍රමාණය අතේ ඇඟිලි ගාණටත් අඩුයි.

රේඩියෝවලට වගේම මිනිස්සුන්ටත් සංඛ්‍යාත තියෙනවා කියනවනේ. කන පිනවන සිත සනහන දේවල් අහන්න අහන්න සංඛ්‍යාතය ධනාත්මක වෙනවලු. අර කිව්වා වගේ ඒ සංඛ්‍යාතය වැඩි කරන  චැනල් එහෙමනම් ටිකක් අඩුයි.

2009 මාර්තු 29 ලංකාවේ ඔය කිව්වා වගේ FM නාලිකාවක් පටන්ගත්තා. භාවනාවක් වගේ කනට මිහිරි නිසා ශ්‍රාවකයන් මේ චැනල් එක ආදරෙන් වැළඳගත්තා. ඉතින් ඒ ආදරේ එක්ක මේ FM නාලිකාව අද වෙනකොට අවුරුදු 14ක ලොකු දුරක් ඇවිල්ලා. නිකන් නෙමෙයි ලංකාවේ අංක එකේ ගුවන්විදුලි නාලිකාව විදියට.

ඔව්. ඒ FM දෙරණ. ඔබේ ආදරණීය ගුවන්විදුලි නාලිකාව FM දෙරණ අද ඔවුන්ගේ 14 වැනි සංවත්සරය සමරනවා. ඒ නිසාම අද 'ධරණී' කවරය හැඩවෙන්නේ FM දෙරණ නාලිකාවේ සුන්දර නිවේදිකාවන්ගෙන්.

# FM දෙරණට සම්බන්ධ වුණු එක තමයි ජීවිතේ ගත්තු හොඳම තීරණේ

**ඌෂා ගයානි අල්විස්**
**ජ්‍යේෂ්ඨ පරිපාලන කළමනාකාර FM දෙරණ**





2009දී නාලිකාව පටන්ගත්තු දවසේ මුල්ම ප්‍රෝග්‍රෑම් එක කළ නිවේදිකාව එක්ක අපි FM දෙරණ ආපු ගමන ගැන කතා කළා. නිවේදිකාවක් විදියට ගමන පටන්ගත්තු ඇය අද FM දෙරණ නාලිකාවේ ජ්‍යේෂ්ඨ පරිපාලන කළමනාකාරවරියයි. ඇය ඌෂා ගයානි අල්විස්.

FM දෙරණේ 1 ඉඳලා 4 වෙනකල් යන 'අපූර්වා' ගුවන්විදුලි නාට්‍යයේ නිෂ්පාදිකාව ඇය. ටෙලිනාට්‍ය ඉදිරිපත් කරන ආදරණීය හඬ ඌෂාගේ. ඒ වගේම  FM දෙරණේ නිතරම ඇහෙන 'FM දෙරණ ආදරේ නිසයි අහන්නේ' තේමා පාඨයෙන් ඇහෙන්නෙත් ඇගේ හඬයි.

"උසස් පෙළින් පස්සේ මම ගුවන්විදුලි නාලිකාවක මාකටින් පැත්තේ ජොබ් එකකට ඉන්ටර්වීව් ගියා. ඉන්ටර්වීව් එකට ගියාට මොකද මාකටින් පැත්තේ ජොබ් නැහැ, නිවේදිකාවන්ට නම් වේකන්සි තියෙනවා, කැමති නම් වොයිස් එකක් දීලා යන්න කියලා ඒ අය මට කිව්වා. මමත් ඉතින් ඒ අය කිව්ව විදියටම කළා. පස්සේ ඒ ආයතනයෙන් මාව ගුවන්විදුලි නිවේදිකාවක් විදියට තෝරගත්තා. එතැන මාස කිපයක් වැඩ කළා. පස්සේ ලංකාවේ ජනප්‍රිය FM නාලිකාවක් එක්ක සම්බන්ධ වුණා. ඔතන වැඩ කර කර ඉන්දැද්දි දවසක් චාමික සමරකෝන් කතා කරලා දෙරණෙන් අලුත් FM  එකක් පටන්ගන්න යනවා ඒකට එන්න කැමතිද කියලා මගෙන් ඇහුවා. මම හිටියේ ටිකක් ප්‍රසිද්ධ නාලිකාවකනේ. ඉතින් පටන් අරගෙනවත් නැති නාලිකාවකට යන්න බැහැයි කියලා හිතුණු නිසා මුලින්ම මම ඒ අවස්ථාව ප්‍රතික්ෂේප කළා. ඔහොම මාස දෙකක් විතර යනකොට දෙරණෙන් පටන්ගන්න චැනල් එකට යන්න ඕනේ කියලා එකපාරම මට හිතුණා. පස්සේ ඉතින් මම FM දෙරණ එක්ක සම්බන්ධ වුණා."

ඌෂා FM දෙරණ එක්ක සම්බන්ධ වෙනකොටත් නාලිකාව පටන් අරගෙන තිබුණේ නැතිලු. ඉතින් මාර්තු 29 නාලිකාව පටන්ගත්තු දවසේ ආරම්භක වැඩසටහන කරන්න ඌෂාට අවස්ථාව ලැබිලා.

**"ඒ වැඩසටහන FM දෙරණට සමගාමීව TV දෙරණෙත් විකාශය වුණා. අවුරුදු 14කට පස්සේ ආපස්සට හැරිලා FM දෙරණේ පළවැනි ප්‍රෝග්‍රෑම් එක කළා කියලා හිතද්දි ඒ සතුට කියාගන්න මට වචන නැහැ."**

FM දෙරණට සම්බන්ධ වෙච්ච මුල් කාලෙදි ඇගේ පෞද්ගලික ජීවිතේට අභියෝග කිහිපයක්ම ආවලු. ඒ දේවල් කළමනාකරණය කරගන්නත් ආයතනයෙන් ඇයට ලොකු සහයෝගයක් ලැබිලා.

"දෙරණට සම්බන්ධ වෙලා අවුරුද්දකින් මම විවාහ වුණා. තවත් අවුරුද්දකින් විතර මම ප්‍රෙග්නන්ට් වුණා. මට ලැබුණේ නිවුන්නු. බබාලා ලැබුණට පස්සේ මට ගොඩක් අමාරු වුණා. මාස තුනක් නැගිට්න්න බැරිව හිටියා. සාමාන්‍යයෙන් එහෙම වෙද්දි රස්සාව ගැන හිතට බයක් දැනෙනවනේ. හැබැයි මට කිසිම වෙලාවක එහෙම බයක් දැනුණේ නැහැ. ඔෆිස් එකේ හැමෝම නිතරම කතා කර කර මාව බැලුවා. ඒ දේවල් මට කවදාවත් අමතක වෙන්නේ නැහැ."

ගොඩක් කාන්තාවන්ට රැකියාව නිසා පෞද්ගලික ජීවිතේ කටයුතු කළමනාකරණය කරගන්න අමාරු වෙනවනේ. හැබැයි පීඩනයක් නැතිව රැකියාවයි පෞද්ගලික ජීවිතයයි කළමනාකරණය කරගන්න ආයතනයෙන් ඇයට වගේම අනිත් කාන්තාවන්ටත් ලොකු සහායක් ලැබෙන බවයි ඌෂා කිව්වේ.

**"ආයතනය පටන්ගන්නකොට එකතුවුණු සාමාජිකයෝ 6ක් වගේ තමයි දැන් ඉතිරි වෙලා ඉන්නේ. ගොඩක් ඉන්නේ ඊටපස්සේ ආපු කණ්ඩායම්වල සාමාජිකයන්. හැබැයි පළවැනි ටීම් එකේ දෙවැනි ටීම් එකේ කියලා අපි අතර බෙදීමක් නැහැ.**

**අපේ ටීම් එකේ නිවේදිකාවෝ 10ක් ඉන්නවා. අර ගෑනු ගෑනුන්ට ඊර්ෂ්‍යයි කියලා කතාවක් තියෙනවනේ. හැබැයි අපේ කණ්ඩායමේ නම් ඇත්තටම එහෙම දේවල් නැහැ**



හැමෝම සහෝදරයෝ වගේ එකමුතුව වැඩ කරනවා. අපේ ටීම් එකේ නිවේදිකාවෝ 10ක් ඉන්නවා. අර ගෑනු ගෑනුන්ට ඊර්සියයි කියලා කතාවක් තියෙනවනේ. හැබැයි අපේ කණ්ඩායමේ නම් ඇත්තටම එහෙම දේවල් නැහැ."

උෂා අනිත් ආදරණීය නිවේදිකාවන්ගේ නමුත් මේ විදියට මතක් කළා.

"නිරෝශිකා නෙරංජී (විධායක වැඩසටහන් නිෂ්පාදිකා/නිවේදිකා), මධුමාලී ජයසිංහ (විධායක වැඩසටහන් නිෂ්පාදිකා/ නිවේදිකා), කේෂිනි ඩිලුනිකා ප්‍රනාන්දු (ජ්‍යේෂ්ඨ විධායක නිවේදිකා/ නිෂ්පාදිකා), අහල්‍යා සෙනවිරත්න (විධායක නිවේදිකා), ඉශාරා දිසානායක (නිෂ්පාදිකා/නිවේදිකා), ගිම්හානී ඉන්ද්‍රචාපා (වැඩසටහන් නිවේදිකා/නිෂ්පාදිකා), ශානිකා තරංගනී (වැඩසටහන් නිවේදිකා/ නිෂ්පාදිකා), ඕශදී සිරිවර්ධන (වැඩසටහන් නිෂ්පාදිකා/නිවේදිකා), දිල්රුක්ෂි සෙනවිරත්න (ජ්‍යේෂ්ඨ විධායක වැඩසටහන් නිෂ්පාදිකා/නිවේදිකා)"

ඒ වගේම FM දෙරණේ නිවේදකයන් 18 දෙනාව ආදරයෙන් මතක් කරන්නත් ඇය අමතක කළේ නැහැ.

මේ අවුරුදු 14 ඇතුළෙදි FM දෙරණේ සාර්ථකත්වය වගේම FM දෙරණට ලැබෙන ආදරය ගැනත් අපි උෂාගෙන් අහලා බැලුවා.

"මුලින්ම අපේ සාර්ථකත්වය ගැන කියනවානම් 2021දී තාරුණ්‍යයේ ජනප්‍රියම රේඩියෝ නාලිකාව විදියට ස්ලිම් නීල්සන් සම්මානය ලබාගන්න අපිට පුළුවන් වුණා. L.M.R.B. දත්තවලට අනුවත් ලංකාවේ අංක එකේ රේඩියෝ චැනල් එක FM දෙරණ. FM දෙරණට, මේ නාලිකාවේ නිවේදිකාවෝ විදියට අපිට ලැබෙන ආදරේ නම් මාරයි. අපේ නාලිකාව එක්ක ලොකු ශ්‍රාවක පිරිසක් එකතු වෙලා ඉන්නවා. හිතන්නකෝ වැඩසටහනක ඉන්ට්‍රෝ එකකදී ඒ අයට අපේ හඬේ වෙනසක් දැනුණොත් විනාඩියක් යන්න කලින් අද අසනීපෙන්ද ඉන්නේ කියලා අහනවා. සමහරු අපිව බලන්න ඔෆිස් එක ගාවට එනවා. ඒ හැමෝවම අපි ආදරෙන් පිළිගන්නවා. දිගටම ඒ ආදරෙන් අපිත් එක්ක ඉන්න කියලා අපේ ආදරණීය ශ්‍රාවකයන්ට මේ වෙලාවෙදි කියන්න ඕනේ. FM නිවේදකයෝ කියන්නේ මිනිස්සුන්ගේ මානසික සතුට වෙනුවෙන් සේවය කරන පිරිසක්. ඉතින් මට දැනෙන විදියට මේක තමයි මේ ලෝකේ වාසනාවන්තම රස්සාව. FM දෙරණට එකතුවුණු නිසා ඒ වාසනාව දෙගුණ තෙගුණ වුණා. අලුත් අභියෝගයක් බාරගන්න තිබුණු අකමැත්තට මුලදි බැහැ කිව්වට FM දෙරණට සම්බන්ධ වුණු එක තමයි මම මගේ ජීවිතේ ගත්තු හොඳම තීරණේ."

**කාන්තාවන් වෙනුවෙන් FM දෙරණෙන් කරන විශේෂ වැඩසටහන් එහෙම තියෙනවද?**

"ඔව්. 1-4 වෙනකල් යන 'අපූර්වා' ටෙලිනාට්‍ය එක්ක වැඩිපුරම එකතුවෙන්නේ කාන්තාවෝ. වැඩසටහන අතරතුරේදි ප්‍රශ්න අහලා ඒවාට තෑගි දෙනවා. තෑගි කියන්නේ ගෙදරට අත්‍යවශ්‍ය කළමනා, දරුවන්ගේ පාසල් උපකරණ, ස්වයං රැකියා අරමුදල් වගේ දේවල්. ඉතින් ඒ දේවලුත් කාන්තාවන්ට වටිනවනේ."

අපූර්වා අහන අයට විතරක් නෙමෙයි මාර්තු 29 සංවත්සරය දවසේ FM දෙරණ අහන අයටත් තෑගි ගොඩක් දිනාගන්න පුළුවන්ලු.

"සංවත්සරය වෙනුවෙන් අපි වැඩසටහන් කිහිපයක්ම ලකලෑස්ති කරලා තියෙනවා. සංවත්සරය වෙනුවෙන් 25 සිකුරාද ඇටෑක් ශෝ එකක් තියෙනවා. ඒ වගේම 26 ඉරිදත් කලාකරුවන් 14 දෙනෙකුගේ සංගීත ප්‍රසංගයක් TV දෙරණට සමගාමීව විකාශය වෙන්න නියමිතයි. 29 සංවත්සරය දවසේ FM දෙරණ අහන අයට පැයෙන් පැයට මුදල් ත්‍යාග දිනාගන්න අවස්ථාවකුත් තියෙනවා ඔන්න."

සංවත්සර විශේෂ වැඩසටහන් ගැන ඒ විදියට මතක් කරපු උෂා ඊගාවට කිව්වේ FM දෙරණේ මුල් ටික ගැන.

**"අද FM දෙරණ ලොකු දුරක් ඇවිල්ලා. මේ ගමනේදී හැමෝටම පේන්න ඉන්නේ අපි වුණාට අපිව දරාගෙන හයිය මුල් ටිකක් අපි පිටිපස්සේ ඉන්නවා. දෙරණ මාධ්‍ය ජාලයේ සභාපති දිලිත් ජයවීර මහතා, දෙරණ මාධ්‍ය ජාලයේ උප සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී ලක්සිරි වික්‍රමගේ මහතා, දෙරණ මාධ්‍ය ජාලයේ අධ්‍යක්ෂිකා වරුණී අමුණුගම මහත්මිය, විධායක අධ්‍යක්ෂක සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී මාධව මඩවල මහතා, දෙරණ නාලිකා සමූහයේ වෙළඳ සහ අලෙවි අධ්‍යක්ෂ තුෂාර පෙරේරා මහතා සහ FM දෙරණ සාමාන්‍යාධිකාරී බණ්ඩාර විජයරත්න මහත්මාවත් මේ වෙලාවෙදි මතක් කරනවා."**

**■ සෙව්වන්දි හෙට්ටිආරච්චි**
**ඡායාරූප - දේවා ජයවර්ධන**




**මහාචාර්ය අත්තනායක එම් හේරත් කියයි**

# ඒ කාලෙ පිරිමි සීගිරියට ගියේ ගල බලන්න නෙවෙයි

පොළොන්නරුව රාජධානියේ පරාක්‍රමබාහු රජ්ජුරුවන්ගේ කාලේ ඉඳලා තියෙනවා සුගලා දේවිය කියලා ඉතාමත් රූමත් තරුණියක්. ඒ කාලේ අහල ගම් හතකවත් ඒ තරම් ලස්සන කාන්තාවක් හිටියේ නෑලු. පෙර පිනකට උපතින් ලැබුණු ලස්සන රූපය නිසා අතුපැලෙන් රජමැදුරට ගියපු ගෑනු ගැන එදා මෙදාතුර අපි ඕනතරම් අහලා තියෙනවානේ. මේ කියන සුගලා දේවියත් අන්න ඒ වගේ කෙනෙක්. ඒ කාලේ රජකම් කරපු ශ්‍රී වල්ලභ රජ්ජුරුවෝ ඇගේ රූපෙට වහ වැටිලා ඇයව අගමෙහෙසිය කරගෙන තියෙනවා. එතැන ඉඳන් සුගලා දේවිය සුගලා බිසව බවට පත්වුණාලු. රජතුමා විතරක් නෙවෙයි ඇගේ ලස්සනට වහවැටුණ රට්ටු පවා ඇයට රජතුමාටත් වැඩියෙන් ගෞරව කළා කියලයි ඉතිහාසයේ ලියැවිලා තියෙන්නේ. කොහොම වුණත් අර කතාවක් තියෙනවානේ කාලෙකට වාසනව ගේන දේවල්ම තවත් කාලෙකදි හෙණේට හිටිනවයි කියලා. සුගලා බිසවටත් වෙලා තියෙන්නෙ ඒ සංතෑසියම තමයි. ශ්‍රී වල්ලභ රජ්ජුරුවන්ගේ රාජ සභාවෙත් ඉඳලා තියෙනවාලු සුගලාගේ ලස්සනට වහවැටුණ ඇමතියො ටිකක්. ආස හිතුණයි කියලා මොකෝ රජාගේ ගෑනිට අත තියන්න පුළුවනැයි. එහෙම වුණහම ගොඩක් වෙලාවට සමහරු කරන්නෙ කන්න බැරි මිදි තිත්තයි කියන එක. මේ ඇමතියො ටික කරලා තියෙන්නෙත් අන්න ඒ වගේ වැඩක්. ඔවුන් කිසිම හේතුවක් නැතුව සුගලා බිසව තමන්ගේ ලස්සන පාවිච්චි කරලා දුරාචාරයේ යෙදෙන තැනැත්තියක් කියලා බොරු ප්‍රචාරයක් යවන්න පටන්ගත්තලු. ඒ විතරක් නෙවෙයි ඇය වෙසඟනක් කියලත් නින්දා අපහාස කරලා තියෙනවා.

ඔය කිව්වෙ තමන්ගේ ලස්සන නිසාම නිරපරාදේ අවලාද කතා අහගන්න සිද්ධවුණ එක ගැහැනියෙකුගෙ කතාවක්. මේක තවත් එකක්.

වීදිය බණ්ඩාර කියන්නේ ඒ කාලේ ඉඳපු අසාහය රණශූරයෙක්නෙ. ඔහුගේ බිරිඳ තමයි සමුද්‍රා දේවිය. සමුද්‍රා දේවියත් කලින් කතාවෙ හිටපු සුගලා බිසව වගේම ඉතාමත් රූමත් තැනැත්තියක්. ඒ කාලේ ලංකාවේ හිටපු ලස්සනම ගැහැනිය සමුද්‍රා දේවිය කියලත් පරංගීන් ඔවුන්ගේ ඉතිහාස පොත්පත්වල ලියලා තියෙනවලු. ඔය අතරේ ඉඳලා තියෙනවා සමුද්‍රාට අසාමාන්‍ය විදියට ආදරේ කරපු එක පරංගි නිලධාරියෙක්. හැබැයි කොයිතරම් උත්සහ කළත් ඔහුට ඇගේ ආදරය නම් දිනාගන්න ලැබිලා නෑ. ඒකෙන් කිපුණ මේ පරංගි නිලධාරියා අනෙකුත් නිලධාරීන්ගෙත් සහාය ඇතුව වීදිය බණ්ඩාරව කුදලගෙන ගිහින් කෝට්ටේ රාජධානියේ හිරගත කළාලු. ඊටපස්සෙ ඉතින් සමුද්‍රා දේවියටත් තමන්ගේ ස්වාමියාව බේරගන්න තියෙන උවමනාවට අර පරංගියා එක්ක බොරුවට හරි පෙමින් වෙළෙන්න සිද්ධවෙලා. පස්සෙ ඇය ඒ පරංගියා හරහා වීදිය බණ්ඩාරව හිරගත කරගෙන හිටපු හිරකුටියට යන පාර හොයාගෙන තියෙනවා. ඊටපස්සේ ඇය රහසිගතව වීදිය බණ්ඩාරගෙ හිරකුටියට යන්න උමඟක් හාරලා තියෙනවා. ඒ හාරපු උමං මාර්ගය දිගේ ගිහින් ඇය තමන්ගේ සැමියාව බේරගත්තා කියලයි සඳහන් වෙන්නේ. ඒත් පස්සේ සිද්ධවෙලා තියෙන්නෙ නොහිතපු දෙයක්. මාව බේරගන්න හරි පරංගියෙක් එක්ක ලඟින එක මහ ලොකු හපන්කමක්ද යකෝ කියලා වීදිය බණ්ඩාර ඇයට දඬුවම් කරලා දියවන්නා ඔයේ ගිල්ලවලා මරලා දැම්මා කියලයි කියන්නේ.

මේකත් ඒ වගේම තවත් එකක්.

ගම්පොල රාජධානියේ රජකම් කරලා තියෙන තුන්වැනි වික්‍රමබාහු රජතුමාගේ අගබිසව තමයි හෙණකද බිසෝ බණ්ඩාර කියන්නෙ. ඇයත් කලින් කිව්ව අය වගේම ඉතාමත් සුරූපී තැනැත්තියක්. දන්නවද මෙයාගෙ රූපෙට වහවැටිලා තියෙන්නෙ කවුද කියලා? වෙන කවුරුත් නෙවෙයි, කතරගම දෙයියොයි, දැඩිමුණ්ඩ දෙයියොයි. අන්තිමේදි හෙණකද බිසෝ බණ්ඩාරව බෙදාගන්න බැරුව මේ දෙන්නාත් හැමදාම පැටලෙන්න පටන් අරන්. හැබැයි හෙණකද බිසෝ බණ්ඩාර මේ ගැන වගේ වගක් දැනන් ඉඳලා නෑලු. ඒත් දැඩිමුණ්ඩ හිතන් ඉඳලා තියෙන්නෙ කතරගමයා ටිකක් පෙනුමට ඉන්න නිසා තමන්ගෙ ලකුණු කැපෙයි කියලලු. අන්තිමේදි මට නැත්තම් තොට දෙන්නෙත් නෑ කියලා හිතපු දැඩිමුණ්ඩ හෙණකද බිසෝ බණ්ඩාරව මරලා පෙට්ටියක දාලා මහවැලි ගඟට දැම්මලු. පස්සෙ මහවැලි ගඟ දිගේ ගහගෙන ගියපු ඇගේ සිරුර කහටපිටිය ගඟේ දිය නාමින් හිටපු මුස්ලිම් කාන්තාවො ටිකකට හම්බෙලා. ඇගේ ලස්සනට වශී වුණ ඒ උදවිය කහටපිටියෙම පල්ලියක් හදවලා ඒකෙම හෙණකද බිසෝ බණ්ඩාරගේ සිරුර තැන්පත් කළාය කියනවා. අද තියෙන කහටපිටිය මුස්ලිම් දේවස්ථානය ඉදිවෙලා තියෙන්නෙ එදා ඔවුන් හෙණකද බිසෝ බණ්ඩාරගේ සිරුර තැන්පත් කරපු ස්ථානයේ කියලත් කියනවා.

බැලුවම ඔය කතා තුනේම ඉන්න කාන්තාවෝ තුන්දෙනාටම අවසනාවන්ත ඉරණම්වලට මූණ දෙන්න සිද්ධවෙලා තියෙන්නෙ පුරුෂ පාර්ශවය නිසා. සුගලා දේවියගේ ලස්සන නිසා අර ඇමතියො ටික හිතලා තිබුණෙ ඇයව ලේසියෙන්ම වරදට පොළඹවගන්න පුළුවන් වෙයි කියලා. එහෙම බැරි තැන ඇයට අපහාස කළා. සමුද්‍රා දේවියත් ලස්සන නිසාම ඇගේ ස්වාමියා ඇයව විශ්වාස කරලා තිබුණෙ නෑ. අනිත් අතට බැලුවම දෙයියන්ගෙ කියලත් මනුස්සයන්ට වඩා වැඩි වෙනසක් තිබිලා නෑ.

කොහොම වුණත් මුලින්ම ඒ ගැන ටිකක් මතක් කරලා හිටියේ අද අපි කතා කරන්නෙත් කාන්තාවොන්ගෙ ලස්සන දිහා ගෞරවාන්විතව බලන්නෙ කොහොමද කියන කාරණාව ගැන නිසා.

මහාචාර්ය අත්තනායක එම්.හේරත් මහතා ඒ ගැන කිව්වේ මෙහෙම කතාවක්.

"කාන්තාවන්ගේ ලස්සන ගැන කතා කරනකොට අපි කාටත් මුලින්ම මතක්වෙන්නේ රූපලාවණ්‍ය ක්ෂේත්‍රයනේ. ඒකට ප්‍රධාන හේතු දෙකක් තියෙනවා. පළවැනි එක තමයි රූපලාවණ්‍ය ක්ෂේත්‍රය කියන්නේ කාන්තාවන්ගෙම සොයාගැනීමක්. දෙවැනි කාරණය අද වෙනකොට රූපලාවණ්‍යාගාරවලට වැඩිපුරම යන්නෙ කාන්තාවන්. මම නම් කියන්නේ ඒ අය සැලෝන් එකකට ගිහිල්ලා හැඩට වැඩට ඉන්න එකේ ඇති වරදක් නෑ. මොකද එයාලා එහෙම ලස්සන වෙලා සිරියාවට ඉන්නකොට පිරිමි වෙච්ච අපේ ජීවිතත් නිකම්ම එළිය වැටෙනවා.

අනික ඔය රූපලාවණ්‍ය ක්ෂේත්‍රය අද වෙනකොට විශාල වශයෙන් මුදල් උපයන කර්මාන්තයක්. ඒකෙන් තරුණ තරුණියෝ කීදෙනෙකුගේ විරැකියාව නැතිවෙලා තියෙනවද? හැබැයි සැලෝන් එකක රස්සාවක් කරන දුවෙක් දිහා ගෞරවයෙන් බලන්න, ඇයට ගෞරවනීය විදියට කතා කරන්න හැමෝටම බෑ. ඇත්තම කිව්වොත් මේක විසිඑක්වැනි සියවස වෙලත් අදටත් ඒ දැරිවියන්ට රෑ හතෙන් අටෙන් පස්සේ බයක් හැකක් නැතුව ඒ තැන්වල රැඳෙන්න, ඒ තැන්වලින් පිටවෙලා යන්න බැරි ප්‍රශ්න තියෙනවා.

හැබැයි ගොඩක් අය දන්නෙ නෑ තවත් කෙනෙක්ව හැඩ කරන එකත් ආඩම්බරකාර වෘත්තියක් කියලා. එහෙම කියන්න තියෙන හොඳම උදාහරණය තමයි අපේ සීගිරියයි, සීගිරි කැටපත් පවුරයි. කාශ්‍යප රජතුමා අතින් සීගිරි බිතුසිතුවම් නිර්මාණය වුණෙත්, කැටපත් පවුර හැදුනෙත් පස්වැනි සියවසේදි. හැබැයි බලන්න ඒ අය එදා සීගිරි ලලනාවන්ගේ අඟපසඟ ඇඳලා තියෙන අපූරුව. ඊළඟට වර්ණ සංකලනය කරලා, කොණ්ඩෙට කටු ගහලා, මලින් සරසලා තියෙන හැඩ. ඒ විතරක් නෙවෙයි තොල් ආලේපන පවා ගාලා තියෙන්නේ අමුතුම කලාවකට. ඒත් ඒ කාලේ අද වගේ සැලෝන් තිබුණෙ නෑ. මේ තරම් දියුණු තාක්ෂණයක් තිබිලත් නෑ. හැබැයි එදා හිටපු පිරිමි උදවිය ගැහැනියව ලස්සනට දකින්න ආසා කරලා තියෙනවා කියන එක නම් පැහැදිලියි.

එදා ඔවුන් ගැහැනුන්ගේ අඩනිරුවතක් වුණත් බොහොම සෞන්දර්යාත්මක විදියට රස විඳලා තියෙනවා. අනික කැටපත්



## දැඩිමුණ්ඩ හිතන් ඉඳලා තියෙන්නෙ කතරගමයා ටිකක් පෙනුමට ඉන්න නිසා තමන්ගෙ ලකුණු කැපෙයි කියලලු. අන්තිමේදි මට නැත්තම් තොට දෙන්නෙත් නෑ කියලා හිතපු දැඩිමුණ්ඩ හෙණකද බිසෝ බණ්ඩාරව මරලා පෙට්ටියක දාලා මහවැලි ගඟට දැම්මලු

පවුරේ වැඩි හරියක් කුරුටු ගීත ලියැවිලා තියෙන්නේ අර සීගිරි ලලනාවන්ගේ අඟ පසඟ ගැන වර්ණනා කරලා. හරියට බැලුවොත් ඒකත් අද කාලේ උදවිය ඔය ෆේස්බුක්, යූ ටියුබ්වල තමන්ගේ අදහස් ප්‍රකාශ කරනවා වගේ දෙයක්නේ. ඒත් එදා ඇත්තෝ අර කැටපත් පවුරේ ගැහැනු රුව ගැන එක අසභ්‍ය වචනයක්වත් ලියලා නෑ. එදා පිරිමි පෝලිමේ සීගිරියට ගියේ ඔය ගැහැනු රුව බලන්න මිසක් ගල් පර්වතය බලන්නම නෙවෙයිනේ. මොකද අපේ උදවිය පටලගෙන තිබුණාට සීගිරිය කියන්නේ බලකොටුවක් මිසක ආගමික සිද්ධස්ථානයක් නෙවෙයි.

ඊළඟට මම මේකට තව උදාහරණයක් කියන්නම්. මේ මෑතකදී මට කොළඹ ප්‍රධාන පෙළේ මිශ්‍ර පාසලකට යන්න සිද්ධ වුණා උසස් පෙළ ඇගයීම් ප්‍රශ්න පත්තර ලකුණු කරන්න. එහෙම ගිය දවස්වලට අපිටත් පාවිච්චි කරන්න වෙන්නේ පාසලේ පිරිමි දරුවෝ පාවිච්චි කරන වැසිකිළිම තමයි. ඉතින් දවසක් මටත් ඒ අයගේ වැසිකිළියකට යන්න වුණා. ඇත්තම කිව්වොත් උන් ඒවා ඇතුළේ ගෑනු ගැන ලියලා තියෙන වගන්ති දැක්කම මගෙ ඇස් උඩ ගියා. ඒකෙන් පැහැදිලියි සමහරක් පාසල් යන වයසේ පිරිමි දරුවොන්ට කාන්තා සිරුර දිහා ගෞරවනීය විදියට බලන්න පුළුවන්කමක් නෑ කියලා. හරිනම් පාසලෙන් තමයි ඒ දේවල් කියලා දෙන්න ඕන.

ඊළඟට මම මේ ළඟදි කෑගල්ල හරහා කොළඹට එන අතරවාරෙදි ප්‍රසිද්ධ මෙට්ට සමාගමක් විශාල ගල් පර්වතයක් මුදුනේ සවි කරලා තිබුණු දැන්වීම් පුවරුවක් දැක්කා. ඒකෙ නිරූපිකාව දැන්වීමට පෙනී ඉඳලා හිටියේ රෑ ඇඳුමකින් උඩුබැලි අතට නිදාගෙන. හැබැයි ඒ දිහා බලාගෙන ඉන්න බැරි අමාරුවක් තිබිලා තියෙන මොකක්හරි එකෙක් කොහොමින්හරි අර ගල් පර්වතය මුදුනට බඩගාලාද මන්දා මහවිශාල ලී දණ්ඩකින් ඇයගේ රහස් ප්‍රදේශයට ඇනලා එතැනම කළු තීන්තවලින් අමුම අමු තිත්ත කුණුහරප ටිකක් ලියලා තිබුණා. දැන් පැහැදිලියිනේ සමහරක් පිරිමි ගැහැනු රස විඳින්න පුරුදු වෙලා ඉන්න විදිය.

ඇත්තටම අද ලිපියෙන් දුවලාටත් වැඩිය අපේ තරුණ පුතාලට ගන්න දෙයක් ඇති කියලා මට හිතෙනවා. මොකද ඉදිරි පරම්පරාව කාන්තාව දිහා ගෞරවයෙන් බලන්න පුරුදු වුණේ නැත්නම්, ඇගේ සුන්දරත්වය අගය කරන්න පුරුදු වුණේ නැත්නම් ඒක ලොකු ගැටලුවක් වෙන්න පුළුවන්.

අවසාන වශයෙන් මම අපේ තරුණ පුතාලට කියන්නේ ගැහැනියකගේ රුව ලස්සනට දැකපල්ලා. ඒ ලස්සන කේවල් නොකර අගය කරපල්ලා. ලස්සන කෙල්ලෙක් තමන් දිහා නොබලපු පලියට ඒ කෙල්ලට ලේබල් ගහන එක නතර කරපල්ලා. මොකද ඇය සුන්දරව ඉන්න තරමටම තමයි පිරිමි අපේ ජීවිත වැඩි වැඩියෙන් ලස්සන වෙන්නෙ.

දුවලටත් මම කියනවා පිරිමි කට කැඩිච්ච කතා කිව්ව පලියට ඒවාට සැලෙන්න එපා. ඒවගෙන් දුවලා රිද්දගන්න බව දැක්කොත් තමයි ඒ අයගේ සතුට තියෙන්නේ. ඒ නිසා ඒ වගේ පහත් සතුටක් විඳින්න බලාගෙන ඉන්න පිරිමින්ට ඒ අවස්ථාව දෙන්න එපා. පුළුවන් තරම් හැඩට ඉන්න. තමන්ගේ හෘද සාක්ෂිය තමන්ට චෝදනා නොකරනතාක් තමන් කැමති විදියේ විලාසිතා කරන්න.

■ ලිහිණි මධුෂිකා

# TVET සම්මන්ත්‍රණය සහ සම්මාන ප්‍රදානෝත්සවය 2023

ශ්‍රී ලංකාව පුරා ග්‍රාමීය කාන්තා ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කරමින්, 'තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව (TVET) පිළිබඳ සම්මන්ත්‍රණය සහ සම්මාන ප්‍රදානෝත්සවය 2023' පසුගිය මාර්තු 22 වැනිදා කොළඹ ගලදාරි හෝටල් පරිශ්‍රයේදී පැවැත්විණි. කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් පෞද්ගලික අංශයේ ප්‍රධානීන් සහ රාජ්‍ය අංශයේ පාර්ශවකරුවන් මෙම අවස්ථාවට පැමිණි අතර TVET වැඩසටහන යටතේ පසුගිය සිව් වසර තුළ ඔවුන් ලබා ඇති ප්‍රගතිය වෙනුවෙන් TVET තරුණ ප්‍රතිලාභීන් 49ක් මෙහිදී ඇගයීමටද ලක්විය. අධ්‍යාපන අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතාද මෙම අවස්ථාවට පැමිණ සිටි අතර ව්‍යාපෘතිය සහ සම්මාන ප්‍රදානෝත්සවය පිළිබඳ අදහස් දක්වමින් ඔහු පවසා සිටියේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව (TVET) සෑමවිටම ඉල්ලුම මතම පදනම් විය යුතු බවයි.

රුවන් එස්.සෙනවිරත්න











F.A.Ads

ඔබට මුදල් හදිස්සියක්ද? නැත්නම් ඔබේ වටිනා රන් භාණ්ඩ සින්න වෙන්න යනවාද?

ඕනෑම බැංකුවක උකස් තබා ඇති රන් භාණ්ඩ ගණුදෙනුවක් සඳහා

පවුමට රු. 43,000/- ක් ම වැඩිපුර

1% ක අඩුම පොලියට ලබා ගන්න

ඔබ දැනට උකස්තබා ඇති රිසිට් පත අපට 0767 888 222 අංකයට WhatsApp කරන්න

විශේෂ සහන රැසක් සමගින්

නැවත බේරා ගැනීමේදී පහසු ගෙවීමේ ක්‍රමයට Loan එකකුත්

*කොන්දේසි අදාළවේ

| | | | |
|---|---|---|---|
| කොළඹ | 0771 408 547 | මීගමුව | 0766 227 056 |
| කොටහේන | 0702 539 382 | ගම්පහ | 0779 230 549 |
| වැල්ලවත්ත | 0710 870 686 | කළුතර | 0776 167 149 |
| ග්‍රෑන්ඩ්පාස් | 0742 379 739 | හලාවත | 0779 256 191 |
| මොරටුව | 0766 227 059 | මාතර | 0705 979 237 |
| පානදුර | 0767 952 286 | ගම්පොල | 0710 870 735 |
| වෙන්නප්පුව | 0710 869 378 | නාවලපිටිය | 0710 870 706 |
| ගාල්ල | 0705 979 274 | හැටන් | 0778 790 372 |
| කුරුණෑගල | 0766 227 061 | කෑගල්ල | 0703 583 363 |
| දිගන | 0778 156 738 | ත්‍රිකුණාමලය | 0771 201 854 |
| බේරුවල | 0740 920 356 | පුත්තලම | 0771 201 861 |
| මතුගම | 0771 201 860 | මහියංගනය | 0771 201 862 |
| මොණරාගල | 0771 201 852 | වත්තේගම | 0742 551 103 |
| බදුල්ල | 0771 201 863 | හපුතලේ | 0760 677 018 |
| කල්පිටිය | 0761 605 803 | මාතලේ | 0702 539 389 |
| කටුගස්තොට | 0779 476 206 | තලවකැලේ | 0710 871 009 |
| නාඋල | 0763 226 230 | රාගල | 0710 870 703 |
| කන්තලේ | 0742 572 585 | පූඩළුඔය | 0740 929 541 |
| පොතුවිල් | 0771 201 855 | මස්කෙලිය | 0760 909 822 |
| වැලිමඩ | 0778 764 751 | පුස්සැල්ලාව | 0742 531 360 |
| බගවන්තලාව | 0742 588 267 | අච්චුවේලි | 0743 865 368 |
| ආගරපතන | 0742 499 563 | මට්ටක්කුලිය | 0742 127 665 |
| ඇලකන්ද | 0771 201 857 | | |
| හාවඑළිය | 0773 394 209 | | |

# තමන්ට තමන් විශ්වාසනම් මුලින් සීනිබෝල හදලා විකිණුවත් මොකද?

## ලංකාවේ විදුලි බලාගාරයක් පවත්වාගෙන යන එකම කාන්තාව

## මනෝජී වඩුගොඩපිටිය

**80 - 90 දශකවල ලෝකයේ බොහෝමයක් ක්ෂේත්‍රවල මුල්පුටුවලට පත්වෙලා හිටියේ පිරිමි. ඒත් 90 දශකයේ අගභාගය වගේ වෙනකොට ඒ තත්ත්වය සහමුලින්ම වෙනස් වුණා. උදාහරණයක් විදියට ගත්තොත් ඇමෙරිකානු ජෙනරල් මෝටර්ස් සමාගම කියන්නේ දැනට ලෝකයේ තියෙන ප්‍රධාන මෝටර් රථ සමාගමක්. 2014 වසරේ එහි ප්‍රධාන විධායක නිලධාරිනිය වෙන්න මේරි බර්රාට හැකියාව ලැබුණා. ඇගේ පත්වීම සැලකුනේ ලොව ප්‍රධාන මෝටර් රථ සමාගමක එම ධුරයට පත් පළමු කාන්තාව විදියට. ඒ නිසාම එයින් අවුරුද්දක් ගිය තැන 2015දී ෆෝබ්ස් ලැයිස්තුවට අනුව ලොව බලවත්ම කාන්තාව වෙන්නත් ඇයට පුළුවන් වුණා.**

**එතැනින් ගියාම කලක් ලොව විශාලත්වයෙන් දෙවැනි ආහාරපාන නිෂ්පාදන ආයතනය වන ඉන්දියාවේ පෙප්සි කෝලා සමාගමේ ප්‍රධාන විධායක නිලධානිය වූ ඉන්ද්‍රා නූයි, අධිතාක්ෂණික ආරක්ෂක ගුවන්යානා තාක්ෂණ සම්බන්ධ ප්‍රමුඛ පෙළේ ආයතනයක් වන ඇමෙරිකාවේ Lockheed Martin සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිනිය වූ මර්ලින් හෙව්සන්, තුර්කියේ දෙවන විශාලතම කාර්මික හා මූල්‍ය සමාගම වන Sabanci Holding අධ්‍යක්ෂිකාව වූ ගුලර් සබන්සි, ප්‍රංශයේ විදුලි උත්පාදක සමාගමක් වන Engies හි ප්‍රධාන විධායක නිලධානිරිය වූ ඉසබෙල් කෝචර් වැනි අයත් ඒ ගොඩට අයිතියි.**

**අපේ රටෙත් මේ වගේ කාන්තා චරිත කිහිපයක්ම අපිට නම් කරන්න පුළුවන්. අද අපේ කතාබහට එකතුවෙන මනෝජී වඩුගොඩපිටිය කියන්නෙත් එහෙම චරිතයක්. ඇය තමයි ලංකාවේ පෞද්ගලික ජලවිදුලි බලාගාරයක් වෙන 'PAMS HYDRO POWER' සමාගමේ අයිතිකාරිය. ඉතින් විදුලි බලය උත්පාදනය වැනි තරඟකාරී නිෂ්පාදන ක්ෂේත්‍රයක නියැළෙන ඇය එක්කයි මේ කතාබහ.**

"පුංචි කාලේ ඉඳන් මගේ එක පුරුද්දක් තිබුණා. ඒ තමයි මට දෙයක් හිතුණොත් ඒක කරලම තමයි පස්ස බලන්නේ. එහෙම හිතපු දෙයක ප්‍රතිඵලයක් තමයි මගේ ජලවිදුලි බලාගාරය. මට ආසාව තිබුණේ හැම කාලයේම ආදයම් උපයාදෙන ලොකු ඉල්ලුමක් තියෙන මගේම ව්‍යාපාරයක් කරන්න. ඒත් ඒක විදුලි බලාගාරයක් වෙයි කියලා මං හිතුවේ නෑ."

නමුත් මනෝජී අවසානයේ නැවතුණේ ලංකාවේ ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 3.5ක විදුලිබල ධාරිතාවක් උපයා සපයාදෙන 'PAMS HYDRO POWER' සමාගමේ අයිතිකාරිය වෙලා. ඒක තමයි මේ වෙනකොට අපේ රටේ කාන්තාවක් විසින් පවත්වාගෙන යනු ලබන එකම පෞද්ගලික ජලවිදුලිබල උත්පාදන සමාගම. එහි ආරම්භය ගැන මනෝජී කිව්වේ මෙහෙමයි.

"මං උසස් පෙළ කළේ නීතිඥවරියක් වෙන්න හිතාගෙන. ඒත් ලකුණු පහක් මදිවෙලා මට ඒ හීනයට යන්න බැරිවුණා. ඔය අතරේ මං දැක්කා එයාර්ලංකා එකට ගුවන් සේවිකාවෝ බඳවාගන්නවා කියලා පත්තරේක දාපු දැන්වීමක්. පස්සේ මං ඒකට ඉල්ලුම් කළා. මට ඒ රැකියාව ලැබුණා. අවුරුදු හයක කාලයක් ගුවන් සේවිකාවක් විදියට සේවය කළා. මං විවාහවුණේ වෛද්‍යවරයෙක් එක්ක. එයාට පෞද්ගලික රෝහලක් තිබුණා. ඉතින් මං ඒ වෙනකොට කරමින් හිටපු රැකියාවෙන් අයින්වෙලා සැමියගේ රෝහලේ පරිපාලනය අතට ගත්තා."



ඔන්න ඔය කාලේ තමයි මනෝජී අද ඉන්න තැනට එන්න පාර කැපුණු කාලේ. ඇගේ ඒ කතාව ඇහුවම උත්සාහය තියෙනවා නම් ගැහැනුන්ටත් කරන්න බැරි දෙයක් නෑ කියලයි අපට හිතුණේ.

"මගේ සැමියගේ තාත්තා ඉංජිනේරුවෙක්. ඒ කාලේ එයා ලොකු විදුලිබලගාරයක් හදමින් හිටියා. මමත් එතැන වැඩට ගියා. ගිහින් ඒ දේවල් ඉගෙනගත්තා. ඔය අතරේ මට හිතුණා මමත් විදුලිබලාගාරයක් හදන්න ඕනේ කියලා. මං ඒක සැමියට කිව්වට පස්සේ එයත් ඒකට කැමති වුණා. ඒත් ඒකට මට තැනක් තිබුණේ නෑ. ඔය කාලේ මට ආරංචි වුණා කිතුල්ගල, අර්සුලාන පැත්තේ ගඟක් ළඟ තියෙන අක්කර පනහක ලොකු ඉඩමක් ඩොලර්වලට විකුණන්න යනවා කියලා. ඒ වෙනකොට මං ගුවන් සේවිකාවක් විදියට සේවය කරපු කාලේ එකතු කරපු ඩොලර් ටිකක් තිබුණා. මං ඒවගෙන් අර ඉඩම ගත්තා. ඒ අරන් තමයි ජල විදුලිබලාගාරය හැදුවේ."

මේ වෙනකොට මනෝජීගේ 'Pams Hydro' ජලවිදුලි බලාගාරය ආරම්භ කරලා අවුරුදු 16ක්. 2003දී ඉදිකිරීම් ඇරඹුණු එයින් 2007 වසරේ සිට මෙරට ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 3.5ක විදුලිබල ධාරිතාවක් උපයා සපයාදෙන බවයි මනෝජී අපිට කිව්වේ.

"Pams Hydro අපේ ජලවිදුලිබලාගාරය තියෙන්නේ කලවැල්දෙනියේ, ගිනිගත්හේන කිතුල්ගල ප්‍රදේශයේ. ඒක දැනට ලංකාවේ හොඳටම ක්‍රියාත්මක වෙන ජලවිදුලිබලාගාරවලින් එකක්. ඒ හරහා අවට ගම්වල බොහෝ පිරිසකට රැකියා අවස්ථා ලැබිලා තියෙනවා."

මනෝජී කියන විදියට ඇගේ ව්‍යාපාරයේ සාර්ථකත්වයට රහස එක්ව කටයුතු කිරීමලු. ඉංජිනේරුවන් ප්‍රමුඛව සියයකට අධික සේවක සේවිකාවන් පිරිසක් විදුලිබලගාරයේ සේවය කළත් ඔවුන් එහි සේවක සේවිකාවන් නොව කොටස්කරුවන් බවයි ඇය සඳහන් කරන්නේ. හදිසි අසනීප තත්ත්වයක් නිසා සැමියාගේ සමුගැනීම තමාගේ ගමනට දැඩි අභියෝගයක් වූ මොහොතක ඔවුන් ඇයව අත්නොහැර සිටීමම තමාට විශාල ශක්තියක් වූ බව මනෝජී කිව්වේ ටිකක් සංවේදීවෙමින්.

"මේ වෙනකොට විදුලිබලගාරයෙන් ලැබෙන ආදායමෙන් හතරෙන් එකක් මං සමාජ සුබසාධනය වෙනුවෙන් යොදවනවා. ඒ හරහා ආගමික ස්ථාන නඟාසිටුවීම, වැඩිහිටි නිවාසවලට පිහිටවීම වගේ දේවල් කරනවා. අනික තමයි 'Simply Women' ව්‍යාපෘතිය. ඒක අපි ආරම්භ කළේම දුකට අසරණභාවයට පත්වුණු කාන්තාවන්ට පිහිටවීමේ අරමුණින්. අපේ රටේ පිරිමින්ට සාපේක්ෂව කාන්තාවන්ට ගොඩාක් ප්‍රශ්න තියෙනවා. ඒ වගේ අයට අපි 'Simply Women' ව්‍යාපෘතිය හරහා මේ වෙනකොටත් බොහෝ දේවල් කරලා තියෙනවා."

මේ අතර 2018 අවුරුද්දේ මනෝජී තමන්ගේ විදුලිබලගාරය සමීපයෙන් තවත් ව්‍යාපාරයකට අතහැඟුවා. ඒ සොබාදහමට ඇලුම් කරන විදේශීය සංචාරකයින් ඉලක්ක කරගෙන පරිසර හිතකාමී සංචාරක නිකේතනයක් ඉදිකිරීම. ඒක තමයි 'Arsulana Eco Lodge' කියන්නේ. ඒ ගැන ඇය කිව්වේ මෙහෙම කතාවක්.

"මං කොහොමත් ව්‍යාපාරික ක්ෂේත්‍රයට කැමතියි. ව්‍යාපාර කීපයක් කරන එකේ වරදක් මං දකින්නේ නෑ. මොකද එක ව්‍යාපාරයක් වැටුණොත් අනික තියෙන නිසා බයක් නෑ. සාර්ථක වෙන්න ඕනම කාන්තාවකට පුළුවන්. ඒකට තමන් ගැන විශ්වාසයක් ඇතිකරගන්න ඕනේ. මං හිතන දෙයක් තමයි කිසිම කාන්තාවක් පිරිමියෙකුගෙන් යැපෙන තැනට පත්වෙන්න උවමනා නෑ. පොඩියට හරි ආදායම් මාර්ගයක් හොයාගන්න ඕනේ. ඒ වෙනුවෙන් මුලදී සීනිබෝල හදලා විකුණුවත් කමක් නෑ."

මනෝජීගේ කතාව ඇත්ත. අද ලෝකයේ ඉහළට ගිහින් ඉන්න බොහෝමයක් කාන්තාවෝ ඒ තැනට ගිහින් තියෙන්නේ හරි පුංචි තැන්වල ඉඳලා. මනෝජීත් එහෙමයි. ඇය ඉපදිලා තියෙන්නේ මහනුවර. අම්මා, තාත්තා ඇරුණම ඇයට ඉන්නේ අක්කයි, මල්ලියි. ඉතින් ඇය ආ ගමන දුෂ්කර වුණාත් ඒ ගමන්මගේ ජයග්‍රහණ ගැන කතා කරන්නත් අමතක කළේ නෑ.

"පසුගිය ජනවාරි 11 වැනිදා මට ශ්‍රී ලංකාවේ සාර්ථකම ව්‍යවසායිකාවට හිමි රිදී සම්මානය ලැබුණා. ඒ ජනාධිපති ආර්යා මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ මහත්මිය අතින්. ඒ වගේම දකුනු ආසියා කලාපයේ සාර්ථක ව්‍යාපාරික කාන්තාවක් විදියට මට විවිධ රටවලින් සුළු හා මධ්‍ය පරිමාන ව්‍යවසායිකයින් දිරි ගැන්වීමට හා දැනුවත් කිරීම සඳහා සම්පත් දායිකාවක විදියට ආරාධනා ලැබෙනවා. තව ලෝක කාන්තා ව්‍යවසායිකයින්ගේ සමුළුව පවා අවස්ථා කීපයකදීම අමතලා තියෙනවා."

මනෝජී එහෙම කියද්දි අපිටත් ඇය ගැන ආවේ ලොකු ආඩම්බරයක්. ඒ ඇය අපේ රටේ කාන්තාවක් නිසා. ඉතින් වැඩ ගොඩක් එක්ක සතුටින් ජීවිතය දරන මනෝජීට සමුදෙන්න කලින් අපි ඇයට පුංචි ඉල්ලීමක් කළා. ඒ දශය වසරක් පුරාවට ජාතික විදුලිබල පද්ධතියට දායකත්වය දක්වන එකම ලාංකික කාන්තාව විදියට 'ධරණී' කියවන කාන්තාවන්ට යමක් කියන්න කියලා. ඇය කිව්වේ මෙහෙම කතාවක්.

"ගොඩාක් අය හිතන්නේ කාන්තාවන් කියන්නේ නැතිබැරිකම් හෝ අහිමිවීම් හමුවේ හඬා වැටෙන්න උපන් පිරිසක් කියලා. ඒත් මං හිතන්නේ කාන්තාවක් කියන්නේම අභියෝග හමුවේ නොසැලී ධෛර්යය පෙරදැරිව ජයග්‍රහණය කරා ගමන් කළ හැකි පිරිසක් කියලා. මොකද කාන්තාවන් සතු ශක්තිය අප්‍රමාණයි. උත්සාහය, ධෛර්යය අනන්තයි. ඔවුන්ට එකවර වැඩ ගොඩක් කරන්න පුළුවන්. ඒකට ගැහැනුකම කිසිම බාධාවක් නෙවෙයි. අර මං මුලින් කියපු විදියට ලැජ්ජා නොවී සීනිබෝල හදන තැනකින් හරි පටන්ගන්න. වැඩේ හරියට කළොත් ඔබටත් මං වගේ සාර්ථක ගැහැනියක් වෙන්න පුළුවන්."




■ රුවන් එස්.සෙනවිරත්න

**පුද්ගලික සම්බන්ධතා ගත්තත්, රාජකාරි මට්ටමේ සබඳතා ගත්තත් බොහෝවිට අපි පුරුදුවී සිටින්නේ අගය කිරීමට හෝ ප්‍රශංසා කිරීමට වඩා චෝදනා කිරීමටයි. එසේත් නැතිනම් මැසිවිලි නැගීමටයි. එම සබඳතා නිසා සතුටු වෙන්නට කාරණා සියයක් ඇතත්, පසුතැවෙන්නට ඇති එක් කාරණාවක් හෝ මුල් කරගෙන අපි කරන්නේ සියල්ල අවුල් කරගැනීමයි.සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවිත අත්දැකීම් ඇසුරින් අපිට කියාදෙන්නේ විශේෂයෙන්ම 'පවුල' නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කමයි. එමෙන්ම ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුට විය හැකි කාරණා පමණක් ජීවිතයට එක් කරගැනීමෙන්, බලා සිටියදී පවුල් ජීවිතය සතුටින් පිරී ඉතිරී යන අයුරු ඇය කියන්නේ සතුටින් ජීවිතය දරණ ඇගේ ජීවන අත්දැකීම් සමුදාය මුල්කරගෙනය.**



# සතුට - සැනසීම දන් දෙනකොට ඒක ලැබෙන්නේ ඩබල් වෙලා

සෙනසුරාද, ඉරිද කියන්නේ මං ආසම දවස් දෙක. මොකද සතිඅන්තයේ ඒ දවස් දෙකේ අපේ ගෙදර හැමෝම ඇහැරෙන්නේ ටිකක් පරක්කු වෙලා. ඇත්තටම වෙනද ගෙදර හැමෝටම කලියෙන් ඇහැරෙන මම සතිඅන්තයේ ඇහැරෙන්නේ හැමෝම ඇහැරුණාට පස්සේ.

ගොඩක් වෙලාවට සිකුරාද රෑට වගේම සෙනසුරාද රෑටත් මං දහම් එක්ක චිත්‍රපටයක් බලන්න පුරුදු වෙලා ඉන්නවා. එහෙම නැත්නම් මගින් බලලා නවත්තපු නාට්‍ය කොටස් ටිකක් රෑ වෙනකන් බලනවා. අපි ඕනකමින් ඒ දවස්වල රාත්‍රී වෙලාව අප වෙනුවෙන් වෙන්කරගන්නවා. ඉතින් ඔය වගේ දේවල් එක්ක නිදියන්න රෑ වෙන හින්ද, උදේට ඇහැරෙන්නේ පරක්කු වෙලා.

ගෙවුණ සුමානේ සතිඅන්තයේ දවසක මං උදේට ඇහැරෙනකොට මගේ උදේ කෑම එක, කිරි කෝපි එකක් එක්කම කෑම මේසේ උඩ තියලා තිබුණා. එතකොට මට මතක් වුණේ කසාද බඳින්න කලින් ගෙදරදි උදේට නැගිටලා කුස්සියට යද්දි අම්මා තේ එක හදලා තියනවා වගේ හැඟීමක්. කුස්සිය දිහා බලද්දි ඔවින්‍යා දූ දහම් එක්ක එකතුවෙලා එයාලාගේ කෑම හදනවා.

ඉතින් මට හිතුණා මගේ මහත්තයා මේ හැම ක්‍රියාවකින්ම මට දෙන්න හදන්නේ, 'අද ඔයා වැඩ කරන්න එපා නිදහසින් ඉන්න' කියන පණිවිඩය නේද කියලා. රැකියාවක් කළත් නොකළත් බහුතරයක් ගැහැනු නිදගන්න පැය ගණන ඇරුණාම අනිත් හැමවෙලේම ඉන්නේ වැඩක. නින්දෙනුත් සමහර වෙලාවට මතක්වෙන්නේ හෙට දවසේ කරන්න තියෙන වැඩ. අර ප්‍රසිද්ධ වැකියක් තියනවනේ 'ගැහැනු වැඩ ඇරී වැඩට යති' කියලා. ඒ කියන්නේ රැකියා කරන බහුතරයක් කාන්තාවන්ට කාර්යාල වේලාවෙන් පස්සෙත් ගොඩක් වෙලාවට කායික හෝ මානසික නිදහසක් ලැබෙනවා අඩුයි. ඒ නිසාම තමයි එහෙම අයට විවේකයක් අවශ්‍ය වෙන්නේ. ඉතින් මම මේ කියපු විදියට ඒ විවේකය ඉල්ලන්න කලින්ම ලැබෙද්දී, හිතට පුදුමාකාර සතුටක් දැනෙනවා. ඒ සතුට වචනවලට පෙරලන්න අමාරුයි. ඇත්තටම ඒක පුදුමාකාර සැනසීමක්. මං විශ්වාස කරන දේ තමයි එයාලට ඉඩක් ලැබෙන හැම මොහොතකම මට විවේකයක් දෙන්න එයාල උත්සාහ කරන්නේ, මගෙන් පවුලට ලැබෙන දේවල් ගැන එයාලා තෘප්තිමත් හින්ද කියලා.

මගේ දරුවෝ පුංචියි. ඒත් මගේ ඔවී දූ සිකුරාදට ජපන් භාෂාවෙන්ම කියනවා, "මමා නිදගන්න හෙට පපා උයන්නේ" කියලා. "මමා රිලැක්ස් එකේ ඉන්න" කියලාත් කියනවා. ඒ තරම් පුංචි වයසකදී මගේ දරුවෝ මගේ විවේකය ගැන එහෙම හිතනවා කියන එකම මට සැනසීමක්. හැබැයි ඒ සැනසීම ලබන්න නම්, ඊට කලින් පවුලේ අයට ඒ සැනසීම, ආදරය අපෙනුත් ලැබිලා තියෙන්න ඕන කියන එක මම විශ්වාස කරනවා.

සමහර නෝනලා මහත්තයා ගෙදර ඉන්න දවසට "අද ඔහේ ගෙදරනේ මේ වැඩට උදව් වෙනවා" හරි "මේ දවස් දෙකේ මේ ගෙදර වැඩ ටික කරලා බලනවා, මං කරන වැඩ කන්දරාව" කියලා ගොඩක් වෙලාවට ආඩපාලි කියනවා. නැත්නම් බලහත්කාරකමෙන්, කටේ සද්දෙන් වැඩ කරවා ගන්න උත්සාහ කරනවා. හැබැයි එහෙම කරද්දී කාටවත් තෘප්තිමත් බවක් නෑ කියන එකයි මගේනම් අදහස.

ඒ නිසා පවුල ඇතුළේ සතුට සැනසීම රැකගන්න ගැහැනියක් විදියට ඔයාගෙන් වෙන්න ඕන දේ මුලින් කරන්න. ඊටපස්සේ පිරිමියාගේ පැත්තෙනුත් ඒ දේවල් වේවි. මම හැමදම කියනවා වගේ ආදරේට පුළුවන් ගොඩක් දේවල් සුබවාදී විදියට වෙනස් කරන්න.

■ හෂිණි මනමේන්ද්‍ර





ගුවන් හමුදපතිවරයා අතින් සම්මාන ලබමින්





# 'බෑ කියලා දෙයක් නෑ' විශිෂ්ටතම ගුවන් කාන්තාව කියයි!

## මම රෙස්ලින් ඉගෙනගත්තේ ගුවන් හමුදාවට බැඳුනට පස්සේ

"ඉස්කෝලේ යන දවස්වල මම රෙස්ලින් ගැන දැනගෙන හිටියේ නැහැ. ඒ ගැන උනන්දුවක් තිබුණෙත් නැහැ. වාර්ෂික නිවාසාන්තර තරඟ කාලෙට දුවන්න, පනින්න, යගුලිය දන්න වගේම නෙට්බෝල්, වොලිබෝල් වගේ ක්‍රීඩාවන් කළා. සහතික ගත්තා. හැබැයි ඔය කාලේ තමයි හමුද නිල ඇඳුමට මගේ හිතේ කැමැත්තක් ඇතිවුණේ. ඒ කැමැත්ත නිසාම මම ගුවන් හමුදවට අයැදුම්පතක් යොමුකළා. මගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය වුණේ මේ රැකියාව. මේ සියලු ජයග්‍රහණවලට හේතුව උත්සාහය උනන්දුව වගේම ගුවන් හමුදව තුළ දක්ෂතා ඔප්නංවාගන්න අපට ලබාදී තිබෙන අවස්ථාවයි."

ඒ කටුනායක ගුවන් හමුද මූලික කඳවුරේ භෝජනාගාර සහායිකාවක ලෙස සේවය කරන කෝප්‍රල් ලක්ෂිකා ඒ.පී.ගේ.ය තවත් ආකාරයකට ඇය ගැන කිවහොත්, ශ්‍රී ලංකා ගුවන් හමුදව වාර්ෂිකව සංවිධානය කරනු ලබන විශිෂ්ටයින් ඇගයීමේ උළෙලේදී 2022 වසරේ විශිෂ්ටතම ගුවන් කාන්තාව ලෙස සම්මාන ලැබුවේ ඇයයි. ජාතික මට්ටමේ මල්ලවපොර ශූරියක, පුහුණුකාරිනියක මෙන්ම ගුවන් හමුදවට සිටින එකම ජාත්‍යන්තර මල්ලවපොර විනිසුරුවරිය ලෙසද ඇයව හැඳින්විය හැකිය.

කළුතර දිස්ත්‍රික්කයට අයත් බදුරලිය, කොත්හේන ගම්මානයේ උපත ලද ඇය, අධ්‍යාපනය ලබන්නේ බදුරලිය කඹුරාවල මහා විද්‍යාලයෙනි. පාසල් අධ්‍යාපනයෙන් පසු ක්‍රීඩාවෙන් ඉදිරියට යන්නට මගපෙන්වූ දෙවන තක්සලාව ලෙස ඇය සලකන්නේ ගුවන් හමුදවය.

**"මම 2012 අවුරුද්දේ තමයි ගුවන් හමුදවට එක්වුණේ. ඒ ක්‍රීඩා අංශයේ භෝජනාගාර භාරකරු විදියට. දියතලාව, රත්මලාන වැනි කඳවුරුවලත් කාලයක් සේවය කළා. එම කාලය තුළ ගුවන් හමුදවේ අන්තර් කඳවුරු තරඟාවලි පැවැත්වුණා. එතැනදී තමන්ගේ දක්ෂතා අනුව ක්‍රීඩාවක් තෝරාගෙන ඉදිරියට යන්න ඕනම කෙනෙකුට අවස්ථාව තියෙනවා. බොහොම සාමාන්‍ය පවුලක කෙනෙක් වුණ මට ලැබුණෙත් එහෙම අවස්ථාවක්. මම මල්ලවපොර අංශය තෝරගත්තා. විනිසුරුවරයෙක්, පුහුණුකරුවන් යටතේ පුහුණුවෙලා 2013 වසරේ කිලෝග්‍රෑම් 55 බර පන්තියේ ගෝල්ඩ් මෙඩ්ල් එක දිනාගත්තා. ඉන්පසුව ආධුනික මල්ලවපොර ශූරතාවලිය 2015, ආරක්ෂක සේවා මල්ලවපොර ශූරතාවලිය 2016, 77 වන ජාතික මල්ලවපොර ශූරතාවලිය, 2016 ජාතික මල්ලවපොර තරඟාවලිය පළමු, දෙවන ස්ථාන ලැබුවා. ඒ වගේම 2017 වසරේ දක්ෂතම ක්‍රීඩිකාව වුණෙත් මම. එහෙම ජයගන්න තරඟකරුවෙකුට ජාතික මට්ටමේ ජයග්‍රහණ ලබන්නත්, ජාත්‍යන්තර තරඟ නියෝජනය කරන්නත් ඉඩ සැලසෙනවා. ගුවන් හමුදව තුළ තිබෙන ක්‍රියා පිළිවෙත එයයි."**

තම රාජකාරි කටයුතුවලට බාධා නොවන පරිදි, දක්ෂතාවන් ඔප්නංවා ගනිමින්, ජයග්‍රාහී ගමනක් යන්නට තමන්ට ලැබුණු අවස්ථාව ඇය මගහරවා ගත්තේ නැත.



මව සහ පියා සමග

**ගමේ සාමාන්‍ය පවුලක කෙනෙක් වුණ මගේ ජීවිතයට දීප්තිය ගෙනාවේ මේ රැකියාවයි**

**"අපට ජාතික මට්ටමේ මල්ලවපොර විනිසුරුවරියන් දෙතුන්දෙනයි ඉන්නේ. ඒ අතරින් 2022 අවුරුද්දේ කාම්බෝජයේ තිබුණු ජාත්‍යන්තර විනිසුරු පාඨමාලාවට සම්බන්ධ වෙන්න මට අවස්ථාවක් ලැබුණා. ඊට සහභාගී වුණ ලංකාවේ විනිසුරුවරුන් තිදෙනාගෙන් එකම කාන්තා නියෝජනය වුණේ මමයි. එම පාඨමාලාවට රටවල් නවයක පමණ පිරිස් සහභාගී වුණා. එහිදි ලිඛිත පරීක්ෂණයන් වගේම, ප්‍රායෝගික පරීක්ෂණයට මුහුණ දීලා ජාත්‍යන්තර විනිසුරු සහතිකය ලබාගන්න මට අවස්ථාව ලැබුණා."**

ඒ හඬ ජයග්‍රහණයේ සතුටින් පිරී තිබේ. කුඩාවියේදී බදුරලිය ගමේදී දුටු තේ දල්ලේ කොළ පැහැයත්, රබර් වතුවලින් හමා එන සිසිල් සුළඟේ සුවයත් විඳිමින් ගෙවා දැමූ කාලය අතරතුර ජයගත හැකි බලාපොරොත්තු ගැන ඕ විශ්වාසය තැබුවාය. පවුලේ වැඩිමල් දියණියද ලක්ෂිකායි. ඇයට සහෝදරියන් දෙදෙනෙකුත් සහෝදරියන් දෙදෙනෙකුත් සිටින අතර, පවුලේ කටයුතුද ඇය සොයා බලන්නේ කැමැත්තෙනි.

"ඇත්තටම මට මගේ දෙමාපියන්, සහෝදරයින්, මගේ සැමියා තාරක සඳරුවන් වගේම, එයාගේ දෙමාපියනුත් මේ ගමනට ලොකු ශක්තියක් වුණා. ගැහැනු කෙනෙක් නිසා ඔයාට ඕවා හරියන්නේ නැහැ කියනවා වෙනුවට මගේ සැමියා මගේ දක්ෂතාවයන් වෙනුවෙන් අවස්ථාව දුන්නා. ඒ වටහාගැනීම, සහයෝගය ඉතාම වටිනවා. ඒ වගේම දක්ෂතා හඳුනාගෙන ඉදිරියට යන ගමනේදී, ගුවන් හමුදව තුළ කාන්තා පිරිමි කියා භේදයක් නැතුව ලබාදෙන සහයෝගය අපි සෑමදෙනාටම එකලෙස ලැබෙනවා. මේ සියල්ලෙම එකතුව ලෙස තමයි මම මෙවර විශිෂ්ටතම ගුවන් කාන්තාව ලෙස සම්මාන ලැබුවේ."

එදින ඇය විශිෂ්ටතම ගුවන් කාන්තාව ලෙස සම්මාන ලබද්දී, 2022 වසරේ විශිෂ්ටතම ගුවන් භටයා ලෙස සම්මාන ලැබුවේ චීන වරාය ගුවන් හමුද විද්‍යා පීඨයේ සේවය කරනු ලබන බලලත් නිලධාරී ආර්. ජී.එස්.ප්‍රියංකරය.

ලක්ෂිකා කියන්නේ තම ජයග්‍රහණයේදී සිහිකළ යුතුම පිරිසක් සිටිනා බවයි. ඒ අතර ගුවන් හමුදපති එයාර් මාර්ෂල් සුදර්ශන පතිරණ, සැපයුම් අධ්‍යක්ෂ ජෙනරාල් එයාර් වයිස් මාර්ෂල් ආර්.එන්.තිලකසිංහ, ගුවන් හමුද ක්‍රීඩා කවුන්සලයේ ලේකම්, ගෲප් කැප්ටන් වී.ඊ.ගීගනගේ, මල්ලවපොර සංචිතයේ හිටපු සභාපති එයාර් වයිස් මාර්ෂල් ඩබ්.එම්.කේ.එස්.පී.වීරසිංහ, කඳවුරු අණදෙන නිලධාරී එයාර් වයිස් මාර්ෂල් එල්.එච්.සුමනවීර, නිලධාරී නිවස්න සභාපති එයාකොමදෝරු එස්.ආර්. උඩකුඹුර ඇතුළු ශ්‍රී ලංකාව මල්ලවපොර සංගමයේ සභාපති සරත් හේවාවිතාරණ ඇතුළු නිලධාරී මණ්ඩලයත්, තම ක්‍රීඩා පුහුණුකරුවන් වන බලපන්ති සැරයන් වයි. ආර්.සී.ප්‍රනාන්දු, කෝප්‍රල් කේ.ටී.ඩබ්ලිව්. ප්‍රනාන්දු යන පුහුණුකරුවන්ද ඇතුළුව සහය දුන් සියලු දෙනා ගෞරවයෙන් සිහිපත් කරන්නීය.

■ දීපා වසන්ති එදිරිසිංහ

# ඒ මසරයි

**බියංකා නානායක්කාර ලියයි**

**115 කොටස**

## වැරැද්දක් කරන්නේ නැති අයගේ ප්‍රශ්නවලට හොඳ විසඳුම් ලැබෙනවා

දුරකතනය අත තබාගෙන තේනුක මොහොතක් සිතුවේ සෙනෙහෙලතා මැණිකේගේ ඇමතුම ගන්නවාද නැද්ද කියාය. ඔහුට හිත කීවේම අම්මා කතා කරන්නේ කාමරය දැක වන්නට ඇත කියාය. එසේ විනි නම් ඇය අසන ප්‍රශ්නවලට දිය යුතු උත්තරයක්ද සූදානම් කරගෙන ඇමතුම ගත යුතුය. ඒ නිසා ඔහු එම ඇමතුම මග හැරෙන්නට ඉඩ හැරියේය.

**"ඇයි..?"**

ඔහු ඇමතුම නොගත් නිසා අංජනා ඇල්ලේපොල ඇසුවාය.

**"අම්මා..."**

**"ඉතින් ගන්නෙ නැත්තේ?"**

**"ප්‍රශ්න ඇහුවොත් දෙන්න උත්තර නැති නිසා..."**

අංජනා ඔහුගේ අත සිරකොට අල්ලාගත්තාය. වෙල් එළියේ සුළඟට සීතලව තිබූ තේනුකගේ ඇඟට ඇගේ අතැඟිලි පහසින් ආ උණුසුම අමුතුවෙන්ම දැනුණේය.

**"මං දන්නවා අම්මා ඔය අහයි කියලා හිතන ප්‍රශ්නෙට පුතෙක් විදියට ඔයාට දෙන්න උත්තරයක් නෑ කියලා... මං හින්දා ඔයත් අමාරුවේ වැටුණා..."**

අංජනාගේ හඬේ වූ පසුතැවිල්ල තේනුක තෙන්නකෝන්ට දැනුණි. හඬක් නගාගෙන ධාවනය වූ කන්ටේනර් රථය ටික දුරක් යනතුරු ඔහු නිශ්ශබ්දව සිටියේ ශෝෂාකාරී බව මැකෙනතුරුය.

**"එහෙම ප්‍රශ්නයක් නෑ නෝනා. අම්මා ඒ වගේ දෙයක් ඇහුවොත් මට දෙන්න උත්තර තියෙනවා. ඒක මගෙ කාමරේ වුණාට මං පාවිච්චි කරන්නෙ නැතුව ගෑනු ළමයෙක්ට පාවිච්චි කරන්න පුළුවන්නේ... ලංකාවෙ තමයි ඒ වගේ දේකදි කොහොමද එහෙම ඉන්නෙ කියලා කිරලා මැනලා බල බල ප්‍රශ්න හදන්නේ. පිටරටවල ඔහොම නෑනේ..."**

**"ඒක තමා මේක ලංකාව හින්දා තමයි ඒ ප්‍රශ්නෙ. අනේ මොනව වුණත් අම්මව තරහ කරගන්න එපා මං හින්දා. ආයේ කෝල් කළොත් ගන්න..."**

අංජනා එසේ කියන විටම ආයෙත් ඔහුගේ දුරකතනය හැඬවුණේය. එවරද ඇමතුම සෙනෙහෙලතා මැණිකේගෙනි. තේනුක පමා නොකර ඇමතුම ගත්තේ ඇය දෙවරක්ම ඇමතුම ගත් නිසාය.

**"පොඩි පුතා... කොයිහරියෙද ඉන්නේ..?"**

ඒ වනවිට තේනුකගේ කාරය නැවතී තිබුණේ ඉඹුල්ගොඩ හරියේය. අම්මාගේ හඬේ වෙනසක් වූයේ නැත. පසුගිය දිනවල තිබූ කලබලබව හෝ නැත. ඇය සිටින්නේ තම නිවස තුළ බව දැන සිටියත් තේනුක ඒ ගැන අසන්නට ගියේ නැත. ඇය ඒ බවක් තේනුකට කීවේද නැත.

**"කොළඹට එන්න තව කොච්චර වෙලාවක් යයිද දරුවො..?"**

**"ඇයි අම්මා... හදිස්සියක්ද..? තව පැය බාගෙකට වඩා යයි..."**

**"නෑ නෑ... හදිස්සියක් නෑ. ඔයා හෙමිහිට එන්න."**


සෙනෙහෙලතා මැණිකේ ඇමතුම අවසන් කළාය. තේනුක තෙන්නකෝන් දුරකතනය අත තබාගෙනම සිතුවේ අංජනාව නවතා යා හැකි තැනක් ගැනයි. මෑත කාලෙක එවන් උදව්වක් ඉල්ලිය හැකි යහළුවෙක් යෙහෙළියක් ලංකාවේ ඔහුට සිටියේ නැත. දන්නා කියන යහළුවන් කොළඹ සිටියත් මෙවන් උදව්වක් ඔවුන්ගෙන් ඉල්ලීමේ හැකියාවක් නැත. අම්මාගේ ගමනේ අරමුණ දැනගන්නා තුරු ඇය නිවසින් පිටව යන වේලාවක් හිතාගන්නටද බැරිය. හෝටල් කාමරයක සුරක්ෂිතව ඇයව නවතා යන්නට හිත කීවද පිරිමියෙකු නැතිව කාමරයක එසේ තරුණියකට බය නැතුව ඉන්නට හැකිවේදැයි දන්නේත් නැත.

**"ඒ පාර මොකද කල්පනා කරන්නේ..? ඔයාට මං වැඩක් කියන්නද? ඔයා ගෙදර යන ගමන් මාව කැම්පස් එකේ හොස්ටල් එක ළඟින් දාගෙන යන්න. දන්න නංගිලා ඉන්නවා. පැයක් දෙකක් ඒ ගොල්ලන්ගෙ කාමරේක ඉන්න පුළුවන්..."**

අංජනාගේ ඒ යෝජනාව ඇසෙත්ම තේනුක තෙන්නකෝන්ගේ හිතට මහා අස්වැසිල්ලක් දැනුණේය. ඊටද ඒ ඈ දන්නා තැනය. වටපිටාව පවා ඇයට සුරක්ෂිතය.

**"එයාලා කවුරුහරි ඉන්නවද කියලා පොඩ්ඩක් චෙක් කරලා බලලා යන එක හොඳයි නේද නෝනා..?"**

අංජනා දුරකතනය අතට ගෙන හෙව්වේ දිනිතිගේ අංකයයි. දිනිති මෙන්ම රසාංජලාත්, ආලෝකාත්, සුනාලිත් ඇය හා කතාබහ කොට සුහදව සිටි පහළ වසර සිසුවියන්ය. ඇය එදා අවසන් දිනයේ ඔවුන්ගේ දුරකතන අංක ඉල්ලාගත් එක කොයිතරම් හොඳදැයි සිතමින් දිනිතිට කතා කළාය. ඇය කතා කරන්නේ කවුදැයි දිනිතිට කියන තුරුත් දිනිති ඇයව හැඳින්නේ නැත. ආගිය තොරතුරු මදක් කතා කරන්නට සිදුවූයේ ඉල්ලන්නට යන උදව්ව ගැන කියන්නට මගක් හදාගන්නටයි.



## ඔයාට ප්‍රශ්නයක් එද්දි උදව්වට මමත් ළඟ ඉන්න ආසයි

**"මං අද කොළඹ ආවා හදිස්සියකට. රෑ යන්න හිතාගෙන. එතකල් පොඩ්ඩක් ඔයාගෙ හොස්ටල් කාමරේ මට ඉන්න පුළුවන් වෙයිද දිනිති..?"**

ඇගෙන් ලැබෙන උත්තරය සුබදායක වේවා කියා හිතමින් අංජනා ප්‍රශ්නය කියා දැම්මාය.

**"අයියෝ අංජනා අක්කේ... ඒක අහන්නත් දෙයක්ද..? අද මං විතරයි ඉන්නෙ ඔයාගෙ වෙලාවට. රසාංජලායි නිර්මලයි දෙන්නම ගෙදර ගිහින්. එන්න අක්කේ. ළඟට ඇවිත් මට කෝල් එකක් දෙන්න..."**

අංජනාට සැනසුම් සුසුමක් හෙළුනි.

**"වැරැද්දක් කරන්නෙ නැති අයගෙ ප්‍රශ්නවලට කොහොමින්හරි හොඳ විසඳුම් ලැබෙනවා."**

ඇගේ කතාව අසා අවසානයේ තේනුක කීවේද සැහැල්ලු සිතකිනි.

**"ඔය කතාවම ඉස්සර අප්පච්චිත් කියනවා. හැබැයි ඔහොම නෙවේ, වෙනස් විදියකට..."**

**"ඒ කොහොමද නෝනා..?"**

**"වැරැද්දක් නොකරන මිනිස්සුන්ට දෙයියන්ගේ පිහිට තියෙනවා කියලා..."**

"ඔව්නේ. ඇත්ත තමයි... නෝනා, එහෙනම් අපි හෙමිහිට යමු නේද..? මං ඒ යාළුවටත් එක්ක ඔයාට කෑම අරන් දෙන්නම්. අම්මා කොච්චර වෙලාවකින් යයිද දන්නෙ නෑනේ... ඇත්ත කිව්වොත් නෝනා මේ මොහොතේ අපේ අම්මා ගැන මට විශ්වාසයක් නෑ නෝනා. මං දන්නවා එයා ඔය ගෙදරට වෙලා ඉන්නෙ මං එනකම් මොකක් හරි ප්‍රශ්නෙකට කියලා..."

**"ඔයා ඒ ගැන හිතන්න එපා. දරුවන්ගෙන් ප්‍රශ්න කරන්න අම්මලාට ඉඩ තියෙනවා..."**

**"ඔව් අනවශ්‍ය විදියට ජීවිතවලට අත නොදා. මට ඒක කියන්න හොඳටම අයිතියක් තියෙනවා. මම මගේ පාඩුවේ ජීවත්වෙන කෙනෙක්."**

අංජනා ඒ කතාවට උත්තරයක් නොදීම ගොස් ඔහු හා කාරයට නැගුණේ නොඑසේ නම් කතාව තවත් ඇදෙන නිසාය.

**"ඔයාට ප්‍රශ්නයක් එද්දී උදව්වට මමත් ළඟ ඉන්න ආසයි. ඒත් මේක එහෙම අවස්ථාවක් නොවෙන හින්දා මෙහෙම කරමු..."**

කාරයෙන් ඉඳගෙන ඔහු කාරය පාරටත් ගත්තාටත් පසු අංජනා කීවාය.

**"ඔව්... නෝනා කෙනෙක් ඉන්න ඕනි එහෙම තමයි."**

ලොකු කතාවකින් තොරව තේනුක වාහනය පැදෙව්වේය. ඔහුගේ නිහඬබවට අංජනාද ඉඩ දුන්නාය. කවදාවත් නැතිතරමට ඇගේ හිතත් බරවී තිබුණි. අම්මා කීවා සේ ඔහුගේ තොරතුරු දැන් නම් අසාගත යුතු බව ඇගේ සිත කීවේය.

දැන් ජීවිතය ඔහුට සින්නක්කරම දී තිබෙන නිසා ඔහුගේ පවුලෙන් මොන ප්‍රශ්නයක් ආවද ඔහුව අත් හැරෙන්නට දෙන්නට බැරි බව ඇගේ හිත මතක් කළාය. කිරිබත්ගොඩින් කාරය නැවතුවේ අංජනාට කෑම ගන්නටයි. තේනුක කෑම කඩයේ තිබූ කෙටි කෑම කීපයක්ද ගත්තේය. විශ්වවිද්‍යාල හොස්ටල්වල ළමයින් එළියෙන් කෑම එකක් එනතුරු බලා ඉන්නා හැටි තේනුක මෙන්ම අංජනාද දනියි. ඔහු ජින්ජර් බියර් බෝතල් දෙකකුත් එයට එක්කර බිල ගෙව්වේය. කාරයට නැගුණු ඔහු මුලින්ම කළේ කෙටි කෑම බෑගයෙන් ගත් එළවලු රොටියක් ඇයට දීමය.

**"බඩගින්නෙ හිටියෙ. මේ ප්‍රශ්න නිසා තේ එකක්වත් බොන්න නවත්තගන්න බැරිවුණානේ..."**

ඒ බඩගින්න නොකීවාට අංජනාටත් තිබුණේය. ඔහුට අංජනාව මගින් දමා යන්නට හිත නොදුන්නත් පැමිණ ඇති අවස්ථාවට වෙන විසඳුමක් නැති නිසාම ඇයව විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරය ළඟින් බැස්සුවේය. වෙනදා සේම ඇය නොපෙනී යන තුරු බලා සිටි තේනුක කාරය හරවා ගත්තේය. ඔහුට නිවස ළඟට එන්නට ඒ තරම් වෙලාවක් ගතවුණේ නැත. ගේට්ටුව ළඟ නැවතූ කාරයෙන් බැසගත් තේනුක එහි වූ පුංචි කවුලුවෙන් අත දමා ඉබ්බා ඇරියේය. ඔහු එන බව දන්නා නිසා දොර ඉබ්බා යතුරු ලා නොතිබිණි. ගේට්ටුව තල්ලු කළ සැනින් ඔහුගේ හිත ගැස්සුණේය. උඩු මහලට නගින පඩිපෙළ ආසන්නයේ මිදුලේ වූයේ ගවුමක් ඇඳි තරුණියකි. ඒ කොණ්ඩා විලාසිතාව, ඇගේ හැඩරුව ඔහුට එක්වරම මතක් කළේ චතුමිණීය. ඒ අනුමානයේ ඇත්ත නැත්ත තත්පරයෙන් ඔහු ඇසට පෙනුණි. ගේට්ටුව ඇරෙන සද්දයට එතෙක් පිටුපා සිටි තරුණිය ඔහු සිටින දෙස බැලුවාය. ඒ චතුමිණීමය. කිසිවක් හිතාගන්නට නොහැකිවූ තේනුක තෙන්නකෝන් ගේට්ටුව ළඟ එහෙමම ගල්වුණා සේ නැවතුණේය.

ලබන සතියට

# දැන්වීම් සඳහා අමතන්න

# 0112 672 601 0112 672 603




## ඔබ දෛවයට පිටුපායිද.. ?
## දෛවය ඔබට පිටුපායිද.. ?

- ජීවිතයේ අතීත සහ වර්ථමාන සිදුවීම් ඔබ විමතියට පත්වන අයුරින් පැවසුවහොත් ඔබට අනාගතයේ සිදුවන දෑ ගැන විශ්වාස නොකර සිටිය හැකිද ?
- වසර 45 කට වැඩි පර්යේෂණාත්මක අධ්‍යයනයන් සමග හස්ත රේඛා ශාස්ත්‍රයෙන් ඔබේ ජීවන ප්‍රශ්න විසඳා ගැනීමට හමුවන්න.

හස්ත රේඛා විශේෂඥ

**එස්. කෝරළේගේ**

520, වාසනා මාවත, කොට්ටාව, පන්නිපිටිය.

**සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි**

පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා හමුවිය හැක.

0112 783172 / 0773 775094

**රු. 35000/- කට වැඩි ආදායමක්**

විලාසිතා අත්පලදනා, කරාබු සැකසීම.

- නිවසේ සිටම කරගෙන යා හැකිය
- නිෂ්පාදන භාර ගැනේ
- මුදල් එවලේම
- අමුද්‍රව්‍ය නිවසටම සැපයේ

වැඩි විස්තර සඳහා ඔබගේ Whatsapp අංකය SMS කරන්න.

070-6128955

ලීසින් ඇති / නැති ඕනෑම වාහනයක් අත්පිට මුදලට මිලට ගනු ලැබේ. කාර්, වෑන්, ලොරි, බයික්

0773 797 481

**උගස් තැබූ රත්තරං**

ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.

කැරට් 22 සඳහා ඉහළ මිලක්

076 101 88 53

**හිසකෙස් යනවද ??? මොනවා කරත් කොන්ඩෙ වැවුනේ නැද්ද? එහෙනම් මෙන්න නියම විසඳුම**

## කේෂාධිපති කේශවර්ධන තෛලය

අති ප්‍රබල ඉපැරණි ශාකසාර වට්ටෝරුවකට අනුව නිපදවන මෙම පෝෂණීය තෛලය භාවිත කර දින 5න් හිස කෙස් ගැලවී යෑම සම්පූර්ණයෙන්ම නවත්වයි.

ගැහැනු - පිරිමි දෙපාර්ශවයටම භාවිතා කර හැක

- හිස කෙස් ශීඝ්‍රයෙන් වර්ධනය කරයි
- ඉස්සොරි අවම කරයි
- අකලට හිස කෙස් සුදුවීම වළක්වයි
- හිසරදය සුව කරයි
- තට්ටය පැදීම වලකයි



මෙම තෛලය දිනපතා භාවිතයෙන් ඔබට අවුරුද්දකට අඟල් 6-8 අතර ප්‍රමාණයකට දික් කර ගත හැකිය.

100% ස්වාභාවික ශාකසාරවලින් පමණක් නිපදවා ඇත.

මිල රු. 1650/- 180ML

ඔබේ නිවසටම ගෙන්වා ගත හැකිය.

TP : 0717 929 291 / 0741 385 555

D ඇන්ඩ් S ලංකා ප්‍රඩක්ට්

රාජාංගන හන්දිය, කලාඔය, අනුරාධපුරය

ලි.ප. NOC/EST/PERMT/08/BR/15H

ධරණී පුවත්පතේ

**මෙම ප්‍රමාණයේ දැන්වීමක්**

**රු.6000/- පමණයි**

සම්පූර්ණ වර්ණ (බදු ඇතුලත්ව)

උස - 5cm x පළල - 8cm

දැන්වීම් සඳහා චින්තක අමතන්න - 0712 171 271

**සෙනෙහස වැඩිහිටි නිවාසය - හොරණ**

අසරණ වැඩිහිටියන් සඳහා නොමිලේ

නේවාසික පහසුකම් ඇත.

දානමය කටයුතු සහ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ආධාර අවශ්‍යයි.

සෙනෙහස සමාජ සත්කාරක පදනම, කොමර්ෂල් බැංකුව- තලවතුගොඩ ශාඛාව ගිණුම් අංක - 8008371245

විමසන්න - 071 - 801 16 56

**විලාසිතා ආභරණ වර්ග සෑදීම පුහුණු කිරීම සඳහා පුහුණු කරුවන් / පුහුණු කාරිනියන් බඳවා ගැනීම**

මූලික දැනුමක් අවශ්‍ය නැත

දිවයිනේ සෑම ප්‍රදේශයකම ආවරණය වන පරිදි පුහුණු කර බඳවා ගැනේ

( පුහුණුව පැමිණ හෝ online ක්‍රමයට )

වැඩි විස්තර සඳහා whatsapp අංකය S.M.S කරන්න



LA POPPET

071 1449066 (whatsapp)

LA POPPET training and management center - Anuradhapura

## රැකියා ඇබෑර්තු

නිවසක නැවතී සේවය කිරීමට කාන්තාවක් උවමනායි

091 - 2 274 999 / 076 - 379 20 43
076 - 2 299 750

## ඔබේ දරුවා මෙවර සා/පෙළ, උ/පෙළ විභාගවලින් ඉහළින්ම සමත්කර ගන්නේ කෙසේද? අදම අමතන්න... අත්දුටුවයි, සත්‍යයි, නොවරදියි!

- සැමියාගේ/ බිරිඳගේ අයුතු සම්බන්ධතා නවතා ගත නොහැකිද?
- පෙම් සබඳතා බිඳ වැටී ඇත්ද?
- විවාහය ඉක්මන් කරගන්න
- ඔබගේ සැමියා දරුවා මත්ද්‍රව්‍ය වලින් බේරාගන්නේ කෙසේද?
- ව්‍යාපාරය කඩා වැටුණාද?

උපන් දිනය සහ වේලාව සමඟ අමතන්න

**071 031 4878**

දශක 4ක් පුරාම අසරණ ජනතාව මුදාගත් ජාත්‍යන්තර කීර්තියට පත් ගුප්ත විද්‍යා විශේෂඥ සද්ධර්ම කීර්ති ශ්‍රී ජෝර්ති විද්‍යාශූර විහාරාධිපති අති පූජ්‍ය වේරපිටියේ ඥාණිස්සර වෙද හාමුදුරුවෝ පුරාණ විහාරය වේරතැන්න, වේරපිටිය.



මාගේ සැමියාව මත්ද්‍රව්‍ය උවදුරෙන් බේරා දුන් නිසා රත්නපුරයේ කුමාරි විසින් මෙම දැන්වීම පළ කරන ලදී

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.**

# මේ කාලෙ ඇල්ටොත් නෑ කියන අයට බුල්ටෝ හදන්න කියලා දෙමුද?





**සීතා පොන්නම්පෙරුම**
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

ඔන්න ආයුබොවන්ඩ මේක කෝපි කාලේ රස කතාවක්. කෝපි කාලේ කිව්වට 1960 ගණන්වල එකක්.

ඒ කාලේ බොරලැස්ගමුව පළාතේ පුංචි පහේ පොල්කේක් කඩයක් තිබුණාලු. කඩේ මුදලාලිගේ නම ඩී.එම්.සේසින්. දවසක් සේසින් මුදලාලි පොල්කේක් හැඳිගගා ඉන්දැද්දි මුන්දෑ අතින් පදම වැරදිලා. හයියෝ දැන් මොකදෑ කරන්නේ... මුදලාලි හදලා තියෙන්නේ පොල්කේක් ටික විසි කරන්න. විසි කරන්න කලින් සේසින් මුදලාලි වැරදිච්ච මිශ්‍රණෙන් ටිකක් කටගෑවලු. පදම වැරදුණාට මොකෝ කෑවයින් කෑවේ නෑ මේ වගේ දෙයක් කියලා හිතපු මුදලාලි මේකට තව අඩුම කුඩුම දලා අලුත්ම රසකැවිල්ලක් හදලා.

**'දෙයි දෙයි දෙයි දෙයිය බබෝ දෙයි**
**හැන්දෑවට තාත්තා අද බුල්ටෝ ගෙනත් දෙයි**
**බයි බයි බයි බයිය බබෝ බයි**
**ගුණසිරි බුල්ටෝ තාත්තා බබාට ගෙන දෙයි'**

ඕක 1970 ගණන්වල ගුවන්විදුලියේ ඇහුණු වෙළඳ දැන්වීමක්. මේක ගායනා කළේ ඒ කාලේ බොහොම ප්‍රසිද්ධ ගායකයෙක් වෙච්චි ක්‍රිස්ටොපර් පෝල් මහත්තයා.

70/80 කාලේ රට හොල්ලපු රසක් තමයි ගුණසිරි බුල්ටෝ. පුළුවන්නම් ඒ කාලේ අයගෙන් අහලම බලන්නකෝ. ඒක නෙමෙයි කතාව. ගුණසිරි බුල්ටෝ කියන්නේ අර අපි කලින් කියාපු සේසින් මහතැන්ගේ වැරදුණු රෙසපිය. කොහොමද වැරදිච්ච තැනකින් මනුස්සයෙක් ගියාපු දුරක්. පස්සේ සේසින් මුදලාලි බුල්ටෝ වෙනුවෙන් පේටන්ට් බලපත්‍රයක් පවා ගත්තලු.

**'හරි පිරිසුදු රට පරසිඳු ගුණසිරි බුල්ටෝ**
**දිවට රසයි රසය අගෙයි**
**ඇඟට ගුණයි මිලද වටී**
**රස ගුණපිරි ගුණසිරි බුල්ටෝ'**

ඕකත් ඒ කාලේ නිතරෝම ප්‍රචාරය වුණු ගුණසිරි බුල්ටෝ ඇඩ්වර්ටිස්මන්ට් එකක්. හැබැයි පස්සේ සේසින් මුදලාලි විතරක් නෙමේ තවත් බුල්ටෝ නිෂ්පාදකයෝ බිහිවෙලා.

ඉස්සර අපේ ආත්තම්මලා අම්මලා එහෙම බුල්ටෝ ගැන හරියටවත් කියනවා. ඒ කාලේ දැන් වගේ අරුමෝසම් තාලේ ලොසින්ජර තිබිලා නෑනේ. තිබුණු එකම ලොසින්ජරේ බුල්ටෝලු. බුල්ටෝ කියන්නේ ටිකක් හයිය ටොපියක්. ඒ කාලේ ඔය බුල්ටෝ ටොපියක් සත පහලු. ඉස්කෝලේ ඇරිලා එද්දි ගමේම කෙල්ලෝ කොල්ලෝ සත පහේ බුල්ටෙක් අරන් හක්කෙන් හක්කට මාරු කර කරා පැය ගාණක් ඒක කනවලු. ප්‍රශ්නයක් ඇහැව්වම උත්තර නොදී ඉන්දැද්දි කටේ පිට්ටුද කියලා දැන් අහනවා වගේ "කතා කරන්න බැරි කටේ බුල්ටෝද යකෝ" කියලලු ඔය කාලේ අය ඇහැව්වේ.

කොහොමින් කොහොම හරි ජේ.ආර්.මහත්තයා පිටරටින් ස්වීට් කෑම ගෙන්නන්න ගත්තයින් පස්සේ කට්ටිය බුල්ටෝ හදන එක අඩු කළාලු. හැබැයි එහෙමයි කියලා අදටත් බුල්ටෝවලට තියෙන ඉල්ලුම අඩුවෙලා නැහැ.


දැන් බුල්ටෝ නෑනේ කිය කිය නාහෙන් අඬන මිනිස්සු මට පෞද්ගලිකව මුණගැහිලා තියෙනවා.

මේ දවස්වල ඇල්ටොත් නෑ කිය කියා සමහරු දෙස් දෙවොල් තියනවා. නාහෙන් අඬ අඬා අත් ගුලි කරන් හිටියොත් ඇල්ටෝ තියා ඇල්වතුරවත් ලැබෙන්නේ නෑ ඕන්. ඇල්ටොත් නැත්තම් බුල්ටෝ හදලා බලන්න කියලා අපි යෝජනා කරන්නේ ඒකයි.

ලොකු නිෂ්පාදකයෝ ප්‍රමාණයක් එහෙමත් නැති නිසා මේක කරලා ගොඩ යන්න පුළුවන් කියන එක නම් සහතිකයි.

හරි බුල්ටො හදන වැඩේ මේ විදියට පටන්ගමු.

ඒකට උකු පොල්කිරි 750ml, සීනි 525g, හදගත්තු කෝපි තේ හැඳි තුනක් (වර්ණ ගැන්වීම සඳහා), ඉඟුරු යුෂ මේස හැඳි 1, රස පදමට ලුණු, පාන්පිටි 100g සපයා ගන්න. බුල්ටෝ ඔතන්න තෙල් කඩදහි ගන්න. තෙල් කඩදහි හොයාගන්න බැරි වුණෝතින් පාච්මන්ට් කොළ ගන්න.



## පියවර 1

භාජනයකට සීනි 500gක් දලා කූරු නොගා කැරමල් කරන්න. හැබැයි හුඟක් කළු කරන්න එපා. එතකොට තිත්තයි. සීනි ටික කැරමල් වුණායින් පස්සේ උකු පොල්කිරි එකතු කරලා හැඳි ගාන්න. මේකට කෝපියි, ඉඟුරු ඉස්මයි එකතු කරලා ආයෙත් හැඳි ගාන්න.



## පියවර 2


තවත් භාජනයක අර ඉතිරි සීනි 25g උණු කරන්න. ඒකට පිටි 50gක් දලා මිශ්‍ර කරන්න. මේ මිශ්‍රණය අපේ බුල්ටෝ මිශ්‍රණේට දලා ගින්දර අඩු කරගෙන කැටි නොගැහෙන්න හැඳි ගාන්න.



## පියවර 3

තැටියක් අරගෙන ඒකට තෙල් ටිකක් දලා බුල්ටෝ මිශ්‍රණේ දගන්න. ඒකට උඩින් ඉතිරි පාන්පිටි 50g ඉහින්න. මේ මිශ්‍රණය ඉලාස්ටික් එකක් වගේ ඇද ඇදා අවශ්‍ය දිගට මහතට ටොෆිය කතුරකින් කපාගන්න.

උඩ තැවරුණු පිටි ටික අතින් ඉවත් කර කර ටොෆිය අතින් හැඩ කරලා ඉක්මනින්ම තෙල් කඩදාසිවල ඔතන්න. මෙහෙම හදගත්තු බුල්ටෝ ටොෆී ටික බෝතල්වල අහුරලා වෙළඳපොළට දන්න. ප්‍රමාණය අනුව ටොෆියක් රුපියල් 5 ඉඳලා මිල කරන්න පුළුවන්. 0714766819 අංකයෙන් වැඩිදුර විස්තර දැනගන්න පුළුවන්.





■ සෙව්වන්දි හෙට්ටිආරච්චි




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.